# පවන් ගිනිඇවිළ



ගාමිණී සමරකෝන්

www.sinhalelibrary.com

# ජපන් ගිනි සිළුව



පරිවර්තනය

**ගාමිණී සමරකෝන්**

www.sinhalaelibrary.com

- ❊ අබිරහස් සබ්මැරීනය
- ❊ අවසන් මෙහෙයුම
- ❊ ඉලක්කය
- ❊ අහස කඩා වැටේ
- ❊ සුරලොවකැලඹේ
- ❊ පළිගනිමි
- ❊ අපායේ යතුර
- ❊ නොනිමි රාත්‍රිය
- ❊ ගැලවුම්කරු
- ❊ සාගර මෙහෙයුම
- ❊ පාවාදීම
- ❊ පළිගැනීමේ දූතයා
- ❊ ගොපලු රජා
- ❊ අදිසි ප්‍රහාරකයා
- ❊ ෂර්ලොක් හෝම්ස් වික්‍රමයන්
- ❊ රොබින් හුඩ්
- ❊ පැහැර ගැනීම
- ❊ කළු හී සර
- ❊ ගලිවර්ගේ සුරුවිරු චාරිකා
- ❊ පිනෝකියෝ
- ❊ හොල්මන් කතා
- ❊ තුරගාවේගය
- ❊ සැඟවුණු නිම්නයේ නිධානය
- ❊ රාස්සගල කන්ද
- ❊ රුදුරු අඳුර
- ❊ වියරු ඝාතකයා
- ❊ රුපුසෙන් මැද
- ❊ හුදෙකලා සටන
- ❊ කුමන්ත්‍රණය
- ❊ නිවුන් දඟකාරියෝ 1, 2, 3, 4, 5, 6
- ❊ මැලෝරි ටවර්ස් පාසල 1, 2, 3, 4, 5, 6
- ❊ අයිවන්හෝ
- ❊ මළවුන් නිහඬයි
- ❊ දඬුවම මරණයයි
- ❊ මරුවා සමඟ නිවාඩුවක්


## *Tokyo Daily News - February 26. 2004*

ඊයේ මධ්‍යම රාත්‍රී 12.03ට මිනුහෝ නගරයේ කසාකි පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානය කොල්ලකා ඇති බවට එහි සේවක මණ්ඩලය පොලීසියට වාර්තා කර ඇත. එහි අධ්‍යක්ෂකවරයා කරුණු දැක්වීම ප්‍රතික්ෂේප කළද නම හෙළි නොකළ ආරංචි මාර්ගයක් පැවසුවේ රාත්‍රී එකොළහට පමණ ඖෂධ ගබඩාව බිඳ ඇති බවට හෙදියකගෙන් අනාවරණය කරගත් බවයි. "මෙය සැලසුම් සහගතව කළ දෙයක්" ආරංචි මාර්ගය පවසයි. "ගෙන ගොස් තිබෙන්නේ මෝෆීන් හා වැලියම් වැනි වෙළඳපොළේ ඉතා මිල අධික ඖෂධ." මෙම සොරකම හා දැනට වෛද්‍ය මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබන සුප්‍රසිද්ධ රෝගියා, කොනිෂි කෝගෝ අතර සම්බන්ධයක් ඇතිදැයි යන ප්‍රශ්නයට පිළිතුරු දීම පොලීසිය ප්‍රතික්ෂේප කරයි. මීට මාස දෙකකට ඉහතදී, ලොස් ඇන්ජලීස් හිදී නාඳුනන අපරාධකරුවෙකුගේ ප්‍රහාරයකට ලක්වූ කොනිෂි කෝගෝ මහතා ජපානයට රැගෙන විත් තිබේ. වෛද්‍ය මධ්‍යස්ථානයේ හෙද පාලිකාව, මකිචි ඕනෝ පවසන්නේ කෝගෝ මහතාගේ තත්ත්වය ස්ථාවර වුවද තවමත් සිහිසුන්ව සිටින බවයි. කෝගෝ මහතාගේ හදාගත් දියණිය, හෙවන් කෝගෝ. මීට සිව්මසකට ඉහතදී ඇගේ විවාහ උත්සවයට කඩාවැදුණ කඩාකප්පල්කාරයෙකු (සමහර ආරංචි මාර්ගවලට අනුව නින්ජා සටන්කරුවෙකු) උත්සවය ව්‍යාකූල කර ඇගේ සොහොයුරා, ඔහිකෝ කෝගෝ මරාදැමූ දිනයේ සිට අතුරුදහන්ව ඇත.

www.sinhalaelibrary.com

දැනට කැලිෆෝනියා ප්‍රාන්ත පොලීසියේ අතුරුදහන් වූවන්ගේ ලැයිස්තුවේ සිටින ජපන් ජාතික හෙවන් කෝගෝ පිළිබඳ තොරතුරු සතු බවට පොලීසිය විශ්වාස කරන පුද්ගලයෙකු ගැන පොලීසිය සෙවිල්ලෙන් පසුවේ. අදාළ පුද්ගලයා හෙවන් කෝගෝගේ විස්තරවලට සමාන තරුණියක සමග හාඩ් රොක් හා මැන්ඩලේබේ වැනි හෝටලවල සිටිනු දැක ඇත. මෙම පුද්ගලයා කැසිනෝ හා සමාජ ශාලාවල ඉතා වැදගත් පුද්ගලයින්ගේ කාමරවල සිටින හා පරිවාර නිලධාරියෙකු සමග සංචාරය කරන ඉහළ සමාජ ස්තරයක අයෙකු බව ආරංචි මාර්ග සඳහන් කරයි. මේ පුද්ගලයා ගැන තොරතුරු දන්නා අයෙක් ඇති නම් පහත අංකයට අමතන්න.

# 1.



“කට වහපන්. උඹේ කොල්ලටත් කට වහන්න කියපන්” පැබ්ලෝ කඩා පැන්නේය.

මුව තද කර වසා ගත් මම කළු සෙඩාන් රථයේ පසු පස අසුනේ මා අසල සිටි හීරෝ දෙස බැලුවෙමි. අවලස්සන තැළුමක් හීරෝගේ වම් කම්මුල හරහා පැතිරුණ අතර ලේ බිඳු ඔහුගේ තළලින් වැස්සුණි. ඔහුගේ යටිතොල ඉදිමී තිබූ අතර ඔහුගේ කලිසමේ කුණු හා ලේ පැල්ලම් තැවරී තිබුණි. මගේ සිරුර පහුරු ගාන වේදනාව සමග මගේ පෙනුමද ඊට නොදෙවෙනි විය. මා දුටු පරිදි පැබ්ලෝ රේගු නිලධාරියාගේ සාක්කුවට එබූ මුදල් නෝට්ටු අනුරෙහි පිහිටින් අපි මැක්සිකන් දේශසීමාවෙන් කැලිෆෝනියාවට ඇතුළු වී තිබුණා පමණි. අපි යන්නේ කොහිදැයි මම නොදැන සිටියෙමි.

නීරෝ සෙමින් හිස වැනුවේය.

"මිනිහා කියන දෙයක් කරන්න" ඔහු සෙමින් හඬ නැඟූ අතර මගේ දෙනෙතෙන් නැගී එන කඳුළු නවතා ගැනීමට වෙහෙසෙමින් මම හිස සැලුවෙමි. නීරෝව මරණය කරා කැඳවාගෙන යන්නේ මාය කියන සිතුවිල්ල දැරිය නොහැකි විය. ඔහු මගේ සටන, මගේ යුද්ධය එමෙන්ම මෙම මැරයින් කවුරුන් වුවද උන්ට අවශ්‍ය ඔහුව නොව මාවයි. මෙම දිගු ගමන පටන් ගත් තැන සිට, බේරී යාමට මගක් මට නොපෙනුණි. පැයට සැතපුම් සියයක පමණ වේගයෙන් අප කැලිෆෝනියා කාන්තාරය හරහා ඇදෙමින් සිටියෙමු. මගේ දෑත් පිටුපසට කර බැඳ දමා තිබුණු අතර එම ලණුවෙන්ම වළලුකර දෙකද එකට බැඳ දමා තිබුණි. මස් ඔඩුවකට දක්කනු ලබන ගවදෙනක මෙන් අසරණ හා අනාථ බවක් මට දැනුණි.

සෘජුව ඉඳගැනීමට නොහැකිව, මම ඇලවී නීරෝට හේත්තු වී සිටියෙමි. මිනිත්තු කිපයකට පසු ඔහු ඇඹරෙනු මට දැනුණි. "නීරෝ, ඔයාට රිදෙනවාද?" මම කෙඳිරුවෙමි.

හිස වැනුවද ඔහු දිගටම නළියන්නට විය. ඉදිරි අසුනේ සිට විශාල සුරුට්ටුවක් උරමින් වාහනය පදවන පැබ්ලෝ දෙස මම චකිතයෙන් බැලුවෙමි. ලාස් වේගාස්හිදී රෙබී ඔහුව මට හඳුන්වා දෙන විට ඔහු කොතරම් භයානක මිනිසෙකු දැයි මට ඉව නොවැටීම අදහනු බැරි තරම්ය.

මම හැරී නීරෝ වෙත බැල්මක් හෙළුවෙමි. තම අත බැඳි ලණුව සමඟ මට්ටුවීමේදී නොසෙල්වී සිටීමට ගන්නා උත්සාහය නිසා ඔහුගේ ගෙලෙහි නහර ඉලිප්පී තිබුණි. පැබ්ලෝ හා ඔහුගේ සහචරයා ආපසු හැරී බලනු ඇතැයි බියෙන් මමද ඔහු සමඟ හුස්ම ගැනීම පවා නවතා ගතිමි. නීරෝ දෙතොල් තද කර සිනාවක් පෑවේය. මම පහත බැලීමි. ඔහුගේ බැමි බුරුල් වී තිබුණි.

මගේ හදවත ගැස්සුණි. මෙය අවසානය විය නොහැක. නොපෙනෙන පරිදි බැමි බුරුල් කිරීමට හැකි වන ඉරියව්වකට එන මෙන් නීරෝ මට ඉඟි කළේය. කටුක ගන්ධයෙන් [illegible]



සුරුට්ටු උරමින් වින්දනයක් ලබන පැබ්ලෝ හා ඔහුගේ සහචරයා ගැන ඇස ගසා ගෙන මම අසුනේ කැරකුණෙමි. දුම් ගුලි පිටකරන අතරේ ඔවුහු ස්පාඤ්ඤ බසින් දෙඩවූහ. නාඳුනන මැරයාගේ දෙතොල් හරහා ගොස් හකු ඇටය දිගට ඇදුණු කැපුම් කැළල ඔහුගේ ඝන උඩුරැවුලින් වුවද වසා ගැනීමට නොහැකිව තිබූ අතර කතා කරන අතරේ ඔහු අත වූ රිවෝල්වරයෙන් යම් යම් දේ අවධාරණය කළේය.

විනාඩි කිපයකදී මම නිදහස් වූයෙමි. අත්පා දිග හැර ගැනීමට තිබූ දැඩි වුවමනාව මම මැඩ පවත්වා ගතිමි. නීරෝව වැළඳගෙන සියලු දේ ගැන කතාගාවූ බව කීමට මට මහත් වුවමනාවක් විය. මගේ සිතුවිලිවලට පිළිතුරක් මෙන්, හදිසියේම රථය ගැස්සීමෙන් ඔහු මා ඉදිරියට විසි වුණි.

"ඔයාගේ මේතෙවර ඉහළම බුද්ධියකට ළඟාවීම" ඔහු මගේ කනට කෙඳිරුවේය. "වට පිටේ තියෙන හැම දෙයක් ගැනම ඔයා දැනගන්න ඕනෑ. ඒ තත්ත්වය ලබාගන්න තියෙන එකම ක්‍රමය ඒකයි."

"පිට පස්සේ මොකක්ද වෙන්නේ? කට වහගන්න කියලා මම කිව්වේ නැද්ද?" ආපසු හැරුණ රවුලා අපි වෙතට අවිය එල්ල කළේය. මම අසුනේ පසු පසට ඇකිළීයත්ම මගේ හදවත තදින් ගැහෙන්නට විය. සැබෑ ජීවිතයේදී තුවක්කුවක් මුහුණට එල්ල වීම මහත් ත්‍රාසයකි. මොනයම් නිර්භීත කමක් තිබුණද එය වැස්සී යයි. අප බැමිවලින් නිදහස්ව ඇති බව ඔහු දකිනු ඇතැයි මම ත්‍රස්ත වීමි.

"මම බැලුවේ මෙයාට අමාරුද කියලා." නීරෝ ශාන්තව කීවේය.

"උඹේ සෙල්ලමට උදව් කරන්න උඹට ලැබෙන්නේ නැහැ." රවුලා ඇඹරුණ දෙතොලින් විරිත්තමින් කීවේය. "උඹට කියපු දේ කරපන්."

ඔහු ආපසු හැරුණ විට, මට නිශ්ශබ්ද වන ලෙස නීරෝ බැල්මකින් කීවේය. මම ජනේලයෙන් පිටත ගිනි ගනන අව්ව



www.sinhalaelibrary.com

දෙස බැලීමි.

මට කරන්නට බොහෝ දේ තිබුණි. වේදනාවන් නිතරම සටනකින් පසුව සිරුරේ ඇති වන දැඩි බවත් මුලින්ම අත්හැර කළ යුතුව තිබුණි. ඉන්පසු මගේ හිස තුළ ඇති චිත්ත රූප මකා දැමිය යුතුය. අහිංසක මිනිසුන් කණ්ඩායමක් අපේ හෝටල කාමරයට කඩා වැදීම, ඇට බිඳෙන ලෙස දෙන අත්පහර හා පා පහරවල හඬ, ටෙඩී බිම ඇද වැටෙන දර්ශනය, ඔහුගේ කොන්ද ලෙයින් තෙත් වී..........

මෙම සිතුවම් මිරිකා ඉවත දැමීමට මම දෑස් තද කර වසා ගනිමි. කැඩී බිඳී ලේ පෙරාගෙන ටෙඩී ඇද වැටෙනු මා දුටු පසුව යටත් වනතුරු අපට පහර දුන් පැබ්ලෝ හා පිරිස අපව හෝටල කාමරයෙන් පිටතට ඇදගෙන ආහ. ජනේලය පසු කොට බිත්තියේ ලේ පැල්ලම් මම දුටුවෙමි. ටෙඩී ජනේලයෙන් පැන්නේද නැතහොත් ඔසවා විසි කරනු ලැබුවේද යන්න මම නොදනිමි. කෙසේ වුවද ඔහු මියගොස් තිබුණි. ගොඩනැගිල්ලෙන් පිටතට එද්දී ඔහුගේ සිරුර ගැන සෝදිසියෙන් පැමිණියද එය අතුරුදහන්ව තිබූ අතර සමහර විට පැබ්ලෝගේ සහචරයෙක් එය ඇදගෙන ගොස් තිබුණා විය හැක.

මෙයට වගකිව යුත්තේ මා බවට ප්‍රශ්නයක් මගේ සිතේ නොතිබුණි! වේගාස්හි සිටින ටෙඩී ඉවතට මා සොයා එන විට, මගේ කතාව දන්නා, මට පක්ෂපාතී කෙනෙකු හමුවීම ගැන මම මහත් සතුටට පත්ව සිටියෙමි. එහෙයින් දෙදෙනා එකට සිටිනු දැකීමේ අනතුර මට නොපෙනුණි. මා මෑතකදී දැනගත් පරිදි මගේ පවුල ජපන් මාෆියා සංවිධානයකට සම්බන්ධ අතර ටෙඩීගේ යකමුරාස් පවුලද මාෆියා සාමාජිකයන් වන බවත්, ඔවුන් මා පසු පස පන්නන බවත් මා විශ්වාස කළද, ටෙඩී කොලොම්බියානු මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා සම්බන්ධ බව මා දැන සිටියද........ මගේ වටපිටාව යහපත් නොවිය.

මම ඒ ගැන සිතීමට වෙහෙසී තිබුණෙමි. හීරෝ මාව අත්හැර ගොස් තිබුණ බව සිතූ මා ඔහු හා වේගාස්වලින් පැනයාමට එකඟව තිබුණෙමි. මට ටෙඩීගෙන් ප්‍රයෝජන තිබුණි



ඔහු අහිංසක පුද්ගලයෙකු නොවුණද හිත හොඳ මිනිසෙක් විය. දැන් ඔහු මිය ගොසිනි. මා ඉතා අනුවණ බව දැනුණි. සැලසුම් පරිදි අප තිදෙනාම යුරෝපයට පැන ගිය පසු මා ඔහුට කියන්නට සැරසී සිටියේ කුමක්ද? "ඔයා මගේ ජීවිතය බේරුවා ස්තූතියි. ඒත් මම කැමති හීරෝ එක්ක ඉන්න"

මගේ හිසේ පැටලුණ සිතුවිලි ලිහා ගැනීමට මම වෙහෙස ගත් නමුත් එකක් ඉවතට යනවිට ඒ හිදැස පිරවීමට තවත් එකක් එතැනට එන බව පෙනුණි. මගේ මොළය ගැඹුරට කිඳා බසින්නට විය. මතුපිටට ඉපිලී එන පළමු දසුන වූයේ ජපානයේ රෝහල් ඇඳක සිහිසුන්ව වැතිර සිටින මගේ පියා හා මගේ මියගිය සහෝදරයා ඔහිෂෝ, මගේ පවුල මරා දැමීමට අවසර කාටද යන්න සොයාගැනීමට මම තවමත් අපොහොසත්ව සිටිමි. රෝහල් ඇඳක වැතිර සිටින පියාත් ඔහුගේ ඇඳ අසල රැඳී සිටින මගේ කුඩම්මා මිකෝත් මගේ සිතේ මැවෙයි. ඉන්පසු සිදුවූ සෑම දෙයටම ඇගේ ඇති සම්බන්ධය ගැන සිතෙන විට, ලොස් ඇන්ජලීස්හි පදික වේදිකාවකදී, මාර්කස් හා ඔහුගේ සහචර පිරිස හමුවීම කෙරෙහි මගේ සිත දිවෙයි. "අම්මා මතක් කරන්න කිව්වා" ඔහු කියා තිබුණි.

මම දෑස් මිරිකා තදින් වසා එම මතකයෙන් මිදී සිතට පාව යන්නට ඉඩ හළෙමි. ෂෙරිල්, ලොස් ඇන්ජලීස්හි මගේ එකම මිතුරිය, සිත මතුපිටට ඉපිල ආවාය. ඇය පිළිබඳව මා දන්නේ මට ඇටවූ ගින්නකට කොටුවී ඇයද මියගොස් ඇති බව පමණි. මගේ උදව්වට පැමිණ තිබූ සියලුම දෙනාට මා හානිකර ඇති බව අවබෝධ වුණි. ඒ ගැන සිතීමට පවා බැරි තරමට වේදනාත්මකය.... චිත්ත රූප සියල්ල මකා දමා එතැනට හීරෝට එන්නට මම ඉඩ හළෙමි. මා ඔහු ගැන සිතන අයුරින්ම ඔහුද මා ගැන සිතූ මොහොත ගැන මම මතක් කළෙමි. මා නිසා කැරන්ගේ සිත බිඳීමට ඔහුට සිදුවිය.

වරදකාරී හැඟීම, බිය, ලැජ්ජාව, ආදරය, වේදනාව බොහෝ චිත්ත වේගයන් සම්මිශ්‍රණය වෙයි. සෑම උපක්‍රමයක්ම යොදා, පළමුව ඔහුගේ සිතුවිලි ගොනු කර පොදි බැඳ ජනේලයෙන්



www.sinhalaelibrary.com

පිටත කාන්තාරයට විසිකරදමා සිත පිරිසිදු ගල්ලෑල්ලක් මෙන් හිස් කරගත යුතුය. ඉන්පසු මගේ හිසේ එක් පැහැදිලි කොනක් සොයා ගැනීමට මට හැකි විය. මගේ වටපිටාව ගැනත් මාව සිරකාරියක ලෙස රඳවා ගෙන සිටින අය ගැනත්, ආරක්ෂාව සඳහා මෝටර් රථයෙන් ආයුධයකට සමාන දෙයක් සොයා ගැනීමටත් සිතන ලෙස මගේ සිත බල කළේය.

පාදයේ වළලුකරට වැදුණු සියුම් තට්ටුවක් මාව පියවි ලොවට රැගෙන ආවේය. හීරෝ මා දෙස බලා පසු පස ජනේලය දෙසට පෙමින් හිස දිගු කළේය. රිදී පැහැ වෑන් රථයක් අප පසු පසින් විය. අතුරු පාරකට හැරෙද්දී රිදී පැහැ වෑන්රථය අප පසු පසින් එනු මම දුටුවෙමි. මාවත නැවත මාරු කරන විට එය සැහැල්ලුවෙන් අප පසු පස ආවේය.

අපව ලුහු බඳිමින් සිටින අතර මම හීරෝ දෙස බලා දෙබැම උස් කළෙමි. මගේ පුදුමයේ තරම, අවට ගැන මට කිසිවක් පෙනී නොතිබුණි.

“අපේ පස්සෙන් පන්නනවා.” හීරෝ පැහැදිලිව හඬ නගා කීවේය.

රවුලා හැරෙන්ම, වෑන් රථය වාහන පේළිය පසු පස රිංගා සැඟවුණි. “කපටි වැඩ එපා” රවුලා ගෙරෙව්වේය.

“එහෙම බලාගන්නවා” හීරෝ සෘජුව කීවේය.

රවුලා අසුනේ කැරකුණු අතර දිලිසෙන පිහිතලය හීරෝගේ ගෙල වෙතට සමීප වීමට පෙර එය එළියට ඇදෙන හඬ මට ඇසුණි. මම හුස්ම ඉහළට ඇද ගතිමි. හීරෝ නොසෙල්වී සිහත් වූ දෙනෙතින් නිහඬව රවුලා දෙස බැලුවේය. වෙව්ලූ මම රවුලා දුර දිග ගිය හොත් මැදිහත් වීමට සූදානම් වුණෙමි.

ඔහු ඇත්තක් කරන්නේද නැතිනම් අපව බියවැද්දීමට සැරසෙන්නේද?

පැබ්ලෝ ස්පාඤ්ඤ බසින් කෑ ගැසුවේය. සිත රිදී වුවද රවුලා පිහිතලය ආපසු ඇදගෙන හැරුණේය.



“මගේ හරි” ඔහු බර ලෙස ඉංග්‍රීසි උච්චාරණය කළේය. “මූන්ට මරන්න තරම් වටින්නේ නැහැ. ඒක පස්සේ” මට ඔහුගේ මුහුණ නොපෙනුණද ඔහු සිනාමුසු බව මට යම්තම් හැඟුණි.

හුස්ම ගත් මම අප පසු පසින් ඉතා පැහැදිලිව එන වෑන් රථයට සිත යොමු කළෙමි. ඉදිරි අසුනේ සිටින මිනිසුන්, පළමුව වෙඩි ද ඇදගෙන අපගේ හෝටල් කාමරයට කඩා පනිද්දී මා සිතා තිබූ පරිදි, යකමුරාස් පවුල විසින් එවන ලද්දේ නම් අප පසු පසින් හඹා එන්නේ කවුරුන්ද? රවුලා පසු පස බලන කණ්ණාඩියට නෙත් හෙළනු මම දුටුවෙමි. අනතුරුව ඔහු හා පැබ්ලෝ නැවත වාද කරන්නට වූහ. හදිසියේම හැරුණු රවුලා මගේ කොණ්ඩයෙන් අල්ලා හිස පසු පසට ඇද්දේය. “කවුද ඒ?” ඔහු මොර දෙද්දී මගේ මුහුණට එල්ලවූ දුගඳ හුස්ම නිසා අසුනේ පසු පසට ඇකිළී ගියෙමි. දත් හා වළලුකර සගවා ගැනීමට වඩා එම දුගඳින් බේරීම වඩා වැදගත් විය. හීරෝගේ මුහුණේ මස් පිඩු තද වනු මම දුටුවෙමි. හුස්මක් ගත් මම වේදනාවත්, රවුලාගේ අවියට පා පහරක් දීමට ඇතිවූ දැඩි වුවමනාවත් සිර කර ගතිමි.

“මම දන්නේ නැහැ.” මේ සිදුවන්නේ කුමක්දැයි මම සැබැවින්ම දැන නොසිටියද එය යහපත් දෙයක් නොවන බව දැන සිටියෙමි.

මෝටර් රථය හදිස්සියේ ගැස්සුණු අතර මගේ කෙස් වැටියෙන් රවුලාගේ අත ගිලිහුණි. ඔහුගේ ග්‍රහණයෙන් මිදීමට මම අවස්ථාව ලදිමි. රවුලා ශාප කරමින් අසුනට ඇද වැටුණේය.

“ඒ අය මේ මිනිස්සුන්ට වඩා නරකද?” මම ජපන් බසින් ඇසීමි. රවුලා කෑගැසුවේය. “කට වහගන්න කියලා උඹලාට කී සැරයක් කියන්න ඕනද?” පැබ්ලෝ වේගය වැඩි කරද්දී එන්ජිම කෙඳිරි ගාන්නට විය. හීරෝත් මමත් අසුනේ පසු පසට විසි වීමු. රිදී පැහැ වෑන්රිය තව දුරටත් මුවා වීමේ උත්සාහය අතහැර තිබූ අතර සෙඩාන් රථයට අඟල් කීපයක් ආසන්නව එමින් අවසානයේ එහි බම්පරය අපේ රථයේ පසු පස වද්දන්නට විය.

සෙඩාන් රථය ගැස්සෙද්දී මම සැලී වුණෙමි.

"ඒ ගැන හිතන්න එපා" හීරෝ කීවේය. "පෙනෙන දේවල්වලට හිත යොමු කරන්න. සූදානමින් ඉන්න" කී ඔහු මගේ අත මිරිකුවේය. අපේ රථය වෑන් රථය මඟ හැරීමට උත්සාහ කරමින් මාවතින් මාවතට හැරෙද්දී මිනිත්තු කීපයකදී, අපි සැන් ඩියාගෝ නගරාසන්න ප්‍රදේශයට හැරුණෙමු. අප වෙනත් මාවතකට හැරෙද්දීම අපව මඟ හැරීමට රතු ෆොක්ස්වැගන් රථයක් තදින් නළාව හඬවමින් තිරිංග හඬ නගද්දී මගේ හදවත ගැලවී වැටුණ බවක් දැනුණි. නොගැටී අප රිංගා ගියද ෆොක්ස්වැගන් රථය අවාසනාවන්ත විය. ඇඟ හිරිවට්ටන තිරිංග හඬකින් වාතය කම්පනය වෙද්දී ලෝහ ගැටී පොඩි වන හඬක් නැඟුණ අතර මා ආපසු හැරී බලද්දී මාවතින් ලිස්සා ගොස් තිබූ ෆොක්ස්වැගන් රථය එක් ඇලයකට පෙරළී තිබුණි. අනතුර පිටුපස අනෙකුත් මෝටර් රථ වේගය බාල කළද වෑන් රථය රිදී ඊතලයක් මෙන් වේගයෙන් ඇදී ආවේය. මගේ දත් බැඳී ඇති තලක ලෙස සිටිය යුතු බව අමතකව මම දෙනෙත් වසා ගැනීමට සැරසුණෙමි.

හදිසි තියුණු හැරවීමත් සමඟ, නළා හඬ නගමින් මංතීරු හතරක් හරහා ගොස් මාවත පසෙක වූ වාහනවලට අනතුරු අඟවන කැඩිලි පාට පේත්තු පේළියක් පෙරළා දමමින් අපේ රථය මාවතින් පිටතට පිවිසීමට ඇති බොක්කුවක් වෙතට ආවේය. අඩක් ඉදිවී බොක්කු පතුළේ දැල්වුණ අනතුරු අඟවන එළියක් පවූ කොන්ක්‍රීට් තට්ටුව සමඟ වූ ආරක්ෂිත යකඩ වැටත් දුටු මට කෑගැසුණි. තිරිංග හඬ නංවමින් රථය මුල්ලකින් හැරෙද්දී මාවත පසෙක සිටි ළමුන් දෙදෙනෙකු ඉවතට පැනගත් අතර මාවත පසෙක වූ තල් ගස් පේළියේ නොගැටී රථය ඒවායෙහි ඇතිල්ලෙමින් ගියේය. කිසි කලෙක නැති පරිදි මම බියවී සිටියෙමි. මරුවා අපේ මුහුණට එබී සිටි අතර අපට කළ හැකි දෙයක් නොවීය. සටනකදී නම් උත්සාහයක් දැරිය හැකි වුවද, ඊට බොහෝ දුරුණු ලෙස මෙහිදී දෛවය අපේ අතින් ගිලිහී තිබුණි. හිස පහත් කළ මට මගේ නිය පොතු තදවීමෙන් හීරෝගේ අතේ ඇඟිලි සමෙහි ඇති වූ අඩ සඳක් බඳු රතු පැල්ලම දැකිය හැකි



විය. දිගටම මෙසේ ගමන් කරන්නද? පාරේ යන අහිංසකයින් අපේ ඉරණමට ගොදුරු නොවේවා යි මම යාච්ඤා කළෙමි.

එන්ජිම යන තරම් වූ ගැස්මක් සමඟ, සෙඩාන් රථය වේදිකාවකට පැන වියළි තණ කොළ සහිත බිමකට හැරුණි. පටු මාවත එතැනින් අවසාන වූ අතර රිදී පැහැ වෑන් රථය අපගේ මඟ අහුරනු ලදී. පැබිලෝ තියුණු වටයක් කරකවා අපගේ මෝටර් රථය වෑන් රථය වෙතට වේගයෙන් ධාවනය කළේය.

පැබිලෝ ශාප කර කෑගසමින් සුක්කානම කැරකෙන උපරිම දුරට ඇඹරවීය. වෑන් රථය අසලම තත් කිහිරි කරවන තිරිංග හඬ නංවා අපගේ රථය දකුණට හැරුණි.

එය එක් දිශාවකට වාහන ගමන් කරන මඟක් වූ අතර අපි වැරදි දිශාවට යමින් සිටියෙමු.

"සීට් බෙල්ට් එක දාගන්න" මම විවෘත ජනේලයෙන් එන සුළඟේ හඬින්, ළඟාවන සයිරන් නළා හඬින් සරයා හීරෝට කෑගැසීමි. අප බැම්මවලින් නිදහස් වී ඇති බව රවුලා හෝ ඔහුගේ මිතුරා දැන ගනු ඇතැයි බිය වීමට එය කාලයක් නොවීය. රථයෙන් රථය මහත් හඬ නගා නළා නාද කරමින් අපව පසු කරද්දී අපේ රථය නිතර නිතර පසෙකට හැරෙමින් ගමන් කළේය. ලෝකයේ භයානකම ඔට්ටු සෙල්ලම-මගේ ආසන පටිය ඇදගත් මම අවසාන වතාවට හීරෝ දෙස බැලීමි. ඔහු මගේ දෙනෙත දෙස දෑස් දල්වා සිටියේය.

"මම ඔයාට ආදරෙයි, ජෙවන් කෝගේ" ඔහු කීවේය.

මම ඔහුගේ අත ග්‍රහණය කරගෙන ඉවත බැලුවෙමි. මගේ හිත තුළ දෝංකාර දෙන වචන පිටතට ගලා නොආවේය. මම දැඩි ශෝකයකින් වෙළී සිටියෙමි. ඉදිරියේ ඇති මරණය ගැන සිතුවිලිලත් සමඟ හීරෝ පිළිබඳවත්, මගේ ජීවිතය පිළිබඳවත් මහත් දයාවක් මා වසා පැතිරෙනු දැනුණි. ඉදිරියෙන් රතු ආලෝකයක් දැල්වුණි. අපේ වේගය බාල නොවුණි. හතර මං හන්දිය පසු කරන්ම මෝටර් රථයක් වේගයෙන් අප කරා එනු මම දුටිමි.



www.sinhalalibrary.com

ඒ සමගම, මෝටර් රථය ගැටිණි.

එය සත්‍යයකි. කෙනෙකුගේ ජීවිතය තම දෑස ඉදිරිපිටම එය සත්‍යයකි. බලවත් ඝට්ටනයේ හඬට පෙර ආ රථ විදුලියක් මෙන් දිස්වෙයි. බලවත් ඝට්ටනයේ හඬට පෙර ආ රථ විදුලියක් මෙන් දිස්වෙයි. බිහිරි කරවන හඬ සමග මගේ අස්ථි කුඩුව සිරුරින් රෝදවල බිහිරි කරවන හඬ සමග මගේ අස්ථි කුඩුව සිරුරින් වෙන් වන්නට යන බවක් දැනුණි. ආසනයට බැඳී සිටි මා සෙමින් වන්නට යන බවක් දැනුණි. ආසනයට බැඳී සිටි මා වෙන් වන්නට යන සෙඩාන් රථය තවත් වරක් උඩ විසිවන්න සැගසද්දී කැරකී යන සෙඩාන් රථය තවත් වරක් උඩ විසිවන්න මගේ හිස ජනේලයේ ගැටිණි. ඉන්පසු............

කාලය නැවතුණි-බිඳෙන හඬ හා දැවැන්ත යන්ත්‍ර ඉදෙනස් එකිනෙක ගැටී නැගෙන විලාප හඬ. හීරෝගේ උණුසුම් සිරුර මා අසලම, ඉදිරියෙන් මැරයින්, රථයට බැඳුණු මගේ සිරුර, උණුසුම් හා දුවිල්ල....... රතු තැඹිලි ආලෝකයක් තුළ ඒ සියල්ල සැගව යද්දී, කාලයෙන් පිට පැන්න මම සැඩ සුළඟකට මැදිව දර්ශනයෙන් දර්ශනයට පාව ගියෙමි. මතක් කරගත නොහැකි වුවද, සිදුවූ බව දන්නා සිදුවීම් දකින්නට ලැබීම මහත් පුදුමයට කරුණකි. මා කිසිදින නොදුටු තිබූ මගේ මව ලොස් ඇන්ජලීස් බලා එන එම ඉරණම් සහගත ජපන් ගුවන් සමාගමට අයත් යානයක වාඩි වී සිටීම....... නැවත මා කඩා වැටුණු යානයෙන් දිවිගලවා ගත් සය මස් වියැති එකම කෙනා, සුන්බුන් ගොඩක් උඩ වැතිර සිටීම...... මගේ සහෝදරයා, ඔහිගෝ සදහටම වෙන්වීමට මොහොතකට පෙර මගේ පියා, කොනිෂි යචිගිරියෙන් හඬ නැඟීම...... වෙඩී යකුසාරා සමග මා විවාහ වන්නට යන බව මගේ පියා ප්‍රකාශ කළ එම රාත්‍රිය...... විවාහ උත්සවය කඩාකප්පල් කළ නින්ජා සටන් කරුවා අතින් ඔහිගෝ මිය යාම....... රාත්‍රියේදීම පයින් ඇවිද ගොස් ලොස් ඇන්ජලීස්වලට පලායාම......... හීරෝ සොයා ගොස් මට පුහුණුව ලබාදීමට ඔහුව කැමති කරවා ගැනීම....... පුරම වතාවට ඔහු මා සිප ගැනීම..........

සවන් සිදුරු කැවෙන බිඳෙන හඬක් සමග සියල්ල නැවතුණි. මගේ හිස පස්සට ගැස්සුණු අතර හදිසියේම මගේ ආත්මය ආපසු සිරුරට පැමිණ ඉන්ධන හා රබර් දැවෙන කටුක ගන්ධය දැනෙන්නට විය. මම හිස සොලවා දෑස පැහැදිලි කර



ගතිමි. අපේ ගමන නැවතී තිබුණි.

"ඔයාට කොහොමද?" හුස්ම ඉහළට ඇදගත් මම හීරෝගෙන් ඇසීමි.

"හොඳයි, හොඳයි ඒත් ඔයාට තුවාලයි" කී ඔහු මගේ නළල පිස දැමුවේය.

"මගේ ඔළුව ජනේලයේ හැපුණා." මම කීවෙමි. යම් හේතුවක් නිසා, මා තවමත් අවදි නොවුණු සිහිනයකදී අහඹුව සිදුවූ කලක මෙන් මට දැනුණු බවක් දැනුණි.

"මම දැක්කා" කී හීරෝගේ මුහුණට මා කෙරෙහි සැලකිලිමත් වන බැල්මක් ආරූඪ විය. මම ජනේලය දෙස බැල්මක් හෙළීමි. මගේ හිස හැපුණු තැන පුපුරා තිබුණි.

"එන්න, අපි එළියට පනිමු." හීරෝ මගේ ආසන පටිය මුදා හැරියේය. "මේ පැත්තේ දොර හිරවෙලා" මම කෑගැසුවෙමි. රැවුලා ලෙයින් නැහැවුණු ඉදිරි අසුනෙන් ඇද වැටී සිටියේය. පැසිංලෝ ඉදිරි වීදුරුව කඩාගෙන ඉදිරියට විසිවී තිබුණි. ඩෑෂ් බෝඩය මත බිඳුණු වීදුරු කැබලි ගොඩක් මත උකුළ සිටින සේ වැටී සිටි ඔහුගේ එක් අතක රන් මුදු ලෙයින් නැහැවී තිබුණි. ඔහුගේ අත තවදුරටත් බාහුවට සම්බන්ධ නැති බව මට ඉවෙන් මෙන් පෙනුණි. මගේ කුස පෙරළෙද්දී මම දෑස් ඉවතට ගතිමි. අනවශ්‍ය ප්‍රමාණයට මට ඔවුන්ට සමීප වීමට වුවමනා නොවීය. අසුනෙන් දිග හැරුණු හීරෝ ඔහු පස වූ දොරට පා පහරක් දුන්නේය.

කිසිවක් සිදු නොවුණි. මට ගිනි දළුවල හඬ ඇසෙද්දී ඉන්ධන දැවෙන කටුක දුර්ගන්ධය පැතිරෙන්නට විය. ගිනිදළු බැලීමට එබී සිටිනවාක් මෙන් ඉදිරි වීදුරුවෙන් ඉදිරියට විසිවී සිටි පැසිංලෝ අසලින් කළු දුමාරය පැමිණ රථය තුළ පිරෙන්නට විය.

එන්ජිම ගිනි ගෙන තිබුණි. "ඉක්මන් කරන්න" මගේ දොර සමග පොර බදමින් මම හඬ නැඟුවෙමි. නාසයේ දුම් පිරී මම කහින්නට වීමි.



www.sinhalaelibrary.com

හීරෝ නැවතත් දොරට පහර දුන් නමුත් එය නොසෙල් වුණි. "මට ඔයාගේ ස්වෙටරය දෙන්න."

මා මගේ සීත කබාය ගලවා දුන් අතර හීරෝ එය අතෙහි ඔතා ගත්තේය. "අනිත් පැත්ත හැරෙන්න." දැවිල්ලෙන් පුපු ලූස විස ගැනීමට එය අවස්ථාව කරගත් මම මුහුණ සඟවා ගතිමි. හීරෝ ජනේලයේ ඉතිරි වීදුරුවලට අත් පහර දී කඩා දැමුවේය. ඔහු මාව ඇද එළියට තල්ලු කරද්දී, ඉතිරි වූ වීදුරු කටු මගේ කලිසමේ දණ හිස පසාරු කරගෙන ඇනෙද්දී, එය නොතකා මම එළියට බඩගා ගතිමි. මා සමඟම එළියට පැමිණි හීරෝ සමඟ දෙදෙනාම පදික වේදිකාවට පෙරළී, දුම් දමන සුන්බුන් ගොඩින් ඉවතට අපි පෙරළී ගියෙමු. පිරිසක් වට වෙන්නට වූහ.

"ඈත් වෙන්න!" හීරෝ කෑගැසුවේය. "කාර් එක පුපුරන්න යන්නේ!"

පිරිස කෑගසමින් මාවතේ අනෙක් පසට දිවූහ. සයිරන් හඬ ඇසී මම රිදී පැහැ වෑන් රථය දැකගැනීමට වට පිට බැලීමි. අඩි හතලිහක් පමණ දුරින් එය පැත්තට පෙරළී තිබුණි. ඉහළට ඇරුණු දොරින් මිනිසුන් දෙදෙනෙකු බඩ ගා බිමට පනිනු මම දුටුවෙමි. මා සිතා තිබූ දෙයම දකින්නේ ඇයි සැක හැර දැනගැනීමට මම ඉක්මනින් ඇසි පිය හෙළා බැලුවෙමි. ඔව්, ඒ ඔවුන් විය. පැහැර ගැනීම සිදුවූ තැන සිට මා පසු පසින් එන යකුම්රා සගවරයෝ.

"ඒ යකුම්රාගේ කට්ටිය!" කී මම හීරෝගේ අත ග්‍රහණය කළෙමි. "එතකොට අර මිනිස්සු කවුද?" මම කළු සෙඩාන් රථය දැක්වීමි.

"අපි ඒක පස්සේ හොයමු. අපි මෙතැනින් පැන ගන්න ඕනැ."

තඹවන් කෙස් ඇති කාන්තාවක් පිරිස මැදින් අප වෙත දුව ආවාය.

"මම ඩොක්ටර් කෙනෙක්. ඇම්බියුලන්ස් එක එනතුරු ඔයාලා වාඩිවෙලා ඉන්න."



"අපිට කරදරයක් නැහැ," හීරෝ කීවේය. "ඒත් අර හාදයින්ට හුඟාක් අමාරුයි වගේ" වෛද්‍යවරිය සැක මුසුව බැලුවාය. "මෙතැන වාඩිවෙන්න. හෙලවෙන්න එපා." අණ කළ ඈ අසළට තල්ලු කරගෙන ඒමට උත්සාහ කළ යකුම්රා මිනිසුන් දෙදෙනාට බාධා කළාය. ඔවුනු වාදයක් ආරම්භ කළහ.

"රැවුලාට මොකද වුණේ?" මම හීරෝගෙන් ඇසීමි. "එතකොට පැබ්ලෝ?" ඔහුගේ වෙඩිවූ අත ගැන සිහිවී සිරුර සලිත වෙද්දී මම කතා කළෙමි. හීරෝගේ මුහුණේ මස් පිඩු තද වුණි. "මම හිතන්නේ උන් ඉවරයි." එම වචන ඔහුගේ මුවින් පිටවනවාත් සමඟම, පොළොව දෙදරුම් කන මහත් පිපිරීමකින් වාතලය කම්පිත විය. සෙඩාන් රථයේ ඉන්ධන ටැංකිය අවසානයේ පිපුරුණි. පිරිස එක විටම පහත්වූ අතර මිනිස්සු කෑමොර දෙන්නට වූහ. වියරුවට එක් වෙමින්, රෝද හඬ නංවමින් පොලිස් රථ තුනක් එත්ම, ගෙරවිලි හඬ නගමින් ගිනි නිවන රථයක් මුල්ලකින් මතු වුණි. ඝන කළුදුම් වලාවක් අහසට නැඟුණි.

"දුවමු" කී හීරෝ මගේ අතින් ඇදගෙන හතර මං හන්දිය හරහා පැන පටු මාවතකට දිව්වේය. නවතින ලෙස පොලිසිය අපට කෑගසනු මට ඇසුණ නමුත්, අපිව අසුවුණේ නම් සිදුවූවේ කුමක්දැයි දැන ගැනීමටවත් අපට ඉඩක් නොලැබෙන බව මම දැන සිටියෙමි. රිදී පැහැ වෑන්රථයේ පැමිණි යකුම්රා පවුලේ මිතුරන් අපව දැක්කේ නම් එතැනදීම ඔවුන් අපව මරා දමන බව පමණක් මම දැන සිටියෙමි.

"පාර මෙතැනින් ඉවරයි" දම්වැල්වලින් සම්බන්ධ වූ වැටක් වෙත ළඟා වෙද්දී මම හුස්මක් ඇදගතිමි. හීරෝ අපේක්ෂා සුන්ව එය වේගයෙන් සෙලවූවේය. "වැඩක් නැහැ" ඔහු කෑගැසුවේය. පිටවීමට මඟක් සොයා කලබලයෙන් මම වටපිට බැලුවෙමි. අපේ දකුණතින් ජරාවාස වූ දොරක් තිබුණ අතර මා උත්සාහ කළ ද එය නොසෙල් වුණි. මා උරහිසින් එයට තදින් ඇන්නද ඉන් මගේ උරපත්ත රිදුම් දුන්නා පමණි.

"තුවාල කරගන්න එපා." මගේ ඇද වූ මුහුණ දැක හීරෝ

කිවේය. "එන්න අපි මෙතන උඩින් පනිමු." මා වැට වෙතට දුව ගොස් වැට දිගේ කගිද්දී හීරෝ මා පසු පසින් විය. අප අනෙක් පසට බසින්ම පොලිස් නිලධාරීහු අතුරු මාවතට දුව ආහ.

"අන්න ඉන්නවා!"

ආපසු නොබලා දුව ගිය අපි සෙන්ඩියාගෝ මාවත් ජාලයට වැටුණෙමු. මා නිසිදින මෙහි නොපැමිණ තිබූ අතර හීරෝ පැමිණ තිබුණේ දැයි මට අදහසක් නොතිබුණි. ඇසීමට කාලයක් නොවීය. නිවාස පිහිටි මාවත් ඔස්සේ දුව යද්දී නගරය බොඳ වී පෙනුණි. මගේම විවාහ උත්සවයෙන් මා පලාගිය අයුරු මට සිහිවුණි. ඒ නැලෝවීන්හිදීය. ඊට හය මසක් හෝ ගතව නොතිබුණද ඒ රාත්‍රියේ සිට ජීවිත කාලයකට සෑහෙන්න මම ජීවත්ව තිබුණෙමි.

මේ වෙනස් අවස්ථාවකි. මගේ තනියට හීරෝ සිටින අතර මේ රාත්‍රිය නොවෙයි. මාස ගණනක් ගතව තිබුණද මා තවම ආරම්භ වූ තැනයි-තවමත් ආරක්ෂාව සොයා දිව්ල්ලක. මගේ සහෝදරයා ඝාතනය කළේ කවුද යන්න ගැන මට අදහසක් නොතිබුණද එයට පිළිතුරු සෙවීමට ගොස් මට ඉතිරිව ඇත්තේ විනාශ වූ ජීවිත සංඛ්‍යාවක් පමණි.

එහෙත් මම දැන් විවාහයට පෙර ලොස් ඇන්ජලීස් වෙත ආ බියගුලු, නරක් වූ, පලකට නැති කුඩා කෙල්ල නොවෙමි. මුල් අවධියේ මෙන්ම සුපුරුදු ලෙස දුවමින් සිටියද මම දැන් සටුරායි තරුණියක් වෙමි.

"හීරෝ!" හුස්මක් ගෙන ඇලයෙන් එන වේදනාවත් සමග මම කතා කළෙමි. "මගේ මස් පිඩු පෙරළෙනවා" මම වේගය බාල කළෙමි. "අපි දැන් හුඟක් දිව්වා."

හීරෝ වේගය බාල කළේය. ඔහුගේ නළලින් දහදිය වැගිරෙමින් තිබුණි.

"මම දන්නවා. ඒත් මෙතැන ආරක්ෂිත නැහැ."

"කොහේද?" මා හුස්මක් ගනිද්දී හදිසි අපේක්ෂාභංගත්වයක්



මා වෙළා ගත්තේය. "අපි මෙහේ කවුරුවත් අඳුනන්නේ නැහැ. අපි දිහා බලන්න. අපිව දකින ඕනෑම කෙනෙක් පොලීසියට කතා කරනවා. අපි මේවා හොඳ ගන්න ඕනෑ."

නැවතුණ හීරෝ, හතිලමින් මගේ හිස සිට දෙපතුල දක්වා බැලුවේය. "ඔයා හරි" ඔහු නැමී දැන් දිගු කරමින් කීවේය.

"මේ විදිහට අපි තවදුර යන්නේ නැහැ."

ඒ ගැන මම මහත් සතුටට පත්විමි. කොළ පැහැ තණකොළ ඇති හා ඒ මතට සීතල දිය බිඳු ඉසිමින් කැරකෙන කරාමයක් තිබෙන ළඟම ඇති තණ පිට්ටට දුව යාමට මට අවශ්‍ය විය. මධ්‍යාහ්නය පසුව තිබූ අතර උණුසුම දැඩි විය. "හෝටලයකට ගියොත් අපි අහුවෙනවා. වෙන තැනකට යන්න ඕනෑ."

හීරෝ හිස සැලුවේය. "අපි ඉස්සර වෙලාම පිරිසිදු වෙන්න තැනක් හොයා ගෙන ඊළඟට කරන දෙය ගැන හිතමු."

මම හීරෝ පසුපස කොර ගසමින් යන්නට වීමි. කොතරම් සවන් කර තිබුණත්, කොතරම් ශක්තිය වැයව තිබුණත්, ඔහු තුළ ශක්ති ගබඩාවක් තිබුණාක් මෙන් විය. ඔහු යන්ත්‍රයකි. අනෙක් අතට මා ට්‍රක් රථයකට යට වූ කෙනෙක් මෙන් විය.

"අර පැත්තට යන්න. වැඩිය කාටවත් පෙනෙන්න ඉන්න එපා." කී හීරෝ විනාඩි කීපයකට පසු, බඩු මල්ලක්ද සමග පැමිණියේය.

"වතුර ගෙනාවද?" මම ඇසුවෙමි.

හීරෝ මල්ලෙන් වතුර බෝතලයක් ගෙන දුන් අතර මම ඉක්මනින් මුව පුරවා ගනිද්දී උතුරා යන වතුර ගෙල දිගේ පහළට ගැලුවේය. හුස්ම ගැනීමට මා නවතිද්දී හීරෝ බෝතලය ආපසු ගත්තේය.

"දැනට ඇති. අසනීප වෙයි." කී හීරෝ මල්ලෙන් ගත් පාර්සලයක් මා අත තැබුවේය. "අර ටොයිලට් එකට යන්න මම පිටිපි එකේ ඉන්නවා."



www.sinhalalibrary.com

කාන්තාවන් සඳහා වූ කුටියට ගිය මම පාර්සලය දිග හැර සමත් තැටියක්, සාමාන්‍යයෙන් පිගන් හෝ වාහන වීදුරු පිසීමට යොදාගන්නා ආකාරයේ තුවායක් හා පනාවක් පිටතට ගෙන ඉතා ප්‍රවේශමෙන් මගේ කුණු තැවරුණු ටී-ෂර්ටය ගලවා දැමුවෙමි. තත්ත්වය අනුකම්පා විරහිත විය.

මගේ සිරුර පුරා තැළුම් සීරුම් විය. සටන් කිරීමෙන් ලද ඒවා දම් - කළු පැහැයෙන් යුතු වූ අතර ගැටුමේදී ඇතිවූ අලුත් ඒවා ළා නිල් පැහැයක් ගෙන තිබුණි. ආසන පටියේ පාර උරපත්තේ සිට පපුව හරහා වැටී තිබුණි. පැබිලෝගේ ඉරණමට ගොදුරු නොවී එපමණකින් බේරීම ගැන මම සතුටු වීමි. ඉතුරුව තිබූ ඉලාස්ටික් වලේල ගෙන කොණ්ඩය බැඳගත් මම ඇඳුමක් තෙමා සබන් දියකර සිරුර මැදුව පිසගන්නට වීමි. අවසානයේ මුහුණේ පෙනුම තරමක් දුරට යහපත් වූ පසු ලේ හා දූවිලි තැවරුණු හිස කෙස් සේදීම ආරම්භ කරන විටම දොරට තට්ටු කරන සියුම් හඬක් නැගුණි. පාර්සලයේ වූ අලුත් ටී-ෂර්ටය ඇඳ ගනිමින් මම කතා කළෙමි.

“කවුද?”

“මම”

මා දොර විවර කරත්ම හීරෝ ඇතුළට රිංගා ගත්තේය.

“ කවුරුවත් ඔයාව දැක්කාද? මම කෙඳිරුවෙමි.

“නැහැ, මම හිතන්නේ” කී ඔහුගේ ඉදිමුණු නමුත් පිරිසිදුව තිබූ මුහුණේ සිනාවක් ඇඳුණි. ඔහුගේ කඩවසම් පෙනුමට එතරම් හානියක් වී නොතිබුණි. කෙසේ වුවද? ඔහුගේ පෙනුමින් මගේ හදවත උණු විය.

“ටී-ෂර්ට් එක ලස්සනයි.” ඔහු කීවේය.

මම ඇස් කැරකැවූවෙමි. “ඔයායි තේරුවේ. ඒත් ටිකක් හිරයි.”

“ඔයාට කඩදාසියක් ඇන්දුවත් ලස්සනයි, හෙවන්” කී ඔහු මගේ බඳ වටා අතක් යවා මාව සමීප කරගත්තේය. මම ඔහුගේ



උර මත හිස තබා ගතිමි.

“අපි ඉක්මනට යන්න ඕනෑ. ප්‍රශ්නය කොහාටද කියන එකයි.” හීරෝගේ හඬට බැරෑම් ස්වරයක් ආරූඪ විය. මගේ තැළුණු සිරුර දෝවනය කරන කාලය පුරාම මගේ සිතේ තිබූ ප්‍රශ්නයද එයම විය.

“මට තව දුවන්න බැහැ, හීරෝ.” මම සුසුමක් හෙළීමි.

“මොකක්ද ඒකේ තේරුම” හීරෝ සැලකිලිමත්ව ඇසුවේය.

“ඒ කියන්නේ මේ විදිහට දුවන එකේ තේරුමක් නැහැ. මේ අබිරහස අපි පස්සෙන් පන්නන්නේ එක කණ්ඩායමක් නොවෙයි කියලා පැහැදිලියි. මාර්කස්ගේ මැරයොත් ඉන්නවා. මීකෝ කුඩම්මාගේ සම්බන්ධයක් තියෙන බවත් පෙනෙනවා.......”

“තවම ඔයාගේ කුඩම්මා මේවාට සම්බන්ධ කොහොමද කියලා අපි දන්නේ නැහැ.” දත් බැඳ ගනිමින් හීරෝ කීවේය. “තවදුරටත් මෙතැන ප්‍රධාන යකමුරාලා.”

“ඒක හරි.” මම එකඟ වීමි. “අපි මොකවත් දන්නේ නැහැ. ඒ නිසයි අපි දුවන එක නවත්වන්න ඕනෑ. අපිම මේකට උත්තර හොයන්න ඕනෑ. ඒකයි මට ආපහු ලොස් ඇන්ජලීස්වලට ගිහින් යෝජි යකමුරාට කතා කරන්න අවශ්‍ය.”

“ඔය ඇත්තමද?” හීරෝ සැකයෙන් ඇසුවේය.

“ඇත්තෙන්ම බලන්න අවසානයේ ඉන්නේ යකමුරාලා. අපිව පැහැරගෙන ආව හාදයින්ගේ පවා යකමුරාලට සම්බන්ධයක් තියෙනවා. ටෙඩීගේ මත්ද්‍රව්‍ය සම්බන්ධය කොයි තරම් දුර ගිහින්ද කියන්න අපි දන්නේ නැහැ. සමහර විට එයාගේ තාත්තාගේ බිස්නස්වලට සම්බන්ධ වෙලා ඉන්න ඇති.”

“හොඳයි, ඔයා මට වැඩියෙන් දන්නවා.....”

හීරෝ ඊර්ෂ්‍යාවෙන් කතා කරන්නේද? මා ටෙඩී හා විවාහ වීමට එකඟ වූ බව දැනගැනීමට ඔහු නොසතුටුව සිටියේය. එය

හීරෝ හමුවීමට පෙර හා සියල්ල පැහැදිලි වීමට පෙර සිදුවූ දෙයක් මිසක්, මා විවාහයට කැමති වූවේ වෙගාස්වලින් පැන ගැනීමේ සැලසුමේ එක් කොටසක් ලෙසත් මා හීරෝට කියා තිබුණද ඔහු නිතර ඒ ගැන හිතේ අමාරුවෙන් සිටියේය.

"ඇත්තටම මම දන්නේ නැහැ." මම එක්වර කීවෙමි. "මමයි ටෙඩියි ඒ තරම් කතා කරලා නැහැ." ටෙඩී ජීවතුන් අතර නැති මේ වෙලාවේ එසේ කීම හාස්‍යජනක බව පෙනුණි.

හීරෝ දෙබැම එසෙව්වේය. "මම අදහස් කළේ ඒක නොවෙයි."

මෙය හීරෝ සතුව ඇතැයි මා සැක කර නොතිබූ ඔහුගේ පැති කඩකි. "ටෙඩීගේ තාත්තා මොනවා හරි දන්නවා ඇති. ඒක දැනගත්තාට පස්සේ මට පුළුවන් මේවා ඉවරයක් කරලා දාන්න." මම දැස පියා ගතිමි. "අපිට මේ විදියට තව දුර යන්න බැහැ."

"හෙවන්" හීරෝ මෘදු හඬින් කතා කළේය. "ඔයා හිතනවාද ටෙඩී මැරුණා, ඒ වෙලාවේ ඔයත් එතැන හිටියා කියන එක අහගෙන ඉන්න තරම් හොඳ ඉවසිල්ලකින් යෝජි ඉඳීවි කියලා? මිනිහාට යක්ෂයා ආරූඪ වෙයි. මිනිහා මොනවා කරයි ද කවුද දන්නේ?"

"මිනිහට මාව පණ පිටින් අවශ්‍යයි." මම කීවෙමි. මට ඒ ගැන විශ්වාසයක් තිබුණි. "මිනිහාගේ බිස්නස් කඩා වැටිලා. ඒක ගොඩගන්න මිනිහාට ඕනෑ කෝර්ගේ පවුලේ සල්ලි. කසාදයට පළමු හේතුව ඒක. ඒකයි මම පැනලා ගියාට පස්සේ ටෙඩී මාව හොයන්න ඒ තරම් මහන්සි වුණේ. යෝජි මාව මැරුවොත්, හ්ම්!" මම දැත් එකට ගසා ගතිමි. "එතකොට මිනිහාට සතයක් වත් දකින්න ලැබෙන්නේ නැහැ. ඒත් ටෙඩීට වුණේ මොකක්ද කියලා මිනිහාට දැනගන්න ඕනෑ නම්, අපිට පුළුවන් උදව් කරන්න. අපිට පුළුවන් මිනිහාට පළිගන්න උදව් කරන්න."

හීරෝ ඇඟිලිවලින් කෙස් පිරි මදින්නට විය. මොහොතකට කරාමයෙන් ජලය වැක්සෙන හඬත්, මහ මාවතේ රථවාහන දුවන හඬත් පමණක් මට ඇසුණි. මගේ තීරණය නිවැරදි බව



සිතූ මම හීරෝ එය තේරුම් ගනිත්වා යි යාච්ඤා කළෙමි.

"පළිගැනීම සමුරායි ක්‍රමය නොවෙයි" අවසානයේ හීරෝ කීවේය. "සාධාරණය ඒත් ටෙඩීගේ මරණයට අපි පළිගන්න ඕනෑ නැහැ."

"ම්, හිතන්න, හීරෝ" මම ආයාචනා කළෙමි. "මේ වෙද්දී අපි හැම ජපන් කුල සිරිතක්ම කඩලා තියෙනවා. මම කියන්නේ ඔයයි, මමයි එකට. ඔයා මගේ ගුරුවරයා."

"මම දන්නවා අපි හරියටම සමුරායි ප්‍රතිපත්තිවලට බැඳිලා නැහැ කියලා." ඔහු කීවේය. "ඒත් මේ තත්ත්වය වෙනස්ම එකක්. ඒ වුණාට අපි අමාරුවෙන් ලබාගත්ත දේවල් නිකම්ම ජනේලයෙන් එළියට විසි කරන්න බැහැ. එහෙම කළොත්, අපි දඩාවතේ යන සමුරායිවරු, කුලී සටන්කාරයෝ."

මම කියන්නේ, ටෙඩීගේ මරණයට පළිගන්න අපි යෝජිගේ කුලී සටන්කාරයෝ වෙන්න යනවා කියන එක නෙවෙයි." මම බල කළෙමි. "යෝජිට අවශ්‍ය තොරතුරු අපි ළඟ තියෙනවා. අනික, අපි වෙන මොනවා කරන්නද?"

හීරෝ නිශ්ශබ්ද විය. වෙහෙස මා වසා පැතිරෙද්දී දෙකකුල වෙව්ලන්නට විය. වැසිකිළි පෝච්චියේ පියන වසා මම ඒ මත වාඩි වුණෙමි. අපි මෙතෙක් ක්‍රීඩා කළ භයානක ක්‍රීඩාවකදී වැරැද්දක් කළ කලෙක මෙන්, ටෙඩීගේ මරණය ගැන බරපතළ ලෙස කතා කිරීමට සිදුවීම මට දැරිය නොහැකි විය. මට කුමක් සිදුවීද? මේ සටන්කාමියකු වීමේ ලක්ෂණයක්ද? අනුකම්පාව හා මනුෂ්‍යත්වයේ අවසාන අංශු මාත්‍රයත් මා වෙතින් ගිලිහී යන්නේද? ටෙඩී දරුණු පුද්ගලයෙකි. එහෙත් ඇතුළාන්තයෙන් ඔහු හිත හොඳ මිනිසෙක් විය. හීරෝ මට සමීප වූ ආකාරයට වඩා වෙනස් ආකාරයකින් ඔහු මට සමීප මිතුරෙකු වූවාක් මෙන්ම ඔහු මට ආදරය කළේය.

"හොඳයි, හෙවන්" කී හීරෝ මෘදුව ඇද මාව නැගිට්ටෙව්වේය. "ඔයා හරි. අපි යෝජි හම්බ වෙමු. මට අවශ්‍ය ඔයාගේ ආරක්ෂාව"

"මම දන්නවා ඒක" සහනයක් ඇති කී මම ඔහුව වැලඳ ගතිමි. "මාව විශ්වාස කරන්න."

"මම දන්නවා" කී ඔහු පසෙකට පියවර තැබුවේය. "එහෙනම් ආපහු ලොස් ඇන්ජලීස්වලටද?" ඔහු ඇසුවේය.

"ඔව්, මොකද හිතන්නේ? බස් එකේ යමුද?"

හීරෝ හිස වැනුවේය. "හුගාක් අවදානම්, බස් පොළවලයි දුම්රිය පොළවලයි ඇහැ ගහගෙන ඇති. කුලී කාර් එකක් ගන්න එක හොඳයි." කී ඔහු විරාමයක් නැවතුණේය. "අපි එහේ ගියාට පස්සේ මොකද වෙන්නේ? යෝජිව හොයාගන්නේ කොහොමද?"

"මා ළඟ සැලසුමක් තියෙනවා." සිනාමුසුව මම පිළිතුරු දුනිමි.

"අහා!" හීරෝ විහිළු කළේය. "මට හිතා ගන්න පුළුවන්"

මම ඔහුගේ අතට සෙමින් පහරක් ගැසුවෙමි. "මට මේ කොණ්ඩයට මොනවාහරි කරන්න ඕනෑ."

"ඔහොම වාඩිවෙන්න. මම උදව් කරන්නම්."

මම හිස සෝදන බේසමට නැඹුරු කළ අතර හීරෝ මගේ කෙස් වැටියේ සබන් ගැල්වූවේය. හිස සේදී දුඹුරු පාටින් වතුර ගලන්නට විය.

"මෙහෙම පැටලුම් හරින්න කවදාවත් බැහැ." කී මම කණ්ණාඩියෙන් ඔහුගේ මුහුණ බැලීමි. "කපමුද?" මම ආවේගාත්මකව ඇසීමි.

"ඒක හුගක් හොඳයි. ඒත්......" හඬ බාල වූ ඔහු දෙඅත් මගේ උරහිස මත තැබුවේය.

"කපන්න" මට ඇනුණාට වඩා ප්‍රබල හඬකින් මම අණ කළෙමි.

"එතකොට මගේ පෙනුම වෙනස් වෙන එක හොඳයි."



කී මම ඔහුගේ බැරෑරුම් මුහුණ පරීක්ෂා කළෙමි. "ඔයාගේ කොණ්ඩයටත් මොනවා හරි කළොත් හොඳයි."

හීරෝ තම අතැඟිලි කෙස් අතරින් යැව්වේය. "එයි කරමුද?"

"තඹ කොණ්ඩයක් තිබුණොත් ඔයා කොයි වගේද කියලා මම නිතරම හිතුවා" මම විහිළුවට කීවෙමි.

හීරෝ හිස සැලුවේය. "මම වුවමනා දේවල් ගේන්නම්."

මම වාඩි වී ඔහු එනතුරු කල් මැරීමි. මගේ තීරණ නිවැරදි බව මම දැන සිටියෙමි. නමුත් සමහර විට නිවැරදි තීරණ රිදුම් දෙයි.

# 2.



"මෙතැනින් දකුණට" මම හීරෝට කීවෙමි. මෝටර් රථය හැරවූ ඔහු වයිනාටවුන් තුළට ධාවනය කළේය. රථයේ ජනේල තුළින් ආ වියළි සුළඟට මගේ ඉහිරී වී තිබූ කෙස් අවුල් වන්නට විය. පැති කණ්ණාඩියෙන් දහස් වරක් බැලුවද මා කෙතරම් වෙනස් වීදැයි විශ්වාස කළ නොහැකි විය. එය ආධුනිකයෙකු විසින් වෙළෙඳ සැලක නාන කාමරයේදී කැපූ කොණ්ඩයක් කීමට බැරි තරමට නදිම එකක් විය. ඉදිරියෙන් ඇස්වලට නොවැටෙන තරමටත් දෙපසින් නිකටින් මදක් පහතට වැටෙන තරමටත් කැපී තිබුණ කොණ්ඩය සමග මට ගැහැනු පෙනුමකට වඩා අමුතු පෙනුමක් ලැබී තිබුණි.

"ඔයාට අමාරුද?" මම ඇසීමි. සැන් ඩියාගෝහි සිට එන ගමනේදී කොටසක් මම නිදා ගතිමි. කෙටි නින්දක වාසිය ඔහුට නොලැබීම ගැන වරදකාරී හැඟීමක් මා තුළ විය. මට රිය



පැදවිය නොහැක. ලොස් ඇන්ජලීස් වෙත පැමිණීමට පෙර මට වාහනයක් පැදවීමට තැනක් නොවීය. එහෙයින් ඔහුට විවේකයක් දීමට මට නොහැකි විය.

"අමාරුවක් නැහැ. යන තැන කොහේ වුණත් ඇත් ළඟද?

"ඔව් මෙතැනින් දකුණට හැරිලා වමට තියෙන පළවෙනි පාර"

හරස් මාවත මස්සේ ඇදී ගිය අපි දිප්තිමත් ලැලි නාම පුවරුවක් සහිත වෙළෙඳ සැලක් ඉදිරි පිට නැවතුණෙමු. එය නියොන් ආලෝකයෙන් වර්ණවත් වී තිබුණි. "ලයිෆ් බයිට් - ඉන්ටර්නෙට් කැෆේ"

"ලොස් ඇන්ජලීස්වල සිද්ධවෙන හැම දෙයක් ගැනම දන්න හාදයෙක් මෙතැන හිටියා ෂිගාරෝ. මිනිහා දන්නවා යෝජි ඉන්නේ කොහෙද කියලා. නැත්නම්, ෆාන්ස්වර්ත්ට කියන්න පුළුවන් වෙයි ෂිගාරෝ කොහේද කියලා."

"ෆාන්ස්වර්ත්!" හීරෝ වෙහෙස දනවන සිනාවකින් යුතුව ඇසුවේය. " ඒ නම ඉන්ටර්නෙට් කැෆේ එකක මැනේජර් කෙනෙකුට හොඳ වැඩියි."

"එහෙමද?" කියමින් මම දොර විවෘත කළෙමි. "ඒත් හිත හොඳ මිනිහෙක්. මම මෙහෙ වැඩ කරද්දී මිනිහා මා ගැන උනන්දු වුණා."

"ඒත් ඔයා මෙහෙ වැඩ කළේ සතියයි!" වෙහෙස මදක් පහ කරමින් හීරෝ කීවේය.

"ඊටත් අඩුයි, ඇත්තටම........" සුසුමක් සමග කී මම ඔහුගේ අත අල්ලා ගතිමි.

"ඔයා ෆාන්ස්වර්ත් කියන හාදයා ගැන හොඳින් දන්නවාද?" මාව ආපසු අදිමින් ඔහු ඇසුවේය. සැහැල්ලුවෙන් හැසිරුණද අනපේක්ෂිත බැරෑරුම් ස්වරයක් ඔහුගේ හඬෙහි ගැබ් වුණි.



www.sinhalaelibrary.com

"එයාව හම්බවෙනතුරු ඉන්නකෝ" ඔහුට සමීප වෙමින් මම කීවෙමි.

මගේ නිසට යටින් ඇඟිල්ලක් තැබූ හීරෝ මගේ හිස එසෙව්වේය.

"මම ඔයාට කියලා තියෙනවා හැරන්ගේ තත්ත්වය" ඔහු "මම ඔයාට කියලා තියෙනවා" මගේ කෙස් රොදක් මුහුණෙන් ඉවතට පිසිමින් කීවේය. "අපේ මගේ කෙස් රොදක් මුහුණෙන් ඉවතට පිසිමින් කීවේය. "අපේ සම්බන්ධය වැරදීමක් කියලා මම හිතන බව ඔයා දන්නවා. මම ඒක එයාට කිව්වා." කී ඔහු මොහොතක් ඉවත බැලුවේය. "එයා මම හිතාගෙන හිටි කෙනා නෙවෙයි." ඔහු කල්පනාබරිතව කීවේය.

"මම දන්නවා" මම කීවෙමි. "මට එයා මුලින් හමු වෙද්දි එයා නපුරු කෙනෙක් කියලා මට තේරුණේ නැහැ."

හීරෝ මගේ හිස පිරිමැද්දේය. "මටත් එහෙමයි."

අපි වෙළඳ සැලට ඇතුළු වූවෙමු. මට මතක තිබූ ආකාරයටත් වඩා එය පාළුවට ගොස් තිබුණි. විදුලි පහන් දැල්වීමට හෝ කෙනෙකු කරදර වී නොතිබුණ අතර කවුන්ටරය මත නොසේදූ පිඟන් කෝප්පද, කුණු භාජන පිරී ඉතිරී ගොස්ද තිබුණි. ඇතුළත වූ පරිගණක තිර හිස්ව තිබූ අතර මුද්‍රණ යන්ත්‍ර අසල කොළ ගොඩ ගැසී තිබෙනු දැක මට කලකිරීමක් ඇති වුණි. මිගාරෝ එහි නොවීය.

"ෆාන්ස්වර්ත්?" මම හඬ නගා කතා කළෙමි.

උපැස් පැලඳි සුදුමැලි මුහුණක් කවුන්ටරය පිටුපසින් මතු වුණි. අසරණ ෆාන්ස්වර්ත්, අලුත් මෝස්තර ගැන කිසිදු හැඟීමකින් තොර වූ ඔහු විශාල හෙඩ්ෆෝනයක් පැලඳ අමුතු කාම්යෙකුගේ වෙස් ගෙන තිබුණි.

"ෆාන්ස්වර්ත්, මේ මම" මම අත දිගු කරමින් කතා කළෙමි.

"හෙ-න්-හෙවන්?" ඔහු හෙඩ්ෆෝනය ගෙල වෙත අදිමින් ගොත ගැසුවේය. "මො-මොනවාද ඔයා මෙහෙන් කරන්නේ?"



චකිතයක් දැනුණ විට ෆාන්ස්වර්ත්ගේ ගොත ගැසීම වඩාත් නරක අතට හැරෙයි. කවුන්ටරය ඉදිරියට ගිය මම රතු ස්ටූලයක් මත වාඩි වුණෙමි.

"අර කවුද?" හීරෝව හිසෙන් දක්වමින් ෆාන්ස්වර්ත් ඇසීය.

"මම හීරෝ. හෙවන්ගේ යාළුවෙක්."

හීරෝ ෆාන්ස්වර්ත්ට අත දිගු කළ විට එය ගන්නට මෙන් මොහොතක් සිටියද ඔහු කවුන්ටරයේ පසුපසට ගියේ හීරෝව නොසලකමිනි.

"මෙයත් අර අයගේ කෙනෙක්ද?" බියත්, පිළිකුලත් දනවන බැල්මකින් හීරෝ දෙස බලමින් ඔහු මගෙන් ඇසුවේය. "යාකුස්!"

"ඇත්තෙන්ම නැහැ" මම කීවෙමි. "යාකුස් කෙනෙක් නොවෙයි."

"ඔ-ඔම කොහොමද විශ්වාස කරන්නේ?"

"මම ඇත්ත කියන්නේ" මම ඔහු දෙස සෘජුව බලමින් කීවෙමි. "ඇත්තෙන්ම, මම හොයන්නේ මිගාරෝව "කෙළින්ම කාරණයට බසිමින් මම කීවෙමි.

මුව වෙතට අත එසවූ ෆාන්ස්වර්ත් නියපොතු හැපුවේය. "ඔයා කොණ්ඩය කපලා" අවසානයේ ඔහු චෝදනා කරන ස්වරයකින් කීවේය. හදිසියේම ශබ්දවාහිනී යන්ත්‍රවලින් සංගීත හඬක් නැගුණ අතර උඩ පැන්න ෆාන්ස්වර්ත් ශබ්ද පරිපාලන යන්ත්‍ර ඇති කුටියට දිව්වේය. මා අසලම ස්ටූලයක වාඩි වූ හීරෝ මගේ කනට ළංවී කතා කළේය.

"අපූරු චරිතයක් වගේ"

හිස සැලූ මම ඔහුගෙන් තොරතුරු ලබාගත හැකි හොඳම ක්‍රමය ගැන සිතුවෙමි. සංගීතය නැවතුණ අතර ඔහු නැවත කවුන්ටරය පසුපසට ආවේය.



www.sinhalaelibrary.com

"මම වැඩක් කර කර හිටියේ" ඔහු කරමක ශෙන්තියෙන් කතා කළ බව පෙනුණි.

"මෙතැන හුඟක් නිදහස් වගේ" අවට හැරී බලමින් ඔහු කිසිදු ව්‍යාපාරයක් සිදු නොවන බව පෙනී, ඔහු ශෝන්ති ගැනීමට එය හේතුවක් විය හැකි බව මම සිතුවෙමි.

"ෂිගාරෝ මට ඔයා ගැන හැමදේම කිව්වා." ෆාන්ස්වර්ත් සැකමුසුව බලමින් කීවේය.

"ෂිගාරෝ?" මා ඇසූ අතර ඔහු හිස සැලුවේය.

සුසුමක් හෙළූ මා ඔහුගේ ඇස දෙස සෘජුව බැලීමට උත්සාහ කළද එය අපහසු විය. නිතර ඔහු ඉවත බලමින් මග හැරියේය.

"මට කනගාටුයි, ෆාන්ස්වර්ත්. ඒ වේලාවේ මම කරදරයක වැටිලා හිටියේ. ඔයාවත් කරදරේ දාන්න මට වුවමනා වුණේ නැහැ."

ලෝකය පිළිබඳ පුළුල් දැනුමක් තිබූ ෂිගාරෝට රහස් හෙළි කිරීමේ, එතරම් දැනුමක් නොතිබූ ඔහුට කිසිවක් නොකියක් ඔහු කළ බිඳී පුංචි කමක් සේ ඔහු සැලකුවා විය හැක.

"මො-මොනවද ඔයාට දැනගන්න ඕනැ? ෂිගාරෝ ඇතස මිහින් වගේ. සති ගණනකින් මෙහාට ආවේ නැහැ."

ඉවසිලිවන්ත වන ලෙස මට බල කරගනිමින්, සෑම කොහෙතුරෙම සීමාවක් ඇති නමුත් ෆාන්ස්වර්ත්වැනි මොළොක් මිනිසෙකු දරදඬු වීම ගැන මම පුදුම වීමි.

"මට දැනගන්න ඕනැ ජෝජ් යකමුරා කියන මිනිසා ඉන්නේ කොහේද කියලා. මිනිහාගේ මැරයෝ මාව මරන්න හැදුවා [illegible]. මට දැනගන්න ඕනැ ඇයි කියලා."

"ඉන්ටර්නෙට් එකෙන් විස්තර ගන්න බැරිද?" ඔහු නොවිස්සුම් සහගත ලෙස ඇසුවේය. "මම කියන්නේ, ඒ තරම් බලවත් මිනිහෙක් නම්."



"මොනවා කියනවාද?" මම කෝපයෙන් කීවෙමි. අසුනේ ඇතිළුණු ෆාන්ස්වර්ත් දෙතොල තද කරගත්තේය. "මිනිහා කොහේ හිටියත්" මම සිදුවූ හානිය යථා තත්ත්වයට පත් කිරීමට උත්සාහ කරමින් කතා කළෙමි. "මුරකාවල් මැද්දේ ඇති, ෂිගාරෝ තැන නොදන්නවා වුණත් දන්න කෙනෙක් හොයාගන්න එයාට පුළුවන්."

"හොඳයි, ම-මම හුඟක් මෝඩයි හෙවන්, මම නිකම්ම ඉන්ටර්නෙට්කාරයෙක් විතරයි. ජ-ජපන් මාෆියාකාරයෙක් නොවෙයි. ක-කනගාටුයි මට ඔයාට උදව් කරන්න බැහැ" කී ඔහු හෙඩ්ෆෝනය හිස මතට තල්ලු කර ආපසු හැරුණේය.

"ෆාන්ස්වර්ත්, නවතින්න" කී මම කවුන්ටරය පසුපසට රිංගුවෙමි. ඒත්තිය වෙතට ඔහුව තල්ලු කළ මම කෙඳිරුවෙමි. "අපිට කොහෙදී හරි පෞද්ගලිකව කතා කරන්න පුළුවන්ද?" ෆාන්ස්වර්ත් හදිසියේම මෙල්ල වී මගේ මුහුණ වෙතට නෙත් යොමු කළේය. "අතන වගේ" හිසෙන් උපකරණ කුටිය පෙන්වමින් මම කීවෙමි. හුස්මක් ගෙන ෆාන්ස්වර්ත් හිස සැලුවේය. "යමු" කී මා ආපසු හැරී බලද්දී හීරෝ එය අනුමත කරමින් හිස සැලුවේය.

"මේ අහන්න" මෙලොව සිටින එකම පුද්ගලයා ඔහු පමණක් බව ඔහුට දැනෙන්නට සලසමින්, කුටිය තුළට ගිය පසු මම කතා කළෙමි. "මම මෙහෙන් ගිය දවස මතකද? උදව්වක් ඕනැ නම් කියන්න කියලා ඔයා කිව්වා. හරි, දැන් මට ඕනැ. ඔයාට විතරයි උදව් කරන්න පුළුවන් මට.... ම......" ෂිගාරෝගේ නම මග හැරීමට මම උත්සාහ කළෙමි. "......අවශ්‍ය දේ හොයාගන්න, අනේ, ෆාන්ස්වර්ත්"

ෆාන්ස්වර්ත් අකුළන පුටුවක වාඩි වී ඝන උපැස් යුවළින් විශාල වූ දෙනෙතින් බලූ පැටවෙකු සේ මා දෙස බැලුවේය. තවත් පුටුවක් ඇදගත් මම ඔහු අසල වාඩි වුණෙමි.

"අපොයි, හෙවන්. මට ඔයාට උදව් කරන්න ඕනැ. ඒත් මේ යකූසා මිනිස්සු දරුණුයි. ෂිගාරෝ ඉන්න තැන මම ඔයාට කිව්වා කියලා දැන ගත්තොත් මටත් හුඟක් කරදර තමයි."

"මේ බලන්න" බටහිර සංස්කෘතිය වැලඳ ගත් අයෙකු මිම ගැන සතුටින් මම කතා කළෙමි. "මෙක මම සම්පූර්ණ කරන්න ඕනෑ වැඩක්. මෙක රහසිගතව කරන්නේ. මේ මිනිහා එක්ක තියෙන්නේ අවසාන සටන!"

"එතකොට, හීරෝ කියන හාදයා ඔයාගේ සුර දූතයාද?" ෆාන්ස්වර්ත් දුකින් ඇසුවේය.

මම ලැජ්ජාවෙන් රතු වුණෙමි. "ඔයා වැරදියට හිතන්නේ. මට ඇත්තටම ඔයාගේ උදව් ඕනෑ."

ෆාන්ස්වර්ත් ගෙල වටා වූ හෙඩ්ෆෝනය ඒ මේ අත හරවන්නට විය. මම ඔහුගේ බාහුවට අත තැබුවෙමි. ඔහු හොරකුරක් දීමට ආසන්න බව මට හැඟුණි.

"පයනියර් එකට එහා පැත්තේ බර්නාඩ් මාවතේ. මට හැන හරියටම නිච්චි නැහැ. ඒත් ගොඩනැගිල්ලේ කෙළවරේ රතු දොරක් ඇති. මම එක සැරයක් මිනිහාව ගිහින් දාන්න එතැනට ගියා."

"ෆාන්ස්වර්ත් - ඔයා හුඟක් හොඳයි" මම ඔහුව වැලඳගෙන උඩ පැන්නෙමි.

"හෙවන්" ෆාන්ස්වර්ත් ශාන්තව කතා කළේය. "ඔ-ඔයා හිතනවාද ඔයාගේ වැඩය ස-සම්පූර්ණ වෙයි කියලා. එතකොට අපිට නිද-නිද......"

"නිදහසේ ඉන්න" මම සම්පූර්ණ කළෙමි. "මම ඉක්මන වෙලාම එන්නේ ඔයාව හොයාගෙන" කී මම දොර වෙතට දිව්වෙමි.

"යන්න, යන්න" කී ඔහු පරිගණක කුටිය වෙතට හැරුණි. පිටත හීරෝ ජනේලයෙන් මාවත දෙස බලා සිටියේය.

"ඉන්න තැන දැනගත්තාද?" ඔහු ඇසුවේය.

"හරි" මම සැහැල්ලුවෙන් කීවෙමි. "ලිට්ල් ටෝකියෝ - වැඩි දුරක් නැහැ."



පදික වේදිකාවෙන් රථය මාවතට පිවිසෙත්ම ෆාන්ස්වර්ත් සමග මගේ තවත් ගනුදෙනු නැති බවට මම තීරණය කළෙමි. එය මට දුකක් විය. ඔහුගෙන් මට තවත් ප්‍රයෝජන තිබිය හැක. නමුත් අපි දෙන්නාටම අපෙන් ප්‍රයෝජනයක් නැත.

මම ෆාන්ස්වර්ත් මගේ සිතින් ඉවත් කළෙමි. මේ මිගාරෝ ගැන සිතීමට කාලයයි.

මිගාරෝගේ නවාතැනට අප ළඟා වන විට, අඳුර වැටී තිබුණි. ලිට්ල් ටෝකියෝ නම් ඒ පෙදෙසට මම බියවීමි. මගේ හදාගත් පියා හමුවීමට පැමිණි අවස්ථාවේ මම භයංකර අත්දැකීම ලබා තිබුණි. එහිදී මා හදා වඩා ගත් පියා, කොනිෂි, හමුවීමට මා එකඟව තිබූ අතර අවතාලක අප සිටින අතරේ ඔහුට එල්ල වූ හදිසි තියුණු ප්‍රහාරයකින් සිහි නැති වූ ඔහු, මාස කිපයක් ගතව තිබුණද තවමත් පියවි සිහිය ලබා නැත.

මා රථයේ විදුරුව පහත් කරද්දී කරදිය මුසු රාත්‍රී සීත සුළඟින් රථය පිරෙන්නට විය. වෙරළකදී අත්විඳිය හැකි නැවුම් සුවඳක් එහි නොවූ අතර වෙරළේ කුණු වූ යම් යම් දේවල්වලින් දුර්ගන්ධය වාතයට මුසුව තිබුණි. සිරුර සලිත වූ මම ජනේලය වසා දැමුවෙමි.

"මොකද?" මාගේ උරහිස වටා අත යවමින් හීරෝ ඇසුවේය.

"නිකම්" පොඩි දරුවෙකු නොවීමට උත්සාහ කරමින් මම කීවෙමි.

"හිතන්න. හෙවන්" හීරෝ දොස් නැගුවේය. "ඔයා හොඳින් දන්නවා. ඔයාගේ ඉව පාවිච්චි කරන්න ඕනෑ වෙලාව, දැන් ඔයාට අමුත්තක් දැනෙනවා නම් ඒකට හේතුවක් තියෙනවා."

ජනේලයෙන් ඉවත බැලූ මම මොහොතක් කල්පනා කළෙමි.

"මොනවා හරි අමුත්තක් තියෙනවා" අවසානයේ මම කීවෙමි. "මේ පාරවල් පාළුයි. මට ඒක දැනෙනවා."



www.sinhalalibrary.com

හීරෝ හිස සැලුවේය. "මටත් ඒක දැනෙනවා. ඒත් මට අනතුරක් ඉව වැටෙන්නේ නැහැ."

මම තලෙ යලි ගැන්වීමි. "අනතුරක්ම නොවෙයි. ඒක අමුතු හැඟීමක්. වතිනයක් වගේ"

"මට තේරෙනවා" හීරෝ ආලෝක සංඥාවක් අසල වේගය බාල කරමින් කීවේය. "ඒක මේ අවට ජීවත් වෙන අයට එක හැඟීමක්. දකින, හැඟෙන, දැනෙන දේවල් ගැන හොඳට හිතලා බැලුවොත් මේ ඒ තරම් හොඳ පැත්තක් නොවුණාට තමන්ගේ වැඩක් බලාගෙන ඉන්න පුළුවන්."

"උසස් ප්‍රඥාව පාවිච්චි කරන්නේ කොහොමද කියලා මට ඒ තරම් විශ්වාසයක් නැහැ."

"ඒක ලොකු වගකීමක්. පංච ඉන්ද්‍රියන් දෙන තොරතුරුවලට අවධානය යොමු කරන තරමට හයවෙනි ඉන්ද්‍රිය හොඳින් පාවිච්චි කරන්න පුළුවන්." මම සිනාවක් නගා විහිළු කළෙමි. "හරි. දැන් දේශනයකට සවන් දෙන්න වෙයි කියලා මගේ ඉව කියනවා."

"මගේ දේශනයක්?" හීරෝ බැරෑරුම් බවක් මවා පෑවේය. "තමන්ගේ වට පිටාව ගැන කල්පනාවෙන් නොහිටපු සටන් කාරයෙක් ගැන කතාවක් තියෙනවා.........."

මම හඬ නගා සිනාසුණෙමි. "ඇත්තටම, හීරෝ - අපි එකට වැඩ කරද්දී මගේ වැඩය ඔයා නිසා හුඟක් පහසුයි කියලා මට තේරෙනවා."

"මම පිනැවට වැඩිය කතා කරනවා නම් ඒක කියන්න." හීරෝ මගේ අත මිරිකමින් කීවේය. "ඔයාගේ වැඩේදී, සැලසුම් ඔයාගේම එකක් වෙන්න ඕනැ."

"මම දන්නවා" කී මම අසුනෙන් සෘජුව වාඩි වුණෙමි.

මග දෙපස විදි ලාම්පු බොහොමයක් බිඳී තිබූ අතර ගොඩනැඟිලි ජරාවාස වී තිබුණි. ගින්නකින් නගින දුම් ගඳක් හැමෙද්දී මියන් මලලුන් වැනි සතුන් ඒ මේ අත දුවන බවක්



පෙනුණි. අවසානයේ අපි මිගාරෝගේ කාමරය ඉදිරිපිට නැවතුණෙමු. එහි වූයේ රතු දොරක් වුවද දූවිලි හා කුණු තට්ටුව නිසා එහි වර්ණයක් හඳුනා ගැනීම දුෂ්කර විය.

බිත්තිවල තීන්ත පැල්ලම් ගැලවී ගොස් තිබුණි. මුත්‍රා සුලයේ ගන්ධයට මුසුවූ පිළුණු ගෙදත් දුම්කොළ දැවුණු ගඳක් එකට මුසුව හැඟුණි. පාරවට ගිය තරප්පුව නැග තුන්වැනි මහලට ගොස් අපි කොරිඩෝව ඔස්සේ ගියෙමු.

"කවුද ඔතන" ඇතුළතින් ගැට හඬක් නැගුණි. එය මිගාරෝගේ හඬදැයි මට කිව නොහැකි විය.

"හෙවන් තෝරෝ" මම හඬ නැගුවෙමි. කාමරය තුළ කෙනෙකු ඒ මේ අත යන හඬක් ආ පසු හදිසියේම දොර තිබුණු හඬක් නගමින් විවර වුණි. මිගාරෝගේ දෙනෙත් මා වෙත එල්ල වුවද ඇතුළත අඳුර ඉතා දැඩි වූ බැවින් මට ඔහුගේ මුහුණ හඳුනා ගත නොහැකි විය.

"මොනවාද ඕනැ?" වියළි බැරෑන්ඩි හඬකින් ඔහු ඇසුවේය.

"මම හෙවන්. ඔයා එක්ක කතා කරන්න ඕනැ."

හීරෝ වෙත එල්ල වී තිබූ මිගාරෝගේ දෙනෙත නැවත මා වෙතට එල්ල වුණි. හීරෝ වෙතට හිස දිගු කරමින් ඔහු කතා කළේය. "මේ කවුද?"

"මේ මගේ යාළුවා, හීරෝ" මා පිළිතුරු දුන් අතර මිගාරෝ නොසෙල්වී හීරෝ දෙස බලා සිටිද්දී මම නැවත කතා කළෙමි. "එයාගෙන් ප්‍රශ්නයක් නැහැ."

දොර හඬ නගා වැසුණි. මවිත වූ මම අඩියක් ආපසු තැබුවෙමි.

හීරෝ මුවින් හඬක් නගමින් සුසුමක් පිට කළේය. තත්පරයකට පසුව දොර නැවත වේගයෙන් විවෘත වුණි.

"ඇතුළට එන්න" මිගාරෝ සෙමින් කීවේය. "දොර



www.sinhalaelibrary.com

විනගෙන එන්න."

අප අඳුරු කාමරයට ඇතුළු වූ පසු මගේ ඇස් අඳුරට හුරුවීමට මොහොතක් ගත්තේය. එහි වූයේ පිටත පහනින් ගලා ආ ආලෝකය පමණි. ජනේලයට පිටුපා සිට ගෙන සිටි ෂිගාරෝගේ සෙවණැල්ල බියජනක හැඩයක් ලෙස පෙනුණි.

"මේක තමයි මගේ මාලිගය" ඔහු කීවේය. "මෙතැන ආරක්ෂිතයි." කී ඔහු ජනේලයට හේත්තු වී දුම්වැටි පැකැට්ටුවක් අතට ගත්තේය. දැල්වුණ ගිනි කූරින් මොහොතකට ආලෝකවත් වූ ඔහුගේ මුහුණ මට දැකගත හැකි විය.

මම හදිසි හුස්මක් ඇද ගතිමි. ෂිගාරෝ සිහින් පුද්ගලයෙකු වූවද, අවසාන වතාවට මා ඔහු දකිද්දී සිටියාට වඩා බොහෝ සේ කෙට්ටු වී ඇති බවක් පෙනුණි. නොසැලකිලිමත් ලෙස රැවුල වැවී තිබුණ අතර පෙරදී නවීන විලාසිතාවට සකසා තිබූ කොණ්ඩය දික්ව වැවී එල්ලා වැටෙද්දී ඔහු කලබලයෙන් මෙන් කෙස් රොද තනින් පිටුපසට තල්ලු කරන්නට විය. ඔහුට කුමක් සිදුව තිබුණේ දැයි මට අනුමාන කිරීමට හෝ නොහැකි විය.

"ඔයා කොණ්ඩය කපලා" උනන්දුවකින් තොරව කී ඔහු දුම් උගුරක් ඇද්දේය.

"ඔයා වැරිලා වගේ පේනවා." මම කීවෙමි.

"ඔව්" ඔහු කීවේය. "ඉතින්, ඇයි මේ හදිස්සියේ ආවේ?"

ලණ්ඩ් ඔට්ටක්හිදී මට හමුවූ විනෝදකාමී චරිතය කොහේ ගිහින්ද? සමාජ ශාලාවලදී දුම්වැටියට වඩා වැඩි යමක් පාවිච්චි නොකර තිබූ බව මට කියා තිබූ ඔහු හොඳින් ඇඳීමට පැලඳීමට පුරුදුව සිටියේය. මා ඉදිරිපිට වාඩි වී සිටියේ අබලන් වූ මිනිසෙකි. දුම්වැටිය පොඩිකර දැමූ ඔහු තවත් දුම්වැටියක් දල්වනු මම බලා සිටියෙමි.

"ජනේලයක් ඇරියාට කමක් නැද්ද?" ෂිගෙරෝ ඇසුවේය.

දුමින් පිරී කාමරය ඇඩි ලෙස උණුසුම්ව තිබුණි. දුර්ගන්ධයෙන් පිරී වූවද, රාත්‍රී සුළඟ වැදීමට මම මහත් සේ ආශා



කළෙමි. පති ගණනාවක් පිටතට නොගොස් තිබුණද ඔහුගේ කාමරය සනෙකු ලැග සිටි තැනක් මෙන් විය.

"ඒකට කමක් නැහැ." දෙවුර සලා කී ඔහු මා දෙස බැලුවේය. "ඉතින් දැන් මොනවාද දැනගන්න ඕනෑ?" ඔහුගේ හඬෙහි අවඥා සහගත ස්වරයක් ගැබ් විය.

නැගිට ගත් ෂිගෙරෝ ජනේලයක් විවෘත කළ පසු මම සීතල සුළඟින් හුස්මක් ඇද ගතිමි.

"මට තොරතුරක් දැනගන්න ඕනෑ. මම හිතනවා ඔයාට පුළුවන් මට උදව් කරන්න." අවශ්‍ය දේ හැකිවම නොකිව නුවණට හුරු බව මම ඉවෙන් මෙන් දැන ගතිමි. ඔහුගේ තත්ත්වයත්, මා ගිය පසු සිදුව තිබූ දේවලුත් මුලින් දැන ගත යුතු බව මට වැටහුණි.

"කෝගෝ කෙනෙකුට මගෙන් දැන ගන්න ඕනෑ මොනවාද?" ෂිගාරෝ මගේ නම පිළිකුලින් උච්චාරණය කළ හඬක් නැගුණි. මොහොතකට මගේ උගුර හිර වුණි. ෂිගාරෝගෙන් එවැනි විසකුරු ප්‍රතිචාරයක් මම බලාපොරොත්තු වී නොතිබුණෙමි. පාන්ස්වර්ත්ගේ මුහුණ දෙස බැලූ පරිදි මම ඔහු දෙස බැලීමි. ඇස් කුඩාව, දෙකොල් ඇඹරුණ ඔහුගේ මුහුණින් ඉවතට ගත් ඇස් මම කාමරය පුරා යවා බැලූ අතර එය කිසිම මිනිස් වාසයකට සුදුසු නැති බව දැක ගත්තෙමි. එක් වරම ඔහු මා ගැන පමණක් නොව මගේ පවුලේ සෑම දෙයම දැනගෙන ඇති බව මට අවබෝධ වුණි.

"මම හිතන්නේ සිද්ධවෙන දේවල් ගැන ඔයා මොනවා හරි දන්නවා." මම කියන්නට වීමි.

ෂිගාරෝ හඬ නගා දුම් උගුරක් පිට කළේය. "මම දන්නේ නෑ. මම මොකවත් දන්නේ නැහැ. මට දැනගන්න ඕනෙත් නැහැ."

ඔහු බියවී ඇති බව මට හැඟුණි. යකුසා මැරයින්ට කළ හැකි හෝ ඔහුට කර තිබූ දේවලට ඔහු බියවී ඇති බව මට කල්පනා වුණි. කෝගෝ පවුලේ උදවිය ගැන ඔහු කලබල වී

ඇති බව පෙනුණි.

"තමන් නැහැ, මිගාරෝ" මම ඔහුව සැනසුවෙමි. "මේ ලොස් ඇන්ජලීස්වල ඉන්නවා කියලා කවුරුවත් දන්නේ නැහැ. අපිට ඔයාගේ කාලයෙන් විනාඩියක් දෙන්න ඊට පස්සේ අපි යනවා."

"මගේ විනාඩියක් හුඟක් ලොකු දෙයක්." යි ඔහු කුසිතව "මගේ විනාඩියක් හුඟක් ලොකු දෙයක්." එහි පියන නැති බීර ටින් එකක් ගෙන බිත්තියට හේත්තු වූයේය. එහි පියන ගලවා දිගු උගුරක් බී පිටි අත්ලෙන් මුව පිස දමා ඔහු කතා කළේය. "කෝගේ කියන්නේ නරක ආරංචියක්. මට ඔයාලත් එක්ක කිසිම ගනුදෙනුවක් අවශ්‍ය නැහැ."

"මොකක්ද ඔයා කියන්නේ?" මම තරමක් බල කර ඇසුවෙමි.

"ඇයි එහෙම අහන්නේ?" මම මෝඩයෙක් කියලාද හිතන්නේ? ඔයා ගැන ඔත්තුවක් දෙන කෙනෙකුට ලොකු මුදලක් දෙනවා කියලා මම දන්නේ නැහැ කියලා හිතනවද?" පලබල වූ තරහකින් යි ඔහු කාමරය සිසාරා බැලීය. "යෝජ් යකමුරාට කෝල් එකක් දීලා මිනිහාගේ යකුසා මිනිස්සු කීප දෙනෙක් මෙහාට එවන්න කියලා නොකියන්නේ ඇයි කියලා දන්නවද? ඔයාව අල්ලලා දීලා ලැබෙන සල්ලිවලින් මට මේ ජී දුගෙන් උඩට එන්න හොඳටම පුළුවන්" තම ජංගම දුරකථනය ගත් මිගාරෝ එය මතට ඇඟිල්ලක් එසවීය.

මම හීරෝ දෙස බැලුවෙමි. මා වෙනුවෙන් ගෙවන මුදල මට අලුත් පුවත්තියක් විය. දෙබැම ඉහළ කළද හීරෝ කතා නොකළේය. එමෙන්ම ඔහු බිය වූ බවක් පළ නොකළේය.

"ඇයි යෝජ් යකමුරාට මාව අවශ්‍ය?" මා බලාපොරොත්තු වූවාට වැඩි යමක් මිගාරෝ දන්නවා ඇතැයි සිතී මම ඇසීමි.

මිගාරෝ ඇස් කැරකෙව්වේය. "ඔයා විහිළු කරනවාද? මිනැම කෙනෙක් දන්නවා කෝගේ, යකමුරා ගෙවරය, ඔයාගේ තාත්තා මිනැට්ට වඩා ඉදිමුණා යෝධයෙක් වගේ එයා කල්පනා කළා ඔයාව යෝජ්ගේ පුතාට බන්දලා දෙන බවට මිනිහා රවටලා.



බොරු තින්ජා සටනකින් යකමුරාලා ඔක්කොම එක පැරේ ඉවර කරලා දාන්න. ඒත් එයා සැලසුම් කරපු විදිහට වැඩේ සිද්ධ වුණේ නැහැ. පුතා මුලින් මැරුණා. දැන් එයත් මාගෙට මැරිලා" ඔහු නිශ්ශබ්දයක් නිහඬ විය. "ඔයා මේ හැමදේම දන්නවා."

මම දත මිට මොළවා ගතිමි. මිගාරෝට අනුකම්පා කරන තරමටම ඔහු මගේ පියාට චෝදනා කිරීමෙන් මම කෝපාවිෂ්ට වූයෙමි. නින්ජා ප්‍රහාරය ගැන මා මගේ පියා ගැන සැක කළ නමුදු යම් වන විට එයට ඔහුගේ සම්බන්ධයක් නැති බවට මම බොහෝ සේ විශ්වාස කරමි. යම් යම් ගැටලු තිබුණද, තම පුතාවූ ඔහිකෝට ඔහු මහත් සේ ආදරය කළේය.

"කවුද මෙවා කියන්නේ?" මම තදින් ඇසීමි. "මිනිස්සු හිතන්නේ එහෙමද?"

"මිනිස්සු?" මිගාරෝ අවඥාවෙන් ඇසුවේය. "පත්තරේ ආපු එකක් නොවුණාට සිද්ධ වුණ දේ මිනිස්සු දන්නවා. මම දන්න විදිහට, යෝජ්ට ඔයාව අල්ලාගන්න ඕනෑ තරම් හේතු තියෙනවා."

"මේ අහන්න, මිගාරෝ" මම හඬ පාලනය කරගනිමින් කීවෙමි. "යෝජ් යකමුරා දන්නවා නින්ජලාව සටනට එව්වේ කවුද කියලා. මගේ තාත්තා නොවෙයි. ඒකයි මට එයාට කතා කරන්න ඕනෑ. ඔයා කියන තරමට ඔයා යකුසා මිනිස්සු ගැන දන්නවා නම්, මෙක සමථයකට පත් කරන්න මම යන්න ඕනෑ කියන එක ඔයා දන්නවා. ඔහිකෝ නැහැ. කොනිෂිට යන්න බැහැ. ඉතුරු වෙන්නේ මම විතරයි. ඉතින් මට එයා ඉන්න තැන දැනගන්න ඕනෑ."

බියර් ටින් එක පසෙක තැබූ මිගාරෝ තවත් දුම්වැටියක් දල්වා ගත්තේය. "මම මොනවාටද ඔයාට ඒවා කියන්නේ?" ඔහු වුම්බාගෙන ඇසුවේය. ඔහුගේ මුරණ්ඩු විමක් මට ඉව වැටිණි. ඔහු මට එරෙහි නොවූවද කෝගේ අප සම්බන්ධ කතා ගැන ඔහු විශ්වාසයක් තබන බව පෙනුණි. ඊට අමතර යමක් මිගාරෝ සතුව තිබූ නමුත් ඒ කුමක් දැයි මට වටහා ගැනීමට නොහැකි විය.



www.sinhalaelibrary.com

"වෙඩි යකඩුරා මැරුණා." මම කීවෙමි. "එයාව මරද්දි අපි එතැන හිටියා. ඔයේ මල්ලිව මැරුවෙත්, තාත්තාට සිහි නැති වෙන්න ගැහුවෙත්, දැන් මාව මරන්න හදන්නේත් කවුරු හරි එකම කෙනෙක්. යෝජිගේ පුතා මැරුවේ කවුද කියලා එයා දැනගන්න ඕනෑ නැතෑ කියලා ඔයා හිතනවාද? කවුරුත් දන්න දෙයක් කියන්න හෙටත් කෝගේ එද්දි, පොඩි තොරතුරු දෙන්න මිගාරෝ වගේ කෙනෙක් බැහැ කිව්වා කියලා දැනගත්තොත් යෝජි නැතිව වෙයි කියලා ඔයා හිතනවාද?, කොහේද යෝජි ඉන්නේ?"

එය ඔහුගේ අවධානය ඇද ගත්තේය. නැගිට ගත් ඔහු ජනෙල් තිරය පහතට ඇද්දේය. "සිද්ධ වුණ දේ මට කියන්න." ඔහු කීවේය. "සමහර විට තොරතුරක් තියෙන්න පුළුවන්."

හැකි පමණ ඉක්මනින් මා කතාව කී අතර ඉඳ හිට කීරෝ යම් පැහැදිලි කිරීමට හෝ අමතක වූ දෙයක් කීමට මැදිහත් විය. කතාව අතරතුරේදී නිසලව සිටීමට නොහැකි වූ මිගාරෝ කුඩා කාමරය තුළ ඇවිදිමින් ලාච්චුවලත්, පොත් ගොඩවල් අතරත් තිබූ ඉටිපන්දම් එකතු කරමින් ඒවා එකින් එක දල්වන්නට විය. අවසානයේදී, ඒ මේ අත වැනෙන ආලෝකයෙන් හා සිනිඳුරු දුවුණු ගඳින් කාමරය පිරුණි.

කාමරයේ තිබූ දුර්වර්ණ වූ, දූවිලි බැඳුණු හා අපිලිවෙළක් සියල්ල කියා පෑවේ මා මුලදී දුටු මිගාරෝ දැන් එහි නැති බව ඔහුගේ කමිස අතට වැසී තිබූ. මා මීට පෙර දැක නොතිබූ පච්චයක් දැකීමෙන් ඔහු මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී ඇති බව මම අනුමාන කළෙමි. ඔහු යකුසා මිනිසුන් හා ගනුදෙනු කරන බව හා ඔහු ඒ ගැන උනන්දුවෙනවා මෙන්ම බියෙන් සිටින බව මම දැන ගතිමි.

"ඔයාගේ වාසගම මොකක්ද, මිගාරෝ?" මම ඇසීමි.

"ඕනූරා" ඔහු කොඳුරා කීවේය.

"ඔයාගේ තාත්තාගේ නම සදාකුසෝ" කලකට ඉහත අමතකව තිබූ යමක් සිහිවීම ගැන සතුටුව මම කීවෙමි. "ඔ



මනකයි, මම කුඩා කාලයේ එයා අපිව බලන්න ඇමරිකාවේ ඉඳලා ආවා."

මගේ දෙනෙත හා ගැටුණු මිගාරෝගේ දෙනෙත් වේදනාවෙන් පිරී තිබුණි. "එයා දැන් නැහැ. උන් එයාව මැරුවා."

මම හිස සැලුවෙමි.

"එයා යකුසා මිනිසෙක් නොවෙයි!" මිගාරෝ උස් ස්වරයෙන් කෑගැසුවේය. "එයා නිකම් ව්‍යාපාරිකයෙක්. උන්ට ඕනෑ වුණේ එයාගේ පිටරට හිණුම් හරහා සල්ලි යවන්න ක්‍රමයක් විතර. එයා ඒක කරලා දුන්නා. ඒත් උන් රහස එළිවෙයි කියන බයට එයාව මරලා දැම්මා. පාහර මිනීමරු යක්කයෝ!"

"මට කනගාටුයි, මිගාරෝ" මම කීවෙමි. "ඇත්තටම මාව විශ්වාස කරන්න. ඔයාට වගේම මටත් ඒ අය එක්ක තවත් ගනුදෙනු අවශ්‍ය නැහැ."

"කෝගේ කෙනෙක් කෝගේ කෙනෙක්මයි. ඔයාලා ඔයාලට ඕනෑදේ කරගන්නවා; කවුරු මැරුණත් කමක් නැහැ." කඳුළු සඟවා ගැනීමට මිගාරෝ බිත්තිය දෙසට හැරුණි.

"ඔයාට පැටලිලා මිගාරෝ. ඔයා දන්නේ නැහැ මොනවාද, කාවද විශ්වාස කරන්න ඕනෑ කියලා." මගේ වචන කොහෙන් එනවා දැයි නොදැනුණද, මා ඉදිරියේ සිටින, හඳුනා ගැනීමට පවා අසීරු මිනිසාගේ දුකින් පිරි හදවතට මම සමීප වී සිටියෙමි. "තාත්තා මැරුව පළිය ගන්න යකඩුරාලා ඔයාට උදව් කරයි කියලා ඔයා හිතුවාට, උන් ඔයාවත් මරලා දමයි."

"ඔයා මොනවාද කරන්නේ?" හදිසි හුස්මක් ගත් මිගාරෝ දෙනෙත් මහත් කරගත්තේය. ඔහු ඇඟිලිවලින් හිසකෙස් තරමේ අල්ලා ගත්තේය. "එක පැත්තකින් අපි ඉන්න එක ඔයාට කරදරයක්. අනික් පැත්තෙන් ඔයා ගැන කතා කරන්න අපි ඉන්න එක සතුටක්. ඔයාට මේ දේවල් කළේ කවුද කියලා කියන්න පුළුවන්කමක් තියෙනවා. ඒත් ඔයා බයයි"

"නවත්වන්න! නවත්වන්න!" මිගාරෝ කෑගැසුවේය.

කිවේය. "හෙවන් ඒ ඇති" හීරෝ අවවාදාත්මකව කීවේය.

"හෙවන් ඒ ඇති" හීරෝ අවවාදාත්මකව කීවේය.

මම මුව නදින් වසා ගතිමි. මා තුළ විවෘත වූ යම් ප්‍රභවයක් නැවත වැසුණි. මා නළේ කුමක්ද?

"පැටලිලා, හැමදේම පැටලිලා" ඔහු ප්‍රතිරාවය කළේය. "ඔයා මගේ ඔළුව ඇතුළට රිංගුවා!"

මා දෙස ඇඹි බැල්මෙන් බලා සිටි හීරෝ දෙස මම බැලුවෙමි. කුමක් කියන්න දැයි මම නොදන්නෙමි. මා සතු මානසික ශක්තියකින් මිගාරෝගේ වට පිටාව තේරුම්ගත් බව පිටස්තරයෙකු දැනගන්නවාට මම නොකැමති වීමි. මිගාරෝ හොඳටම බියවී සිටි අතර එය මගේ වැරැද්දක් විය.

"මෙන්න" මේසය වෙත ගිය ඔහු කොළ කැබැල්ලක් හා පැනක් සොයාගෙන, යමක් කුරුටුගා එය මා වෙතට දිගු කළේය.

"ඔයාට යෝජි හොයාගන්න පුළුවන් වෙයි. දැන් පිටවෙලා යන්න!"

"මිගාරෝ, මම"

"දැන් යන්න!" කෑගැසූ ඔහු බිත්තිය දෙසට හැරුණි.

හීරෝ මා නැගිට්ටවූ පසු මම වෙව්ලමින් කොරිඩෝව ඔස්සේ යන්නට වීමි. දැඩි නොසන්සුන් බවකින් මගේ පපුව කිරවෙද්දී තව එක මොහොතක් හෝ එම ගොඩනැගිල්ල තුළ දුර්ගන්ධය ආශ්වාස කළහොත් තරප්පු පෙළ මත මා මැරී ඇද වැටෙනු ඇතැයි හැඟුණි.

"හෙවන් නැගිටින්න!"

පිටතට පැන ගත් මම ඉතා රසවත් ලෙස නැවුම් වාතයෙන් පෙණහලු පුරවා ගන්නට වීමි. මා පිටුපසින් පැමිණි හීරෝ මගේ පිටට අත තැබුවේය. "ඔයාට කොහොමද?"

"ඒක ලොකු පීඩනයක්" මම කෙඳිරුවෙමි.



"ඔයාගේ ප්‍රශ්නෙට එක දොරක් ඇරුණා. සාමාන්‍යයෙන් කෙනෙකුට ඒ මට්ටමට එන්න අවුරුදු ගණනක් යනවා." කී ඔහු මා වටා අතක් යැවීය. මම ඔහුට තුරුලු වුනෙමි.

"හැම දෙයක්ම හොඳින් සිද්ධ වෙයි වගේ" මම කීවෙමි.

"ඔයාට ඒක හොඳට තේරේවි." ඔහු මා අගයමින් කීවේය. "හරි, කොහේද යෝජි ඉන්නේ?"

මම කොළ කැබැල්ල සාක්කුවෙන් පිටතට ගතිමි. "හොටෙල් බෙල් එයාර් ප්‍රභූ කාමර" එය කියවූ මට ජපන් බසින් "ගින්දර" යන්න ලියා තිබෙනු දැකිය හැකි විය. එම සංකේතයේ අරුත මට තේරුම් ගත නොහැකි විය.

"මොකක්ද ඒ?" මට නැගීමට දොර අරිමින් හීරෝ ඇසුවේය.

"මම බයයි" මම කීවෙමි.

"අපි මෙතැනින් පිට වෙමු." මගේ කම්මුලට තට්ටු කරමින් හීරෝ කීවේය. රථය පණ ගැන්වීමෙන් අනතුරුව, ඉක්මනින්ම අපි ලිට්ල් ටෝකියෝ වෙතින් පිටත් වීමු. "අපේ ගෙදර යමුද? අපිට පිරිසිදු වෙලා ටිකක් නිදාගන්න පුළුවන්. මේ විදිහට ගිහින් යෝජි හම්බවෙන එක හොඳ නැහැ, මම හිතන්නේ?"

"ඒක හොඳයි." මම කීවෙමි. හීරෝ ලිලී ප්ලේස්හි පිහිටි ඔහුගේ නිවස ගැන සඳහන් කරත්ම මට අපහසුවක් ගෙනෙන අමුතු හැඟීමක් දැනුණි. එහෙත් ඔහු කී පරිදි අපට විවේකයක් අවශ්‍ය විය.

"හිත කරදර කරගන්න එපා, හෙවන්" ඔහු මෘදුව කීවේය. "අලුත් හැකියාව කරදරයක් වගේ පෙනුණට, ඒක ප්‍රගුණ කරද්දී තේරෙනවා ඒකේ වටිනාකම."



www.sinhalaelibrary.com

# 3.

හීරෝගේ නිවස ඉදිරිපිට පදික වේදිකාවට පා තබත්ම යළි හාපුරක ඉවත් මට ඇති වුණි. නිවස ඉදිරිපිට මම නැවතුණෙමි. හීරෝ ආපසු හැරී මා දෙස බැලුවේය.

"ඔයාට ඒක දැනෙනවා?" සැලකිලිමත් බැල්මකින් යුතු ඔහු ඇසුවේය.

"අද්භූත දෙයක් ඒත් මම හිතන්නේ කවුරුත් නැහැ. නරක දෙයක් සිද්ධ වෙලා තියෙනවා වගේ."

"කොහොමද ඔයා දන්නේ?" මා දිරිමත් කරමින් ඔහු ඇසුවේය. මම සවන් දුන්නෙමි. මට ඇසුණේ රැහැයියන්ගේ හඬත්, තරාමයකින් වතුර වැටෙන හඬත් පමණි. මම දෙවුර සැලීමි. "මට අමුතු ගැස්මක් දැනෙනවා."

"සමහර විට, මේක නිසා" කී හීරෝ නිවසට යන පාරේ වැටී තිබූ කළු අත් මේසයක් ඇහිඳ ඔසවා පෙන්වූවේය.

"ඕ, ඔව්" මම කුළැටි ලෙස සිනාවක් පෑවෙමි.

"ඔයාට ගඳක් එනවාද? පුරුට්ටු ගඳක් වගේ? මෙන්න..." නැඹුරු වූ හීරෝ පාර පසෙක වූ තණකොළ අතර තිබූ පුරුට්ටු කොටයක් අහුලා ගත්තේය. "ටිකකට කලින් කවුරු හරි ඇවිදින් තියෙනවා."

"මට ඒක ගඳ ගැහුණා"

"නැහැ, ඔයාට ඒක අහුවුණා. ඒකයි ඔයාට හදිසි ගැස්මක් දැනුණේ. දැකපු දේවල් හැඟයට දැනුණ දේවල් ඔයා හරියට තේරුම් ගන්නේ නැහැ" අත් මේසයත්, පුරුට්ටු කොටයත් බිමදමා කලිසමේ දාන පිස ගනිමින් හීරෝ මා පසුපසට පැමිණියේය. "මොනවාද දැනෙන්නේ" ඔහු කෙඳිරුවේය. "අවශ්‍ය වුණොත්



සටන් කරන්න පුළුවන් තරමට ඔයා විවේක ගත්තාද?"

"ඔව්" එතරම් විශ්වාසයක් නොවූවද මම කීවෙමි.

"හොඳයි අපි මේ පැත්තෙන් යමු."

නිවස පසෙකින් වූ පඳුරු පිටිපසින් හා බිත්තිය ඔස්සේ අපි නිවසේ පිටුපස දෙසට ගියෙමු. ගැඹුරු හුස්මක් ගත් මම අපට පහර දීමට කිසිවෙකු නිවස තුළ නැති බවට මගේ සිත තුළ නැගෙන හැඟීම නිවැරදි වේවායි පැතුවෙමි.



හීරෝ දොර අසලට පැන එක්වරම දොර විවෘත කළේය. එක්වරම නිවස තුළට පැන ගත් අපි දෙදෙනාම සූදානම් ඉරියව්වකින් සිට ගතිමු. ඇතුළත දැඩි අඳුරේ ගිලී තිබුණි. තද දම් පැහැ විරූපී සිතුවම් මගේ දෙනෙත් ඉදිරි පිට මැවෙන්නට විය. කිසිදු සලකුණක් දැකීමට බැරි තරමට අඳුර දැඩි හෙයින් මම සිත ශාන්ත කර ගතිමි. යමක් මගේ පයට පෑගී කැඩුණි. කුඩා නිවස පාළුවට ගොස් තිබුණි. හීරෝ එක්වරම විදුලි පහනක් දැල්වූවේය.

"ඕ" මම හුස්මක් ඇද ගතිමි. සෑම තැනකම අවුස්සා දමා



www.sinhalaelibrary.com

තිබුණි. සෝපාවේ කොට්ට කපා දමා, රෙදි බිම දමා, කැබෙ... බිඳෙන දේ අඩුතර, සෑම දෙයම පෙරලා දමා තිබුණි - ඉත... ඇඩි සෙදිසියක්.

"මොනවාද හොයලා තියෙන්නේ?" නිදන කාමරයට එබෙමින් මම ඇසුවෙමි. හීරෝ භාවනා කරන තැන වූ මල් ආසනය විනාශ කරදමා තිබූ අතර රතු ජපන් ඉටිපන්දම් ගෙඩි පුරා විසිරුවා දමා තිබුණි.

"මම හිතන්නේ මොකවත් හොයලා නොවෙයි." හීරෝ හිස වැනුවේය. "පණිවිඩයක් දෙන්න හදලා තියෙන්නේ."

ඇසේ කඳුළු මතුවන අතරේ මම මල් ආසනයේ කැබලි ඇහිදීමට අත දිගු කළෙමි.

"හෙවන්" හීරෝ අනතුරු ඇඟෙව්වේය. මම අත ආපසු ගතිමි.

"වුවමනාම දෙයක් හැර කිසි දෙයක් අල්ලන්න එපා."

"ඇයි? උන් ගිහින්"

"ඒක අනාරක්ෂිතයි. පුළුවන් තරම් ඉක්මනට අපි මෙතැනින් පිට වෙන්න ඕනෑ. මම වුවමනා දේවල් ටිකක් ගන්නම්."

"අපි හෝටලයකට යනවාද?" අසරණ බවක් දැනී මම ඇසීමි.

"එහෙත් අවදානම්" හීරෝ කීවේය. ඔහු මොහොතක කල්පනා කළේය. "කොහොමද අහසුට? අපිට නාගන්න පුළුවන් අනිත් බෙල් එයාර් හෝටලයට යන්න ඉස්සර අපිට පුළුවන් අපේ ඊළඟ පියවර සැලසුම් කරන්න."

"ඒක හොඳයි" මම කීවෙමි. හීරෝ අවුල්ව තිබූ ඇඳුම්වලින් කීපයක් තෝරන්නට විය. හිස බිත්තියට හේත්තු කරගත් මම සුසුමක් හෙළිමි. මට මහත් දුකක් දැනුණි. ලිලී ප්ලේස්හි මේ නිවස කදිම නිදහස් තැනක්ව තිබුණි. කුඩා සැප පහසු තැනක් මෙය විවාහ උත්සවයෙන් පසු මා නැවතී සිටි පළමු ස්ථානයයි.

හීරෝ හා මා මෙහි නැවතී සිටි සති කීපය දුෂ්කර වුවද ඉතා විස්මයජනක විය. ඔහිකෝගේ මරණයත්, සිදුව තිබූ සියල්ලත් ගැන සැලකීමේදී, මෙය මට අලුත් ලොවක ආරම්භයක්ව තිබුණි. දැන් එම අලුත් ලොව කඩා වැටෙමින් තිබුණි.

"මට කනගාටුයි හීරෝ"

"මොනවාටද?" ඔහු ඇසුවේය. "යමු" ඔහු රෙදි බෑගය ගනිමින් කීවේය.

"මේ ගැන" කී මම අත දිගු කළෙමි. "මේ වගේ තැනක් හදාගන්න මොන තරම් අමාරුද කියලා මම දන්නවා. දැන් ඔක්කෝම විනාශයි."

හීරෝ නැවතුණේය. "හෙවන්, එහෙම හිතන්න එපා. මේවා තේරුමක් නැති දේවල් ආයෙත් ගන්න පුළුවන්. මේ ගෙය අනිත් පැත්ත පෙරළලා තිබුණත්, අපි හිටියා වගේමයි. කිසි දෙයක් වෙනස් වෙලා නැහැ."

"ඒත් දැන් ඔයාට ගෙදර එනවා කියලා එන්න තැනක් නැහැ." මම පොඩි දරුවෙකු මෙන් වැලපුණෙමි.

"අපි දෙන්නා එකතුවෙලා ගෙදරක් හදා ගනිමු." හීරෝ ඉවත බලමින් කීවේය. මගේ හදවත තිගැස්සුණි. ඔහු පසුපසට ගිය මම ඔහුගේ උරහිස අල්ලා ඔහුට තුරුලු වීමි. එය මා නොදැනුවත්ව සිදුවූ අතර ඔහු ප්‍රේමවන්තයෙකුට වඩා නියම සමුරායිවරයෙකු ලෙස මා කරකවා ඔහු ඉදිරියට ගත්තේය. ඔහු ඇඹරී මා වෙතින් ඉවතට පියවරක් තබද්දී මම ඉක්මනින් ඇසිපිය හෙළුවෙමි "ඇයි, වැරැද්දක් වුණාද?"

"නැහැ" කී ඔහු මගේ මුහුණ ස්පර්ශ කළේය. "ඒත් මෙතැන තවත් ඉන්න හොඳ නැහැ." ඔහු වටපිට බැලුවේය. "යන්න කලින් අපිට අවශ්‍ය තව එක දෙයක් තියෙනවා."

නිදන කාමරයේ ඇඳුම් අල්මාරිය අසල පුටුවක් තැබූ ඔහු ඇතුළත වූ දේවල් පහතට දමමින් යමක් සෙව්වේය.

"ඔය මොනවාද කරන්නේ?" මම ඇසීමි. මෙය නිවස

පිරිසිදු කිරීමට කාලය නොවීය. පුටුවට නැගගත් ඔහු අල්මාරිය ඉහළ ඇත කෙළවරට අත දිගු කළේය. පහළට බසිමින් ඔහු සිනාමුසුව කතා කළේය. "හිතපු තරම් හොඳට උන් සෝදිසි කරලා නැහැ."

මරණයේ කෙඳිරිම මගේ පවුලේ සංකේතය විවාහෙත්, ජපානයෙන් පැන එද්දී මා රැගෙන විත් තිබූ සමුරායි අසිපත.

"උන්ට මේක අහුවෙලා නැහැ," මම හීරෝගේ අතින් එය ප්‍රවේසමින් ගනිමින් කීවෙමි. එය දරා සිටීම මහත් සහනයක් විය. එහි මිට අතෙහි හිරවෙද්දී සෑම දෙයක්ම යහපත් වන බව අසිපත කියනවාක් මෙන් මට දැනුණි.

"අපි මේක ගෙනියමු," හීරෝ කී අතර මම හිස සැලීමි. අසිපත උකුලේ තබාගෙන, කවිච්චියේ වාඩි වූ මම ඔහු ඇඳුම් හා දත් බුරුසුවක් රෙදි බෑගයට දමාගන්නා අයුරු බලා සිටියෙමි.

පිටව යාමට අපි ඉක්මනින් සූදානම් වීමු. අසාමාන්‍ය නිහඬ බවක් පැතිරුණි. එක්ව ජීවිතය ගොඩනැඟීම පිළිබඳව මා සිතමින් සිටිය අතර ඔහුද එයම කළා විය හැක.

"ලෑස්තිද?" හීරෝ ඇසීය.

"ඕනෑම වෙලාවක" මම සිනාසුණෙමි.

අසපුවේ වෙරි දැවයෙන් නිමවූ දොර තුළින් අප ඇතුළුවත්ම සීතල සුළං රොදක් මගේ මුහුණේ ගැටුණි. දොරකඩ එල්ලන ලද සුළඟට වැයෙන කුඩා සීනු අපගේ පැමිණීම නිවේදනය කළේය. පිළිගැනීමේ කවුන්ටරයට ළඟා වූ මම සඳුන් සුවඳැති නැවුම් වාතය උනන්දුවෙන් ආශ්වාස කළෙමි. පළමුව එහි පා තැබූ මොහොතේ සිට අසපුව මට ක්ෂේම භූමියක්ව තිබූ අතර හීරෝගේ නළලේ වූ රැළි සැහැල්ලුව හා තද වූ හකු ඇට ලිහිල්ව තිබෙනු දුටු ඔහුද එම හැඟීම තිබූ බව පෙනුණි.

"ඔ, දෙවියනේ මෙයාලා!" සෑමී, අසපුවේ සිටින මගේ ප්‍රියතම උපදේශිකාව කොරිඩෝව ඔස්සේ දුව ආවාය. ඇගේ තඹවන් කොණ්ඩය හිස මුදුනට කර බැඳ තිබූ අතර ඇගේ අළු



පැහැ දෑස දිලිසුණි. "කරදරයක් නැද්ද?"

මා දැක සතුටු වීමට අඩුම තරමේ එක් අයෙකු හෝ සිටීම ගැන කෘතගුණ පූර්වකව මම සෑමීව වැළඳ ගතිමි. ඈ උස්, ශක්තිමත්, මහා සිරුරකින් යුතු වූවාය.

"අපි හොඳින්" මම කීවෙමි. "අපිට ඇඟ පත සෝදාගන්න ඕනෑ."

මුහුණේ සිනාව මිලානව යන අතරේ සෑමී අප දෙස බැලීය. "ඔයාලා කරදරයකද?" මා දෙසත් අනතුරුව හීරෝ දෙසත් බලමින් ඈ ඇසුවාය. "ඔ, මෙයා කොණ්ඩය කපලා......"

"ඒක හොඳයි, සෑමී" හීරෝ කීවේය. "අපි ගැන කරදර වෙන්න එපා. අපි සතියක් හමාරක් ඉඳලා යනවා. ඒකට කමක් නැහැ, නේද?"

"අපොයි, කමක් නැහැ," සෑමී කීවාය. ඈය උරහිස මතින් ආපසු බැලුවාය. "ඒත් කැරන් මෙහේ ඇවිදින්....."

මට වඩාත් ප්‍රියජනක නොවූයේ කැරන්ගේ දසුනයි. අප හමුවූ අවසාන අවස්ථාවේ තත්ත්වය නරක අතට හැරුණ නමුත් ඒ හීරෝ කැරන්ගෙන් වෙන්වීමට පෙරයි.

"මම කියන්නේ, ඔයාලා දෙන්නා එකට ඉන්නවා දැක්කොත් කලබලයක් ඇති වෙයි කියලා." සෑමී සමාව අයදින්නාක් මෙන් අප දෙස බැලුවාය. "මට අදාළ නැහැ. එයා කිව්වා ඔයාලා දෙන්නා වෙන් වුණා කියලා."

හීරෝ හිස් බැල්මෙන් යුතුව හිස සැලීය. ඔහු තත්ත්වය මැන ගනිමින් සිටින බවක් පෙනුණි.

"මම ගිහින් නාගන්නම්. ඔයා කැරන්ට කියන්න අපි ඇවිදින් ඉන්නවා කියලා." මම කීවෙමි. සත්‍ය නම් හීරෝ මා පිළිබඳව ඔහුගේ හැඟීම් ප්‍රකාශ කළ වහාම කැරන් ගැන වූ මගේ ඊර්ෂ්‍යාව තුරන්ව ගොස් තිබුණි. සැබැවින්ම ඇය පිළිබඳව මට එක්තරා කනගාටුවක් දැනුණි. එහෙත් ඇයව දැකීමට මට අදහසක් නොවීය.

"සැලසුමක් වගේ" හීරෝ කීවේය.

"මම තුවා අරගෙන එන්නම්" කී සැමී කවුන්ටරයෙන්

"මම තුවා අරගෙන එන්නම්" පෙන්ම හීරෝට අත වනමින් ගියාය. ඇ පසුපස යාමට සූදානම් වෙන්ම හීරෝට අත වැනීමට අසපු නැරී බැලීමට යමක් මා පෙළඹුවේය. ලොකු වැය්දදකි.

"හලෝ හීරෝ" කැරන් දිගු පියවරින් කොරිඩෝව ඔස්සේ අප වෙතට එමින් සිටියාය. එවිටම, සැමී තුවා කිපයක්ද අතැතිව නැවත කවුන්ටරය අසල පෙනී සිටියාය. හීරෝ, කැරන් හා මා දෙස බැල්මක් හෙළූ ඇ ගල් ගැසුණාය.

"හ්ම්...... මට නුමාල කාමරය පිරිසිදු කරන්න තියෙනවා." තුවා කිපය මට දෙමින් සැමී එකිනයෙන් යුතුව කීවාය.

මා එහි සිටින බවක් හෝ නොතකමින්, කැරන් සෘජුව හීරෝ දෙස බැලුවාය. ඇය ගැන නොදන්නා කෙනෙකුට ඇය ඉතා සුන්දර කෙනෙකු ලෙස පෙනෙනු ඇත. එහෙත් ඇගේ පැහැපත් හම සුදුමැලිව තිබූ අතර දෙනෙත් යට කළුව තිබුණි.

"ඉක්මනට ආවද?" නාසයෙන් හඬක් නගමින් කැරන් ඇසුවාය.

"හෙලෝ කැරන්" හීරෝ කීවේය.

"මම නාගන්න යනවා." පොළොව පළාගෙන යාමට තරම් සිත් වී මම කීවෙමි. නින්ජාවරු හෝ ටිවල් ටෝකියෝහි මන්දුවා දුබලයම් ප්‍රශ්නයක් නොවීය. එහෙත් කැරන් දෙස එක්වරක් බැලූ පමණින් මගේ සටන් හැකියාව දියාරුව යයි.

"මා ඉන්න නිසා යන්න එපා." කැරන් මා දෙස නොබලමින් කීවාය.

ඉකියක් බලාපොරොත්තුව මා හීරෝ දෙස බැලුවද ඔහු ඉවත බලාගෙන සිටියේය.

"වෙනම කතා කරන්න පුළුවන්ද?" හීරෝ ඇසුවේය.

"ඒකට දැන් පුමාදයි." කියමින් කැරන් ඉදිරි මේසයට

හේත්තු වූවාය. "ඒත් මම කල්පනා කර කර හිටපු එක ප්‍රශ්නයකට උත්තර දෙන්න ඔයාට පුළුවන් වෙයි. හරියට වචනයක් දීලා නැතිව තියෙද්දී, මිනිහෙක් තමන් පස්සෙන් එන එක ගැන හෙවන් මොනවාද හිතන්නේ? රජිනක් වගේ ඔයාට සලකන්න පුළුවන් වුණත් එයා යන්නේ වෙන කෙනෙක් හොයාගෙන."

"ඔයාගේ හිත රිදිලා නම් කනගාටුයි. ඒත් අපි මේ ගැන කතා කරලා තියෙන්නේ" හීරෝ මෘදුව කීවේය.

"මගේ හිත රිදිලා නැහැ." කැරන් තපුරු හඬින් කීවාය. "ඒත් ඔයත් එක්ක හිටියොත් මේ සවින් ටෝකියෝ නම් හිත රිදවා ගනියි."

"ඔයා කොහොමද මා ගැන කියන්නේ?" තවදුරටත් කට වසා සිටිය නොහැකිව මම මැදිහත් වුණෙමි. මා නැති තැනකදී මෙන් මා ගැන කතා කිරීම මට දැරිය නොහැකි විය. "ඔයා කියන්නේ බොරු."

"බොරුවා?" වහාජ විමතියක් දක්වමින් කැරන් කීවාය. "කුමන්ත්‍රණ කරලා කපටි කමින් අනින් අයගේ කොල්ලෝ උදුරාගන්න බැල්ලියක් කියන එක බොරුවක්ද?"

"කැරන්" හීරෝ දැඩි හඬින් කෑගැසුවේය. "ඒ ඇති"

"මම කියන්නේ ඇත්ත." කැරන් පිම්බාය. "ඒකට මුහුණ දෙන්න බැරි නම් ඔයාගේ හුරතලාව අරගෙන මෙහෙන් පිටවෙන එක හොඳයි. ලැජ්ජා නැතිව මෙහාට ආවා. ඔය පාට කරපු කොණ්ඩය ඔයාට ගැළපෙන්නේ නැහැ. එයාගේ කැමැත්තටද අලුත් පෙනුමක් ගත්තේ?"

"ඒක පිළිගන්න බැහැ" හීරෝ සැරෙන් කීවේය. "මම ඔයාට සියට සියක් අවංක වුණේ නැහැ කියලා පිළිගන්නවා. ඒත් ඒකට හෙවන්ගේ කිසිම සම්බන්ධයක් නැහැ. අනික එයාට අපහාස කරන්න ඔයාට අයිතියක් නැහැ."

හීරෝ මා වෙනුවෙන් කතා කිරීම ගැන දැඩි සතුටක් දැනී උඩපැන නැටීමට තරම් මට සිත්වුණද මම නිදහස්ව ඇමරිකාවට පැමිණි කෙනෙක් හෙයින් උමතු ලෙස හැසිරීමට අවශ්‍ය නොවන

බව සිහි නඟා ගතිමි. සත්‍යය සවන් මරපතළ කරගැනීමට මා අවශ්‍ය නොවීය.

"හොඳයි හීරෝ, දැන් ගෙවන්ට හොඳ ආරක්ෂකයෙකු ඉන්න නිසා ඔයා ඒක හොඳින් කරනවා නේද?"

"දැන් නතර ඉවරයි." ආපසු හැරෙමින් හීරෝ කීවේය.

"ඉවර නැහැ." මුහුණ රළු කරගත් කැරන් කෑගැසුවාය. "මට උත්තරයක් ඕනෑ."

"මොන වගේ උත්තරයක්ද?" ඇයට මුහුණ දෙමින් හීරෝ ඇසුවේය. "මට වෙන කියන්න දෙයක් නැහැ. මම කනගාටුයි කියලා තිබ්බේ...."

"කනගාටුයි කියලා මදි!" කැරන් බාධා කළාය.

"මම යනවා." මම කීවෙමි. එය මට අදාළ නොවන බ

පෙනුණි.

"ඒක හොඳයි!" කැරන් එක්වර කීවාය. "මෙතැන කාටවත් ඔයාව ඕනෑ නැහැ."

දත් මිටි සපමින්, දැව ලෑලි ඇතිරුණු ගෙබිමට රවා මම උගුලක පැටලීමෙන් වැළකෙන ලෙස මටම බල කර ගතිමි. මෙතරම් ශක්තිමත් බලගතු ගැහැනියක් නොමෙරූ දැරිය ලෙස කටයුතු කිරීම ප්‍රශ්නයක් විය. මා බොළඳ බව සැබෑවක් වුවද ඇඟිල්ලක් හෝ නොසසවා කැරන්ට ඕනෑම පිරිමියෙකු ආකර්ෂණය කරගැනීමට හැකියාව තිබුණි.

"පොඩි ළමයෙක් වගේ හැසිරෙන්න එපා." හීරෝ කීවේය. "ඔයා බොරුවට මැදි වෙනවා."

"මට මේ විසාර එපා." කී ඈ මා දෙස රවා බලා, ගමින් ළඟ ගෙන වේගයෙන් පිටතට ගියාය.

හීරෝ නිහඬව සිටියේය. ඔහුට කුමන ආකාරයේ ආවේගයක් ආවද ඔහුම එය පාලනය කළ යුතු බව මට හැඟුණි. නාන කාමරයට වැදුණු මට ජල මලින් වැටුණු



උණුසුම් දිය දහර මැද නිදා ගැනීමට තරම් සහනයක් දැනුණි. කැරන්ගේ නපුරු වචනවලින් නැඟුණු පලු හැඟීම ජලයේ සේදෙන්නට මම ඉඩ හැරියෙමි. හීරෝ මිලට ගෙන තිබූ අලුත් ටී-ෂර්ට්යකින් හා සැමීගෙන් ලැබුණු කලිසමකින් සැරසුණු මට මහත් නැවුම් සුවයක් දැනුණි. අම්හිරි මතකයන් අමතක කර, යෝජ් යකමුරා හමුවීම වැනි වැදගත් දේ ගැන මම සිත යොමු කළෙමි. කොරිඩෝවට පැමිණි මම හීරෝ කුමන කාමරයක ඇතිදැයි සෝදිසියෙන් පියවර තැබීමි. වැසුණු කාමරවලින් එන විද්මයානුකූල හඬවලින් පුහුණුවීම් නොකරන බව දැනගත් මගේ සිරුර සැහැල්ලුවට පත්විය.

"මම මෙහේ" හීරෝ තුනේ කාමරයක සිට මට කතා කළේය. මම එතුළට වැදී දොර වැසුවෙමි.

"සිද්ධ වුණු දේ ගැන මට කනගාටුයි" මාව සමීපයට ඇද ගනිමින් හීරෝ කීවේය. ඔහු කෙරෙන් සබන් සුවඳක් නික්මිණි.

"ඒක අමතක කරන්න" මම හුස්මක් ගෙන කීවෙමි. "ඔයාගේ පෙනුම සම්පූර්ණ වෙන්න කොණ්ඩය අලුත් විදිහට කපන්න ඕනෑ?"

"අලුත් විදිහ?" ඔහු ව්‍යාකූල විය. ඔහු ජනප්‍රිය සංස්කෘතියෙන් දුරස්ථව සිටියේය. සැබැවින්ම එය මීට පනස් වසරකට පෙර තිබී නැවත කරළියට පැමිණි එකකි.

"ඒක ඕනෑ නැහැ." ඔහුගේ ශක්තිමත් බාහුවල පහස විඳිමින් මම කීවෙමි. මගේ මුහුණ එසවූ ඔහු දෙනෙතට එබී බැලුවේය.

"පරණ දේවල් මගේ හිතේ නැහැ. කැරන් ගැන මට කනගාටුයි. මම එයාට අවංක වෙන්න උත්සාහ කළා. ඒත් මම ඔයාට හැමදාම අවංකයි."

"මම දන්නවා." කී මහු දත් ආපසු ගත්තේය. මම සිම වාඩි වූ විට මා අසලම වාඩි වූ ඔහු මගේ උරහිස වටා අතක් යැවීය.

"ඔයා ලැස්තිද?" ඔහු මගේ මුහුණ දෙස බලමින් ඇසුවේය.
"සටන් කරන්න නෙවෙයි. ඉගෙන ගන්න දේවලට"

මම ඔහුගේ මුහුණ දෙස සැලුව බැලුවෙමි. හදිසියේම මගේ දෙනෙත් ඉදිරිපිට මගේ පසුගිය ජීවිතයේ දර්ශන දිස්වන්නට විය. මගේ සුන්දර ළමාවිය - මා අනෙක් ළමුන්ට වඩා වෙනස් බවත් මගේ පියා මටත් සහෝදරයාටත් මේ ලෝකය කුඩා බව කියා දී ... හා සොහොයුරන්ට පවුලට මරණයේ සෙවණැල්ල ඇතුළු වීමට පෙර ... එය කොතරම් සාමකාමී ජීවිතයක් වුණිද? මගේ පවුල වෙනුවෙන් ... පුතුනම් ඉටු කිරීමේදී මට ශක්තියක් වීමට හීරෝ මා අසල සිටීමට කැමති වීම කොතරම් අරුමද? ඔහු කිසිවිටක දුර්මුඛ වූයේ නැත. දැන ගැනීමට අකමැති දෙයක් වුවද මා පසුපස පන්නන්නේ කවුදැයි දැන ගැනීමට මා සූදානම් විය යුතුය.

"හරි" මම හුස්මක් ගතිමි. සැමදා එක ලෙස මම සූදානම්ව සිටියෙමි.

"හොඳයි, අපි සූදානම් වෙමු." වහා නැගිටිමින් හීරෝ කීවේය.

මම ඔහුගේ අත අල්ලා ගතිමි.

*　　　*　　　*　　　*

බෙල් එයාර් හෝටලය සුවිශේෂ ස්ථානයක් විය.

"මේක උද්‍යානයක් වගේ" ගස් අතර වූ රථගාලකට මෝටර් රථය හරවද්දී මම කීවෙමි.

"ඔයා ගත කරන පොහොසත් ජීවිතේ හැටියට, මෙතැන දන්නවා ඇති කියලා මම හිතුවා."

"ඒක හීරෝ, මම ඒ තරම් පොහොසත් කෙනෙක්ද?" කී මම වේගයෙන් දොර වසා හෝටලය තුළට යන්නට වීමි. එහි පිළිගැනීමේ ශාලය මහා ධන කුවේරයෙකුගේ පෞද්ගලික නිවසක් වැනිය. එය මා දැක පුරුදු තැනක් මෙන් පෙනුණි. "මට හෙවන්" හීරෝ අවවාදාත්මකව කීවේය. "මේක ජේද් අර චිත්‍රපටියේ......" "පස්සේ කතා කරමු" "දැන් වටපිටාව ගැන



හිත යොමු කරන්න."

"මේක බොරු ආටෝපයක්" මම කෙඳිරුවෙමි.

"මොකක්ද?"

"නැහැ, නිකම්" මම අවට සිසාරා බැලීමි. ඉතා වටිනා හා සිත් ඇදගන්නා සුලු ස්ථානයක් වූ එහි පිළිගැනීමේ කවුන්ටරයේ සිටි මිනිසුන් දෙදෙනා නොසිටියේ නම් ඉතා සාර ස්ථානයක් විය.

මම හීරෝගේ බාහුවෙන් ඇල්ලීමි. "මේ දෙන්නාගෙන් අපිට කිසිම දෙයක් දැන ගන්න ලැබෙන්නේ නැහැ."

"ඒක ඇත්ත" හීරෝ පිළිගත්තේය. අපි හඬ නොනගා ඉදිරියේ වූ ගස් අතර අඳුරට ඇදුණෙමු. අවට වාතය මල් සුවඳින් බරව තිබුණි.

"කොහොමද ජෝජ්ගේ කාමරය හොයාගන්නේ?" විශාල ගෙලයන් දෙස බලමින් මම ඇසුවෙමි. තැන තැන වූ බංගලාවල විදුලි පහන් එළි දිස්වුණි.

"පුහු කාමර ලොකු ඒවා."

"ඒ වගේම ආරක්ෂාවත් ඇති."

"අපිට රිංගලා යන්න වෙයි." කී හීරෝ අඳුර තුළට ඇදුණි. කුමන මාවත්වල යන්නේ දැයි මතකයේ රඳවා ගැනීමට වෙහෙසෙමින් මම ඔහු පසුපසින් අඳුරු සෙවණැලි තුළින් ගියෙමි.

"අන්න තියෙනවා." හදිසියේම නැවතුණ හීරෝ කෙඳිරුවේය. මගේ මුහුණ ඔහුගේ පිටෙහි හැපුණි. නාසය පිස ගනිමින්, කොළ අතරින් බැලූ මට නිවසේ ඉදිරි කොටසේ ඒ මේ අත සක්මන් කරන විශාල ප්‍රමාණයේ අඳුරු සෙවණැලි දෙකක් දැකගත හැකි විය.

"ජෝජ් මෙහේ කියලා හිතනවාද?" මම ඇසුවෙමි. නිවසේ ජනේල අඳුරුව තිබුණි.



www.sinhalaelibrary.com

"අපි බලමු" දෙවුර සලා කී හීරෝ මාවතට පය තැබූ අතර මම ඔහු පසුපසට වීමි. ඔහු නිවස ඉදිරිපිට සිට ගත්තේය.

"අපි ආවේ යෝජි යකමුරා හමුවෙන්න" හීරෝ නිරායුධ බව පෙන්වීමට දෑත් ඔසවමින් කීවේය.

එතරම් නිසල වූ කළු රූ දෙක ඉණට අත යවනු මට දැක ගත හැකි විය. හීරෝද එය දුටු බව මම විශ්වාස කළෙමි.

"කොහොමද මෙතනට ආවේ?"

කළු රූ දෙක ආලෝකය වෙත පැමිණි විට ඔවුන් ජපනුන් නොවන බව දුටු මම පුදුම වීමි. යෝජි වැනි උසස් කෙනෙකු සාමාන්‍ය පරිදි විශ්වාසවන්ත පවුලේ සාමාජිකයින් ආරක්ෂාව සඳහා යොදා ගත යුතුය.

"මට ඕනෑ යෝජි යකමුරා හමුවෙන්න." මම හීරෝ ඉදිරියේ සිට ගනිමින් කීවෙමි.

මා ඉදිරියට ආ ආරක්ෂකයා මා දෙස හොඳින් බලා එක්වර හඬ නගා සිනාසුණේය. "මෙයාට යකමුරා මහත්මයා හමුවෙන්න ඕනෑලු, ජෝ" කී ඔහු උරපත්ත මතින් තම සගයා දෙස බලා කීවේය. ජෝ, අඩි හයයි අඟල් හයක් පමණ උස් වූ මිනිසා, ඉදිරියට පා තැබුවේය.

"හොඳයි. ප්‍රශ්නයක් නැහැ, ස්ටීවන්" ඔහු අවඥාවෙන් කීවේය.

"ඇයි මේ දෙන්නට ඇතුලට යන්න නොකියන්නේ?"

ඔවුන් නැවත සිනාසුණද මම නොසෙල්වීමි. දෑස පියාගත් ස්ටීවන් ඔහුගේ විශාල දෑත පපුව හරහා බැඳගත්තේය. බයිකී රිදී අත්පලඳනාවක් බැඳි ඔහුගේ කමිසයට යටින් පච්චා සලකුණින් විය. ඔවුන් යකමුරා පවුලේ යකුසා සාමාජිකයින්ද නැතහොත් කුලී ආරක්ෂකයින් දැයි මම කල්පනා කළෙමි. යෝජි තම ආරක්ෂාව සලසා ගැනීමට බැරි තරමට අසරණව සිටීද?

"ආව පාරෙන්ම ආපසු යන්න. යකමුරා මහත්මයා වැඩක්."



"ඇවිදින් ඉන්නේ හෙවන් තෝමස් කියන්න." මම කීවෙමි.

හදිසියේම සිනාව අතුරුදහන් විය. මා ග්‍රහණය කරගැනීමට මෙන් දෙදෙනාම ඉදිරියට ආවද හීරෝ මා ඉදිරියෙන් සිට ගත්තේය. "නවතින්න!" කුරුස්සකා තපුරු හඬකින් ඔහු කීවේය. "අපි මෙතැන නිරායුධයි. අපිට ඕනෑ යෝජි යකමුරා හමුවෙන්න. ගිහින් එයාට කියන්න."

ජෝ උගුර පාදුවේය. "මේ දෙන්නා බලාගන්න, ස්ටීවන්. මම ගිහින් මහත්මයාට කියන්නම්." ඔහු දොර පිටුපසට ගිය අතර ස්ටීවන් අපේ සිරුරු අතගා ආයුධ ඇතිදැයි සෝදිසි කළේය.

ජෝ නැවත දර්ශනය වුණි. දෙදෙනාම අපව නිවස තුළට කැඳවාගෙන ගියහ. කාමර අඳුරුව තිබූ අතර පිටවීමේ දොරටුව දැකගැනීමට අපහසු විය. ඇතුළත වාතය තෙතමනයෙන් යුතු විය. මගේ දෙනෙත් අඳුරට හුරුවූ පසු වීදුරු බිත්ති සහිත කාමරයේ විශාල ප්‍රමාණයේ ගෘහ භාණ්ඩ දැකගත හැකි විය. අනතුරක් ඉව වැටුණ මට කිසිදු හැඟීමක් ඇති නොවීය. එය කෙනෙකුගේ ගුහාවක් වුවද හෝටල කාමරයක ඇති සුව පහසුව පමණක් දැනුණි.

ස්ටීවන් කවච්චියක් දැක්වූ අතර අපි දෙදෙනා එක්ව වාඩි වුණෙමු. යාබද කාමරයෙන් අඳුරු සෙවණැල්ලක් මතුවූ අතර කුදු ගැසුණ රුව යෝජි යකමුරාගේ බව කම්පනයෙන් යුත් මට වැටහුණි. විවාහෝත්සවයෙන් පසු, ඔහු ඉතා වයසට ගොස් ඇති බවක් පෙනුණි. "ජෝ, ස්ටීවන්, ස්තුතියි. ඒ ඇති." ගැඹුරු බිඳුණ හඬකින් ඔහු කීවේය. ආරක්ෂකයින් පිටතට ගිය පසු ඔහු අප ඉදිරියේ වූ සැප පහසු පුටුවක වාඩි විය. බලාපොරොත්තු සුන්ව දුකට පත්ව සිටින බවක් ඔහුගේ ඉරියව්වලින් ප්‍රකාශ වුණි.

"මට මිනිස්සු දෙන්නෙක් නැති වුණා ඔයාව අල්ලන්න ගිහින්." ඔහු රළු හඬින් කීවේය. "දැන් ඔයා මගේ අතටම ඇවිදින්" පෙට්ටියෙන් සුරුට්ටුවක් තෝරාගෙන එහි කොන කපා දැමීමට ඔහු විරාමයක් ගත්තේය. "ඇයි මෙහේ ආවේ?"

"වෙඩිව මරාදැද්දී අපි හිටියේ එයා එක්ක." මම කීවෙමි.

"ඒක මම නොදන්නවා කියලා තිබුණාද?" දිගු ගිනිකූරක් ගෙන දල්වමින් ඔහු ඇසුවේය. ඔහුගේ ස්වරයෙහි හැඟීමක් ගැබ්ව නොවීය. "ඔයා ඇවිදින් තියෙන්නේ ඒ ගැන විතරක් කියන්න වෙන්න බැහැ."

"නැහැ" බොහෝ දිගු කලක් සතුරෙකු ලෙස සැලකූ මිනිසෙකු කෙරෙහි දුක සිතීම පිළිබඳව මා ගැනම පුදුම වෙමින් මම කතා කළෙමි. "මට ප්‍රශ්න තියෙනවා අහන්න. ඒක එයා දැනගන්න ඕනෑ, මම ටෙඩී ගැන හුඟාක් උනන්දුවෙන් හිටියා කියලා. සමහරවිට ඔයාට ඒක විශ්වාස නැතිව ඇති." ඔහු පුරුට්ටුව උරන අතරේ මම තදින් කීවෙමි. "පසුගිය මාස කිපයේදී, මා ගැන දැනගෙන හිටපු, මට විශ්වාස කරන්න පුළුවන් එකම කෙනා එයා විතරයි."

"එතකොට මේ යාළුවා?" ඔහු හීරෝ දක්වමින් ඇසුවේය.

"එයා වෙනස් කෙනෙක්" මම කීවෙමි. "අපේ උඩගු පවුල් දෙකම ටෙඩීවයි මාවයි පාවිච්චි කළේ එයාලට ඕනෑ දේවල් ලබාගන්න. අපිට සිද්ධ වුණ දේවල්වලට අපේ සම්බන්ධයක් නැහැ." දෙබැම ඔසවා දෙනෙත් කුඩා කරගත් යෝජි, හීරෝ දෙස බැලුවේය. යමක් කීමට සැරසුණද නැවත මුව වසාගත් ඔහු පුරුට්ටුව දෙස බලා සිටියේය.

"ටෙඩී නැතිව මට ඔයාගෙන් ප්‍රයෝජනයක් නැහැ." අවසානයේ ඔහු කීවේය. "ඔයා එන්න තිබුණේ මීට ඉස්සර"

"ඒත් මාව අල්ලන්න සල්ලි දෙන්නේ ඇයි? ඇයි ඔයාගේ මිනිස්සු මාව හොයන්නේ?" [illegible] ලෙස ව්‍යාකූලව ඇසුවෙමි.

"ඒවා කට කතා" මගේ වචන ප්‍රතික්ෂේප කිරීමට අත වනමින් යෝජි කීවේය. "මෙක්සිකෝවල විනාශය ආරම්භ වුණ වේලාවේ [illegible] පස්සෙන් ආව එක ඇත්ත. ඒ ආරක්ෂාවට. ටෙඩී නැතිව අපිට පවුලක් නැති එකේ කොහොමද මම ආපහු යන්නේ?" අපොයි, ටෙඩීගේ අම්මා එක්ක ජීවත් වෙන එක. හරිම දරුණු ගැහැනියක්. ටෙඩී අපේ එකම පුතා. තවමත් එයා විතරයි. මම එහෙම කියන්නේ මගේ මිනිස්සුන්ට තවම මිනිය හොයාගන්න බැරිවුණ නිසා."

"මට කනගාටුයි, යෝජි මහත්මයා." මම කීවෙමි "ටෙඩී මැරුණා කියලා මට විශ්වාසයි. මම දැක්කා එයාට වෙඩි වදිනවා." මගේ හඬ වෙව්ලුවද මම තදින් කතා කළෙමි. "එයා මිය ගියා. ඔයාගේ මිනිස්සු වෙන දෙයක් කියනවා නම් ඒ බොරු."

යෝජිගේ දෙනෙත් මොහොතක් තෙලියාවද ඔහු නොසැලී සිටියේය.

"අපි සැමූ තත්ත්වය සිතේ මවා ගන්නවා." හිස් කට හඬකින් ඔහු කිවද ටෙඩී මියගිය බව ඔහු විශ්වාස නොකරන බව මට කිව නොහැක. ඒ ගැන බල නොකිරීමට මම තීරණය කළෙමි. තමන් ආදරය කළ කෙනෙක් මියගිය විට ඇති වන හැඟීම මම දනිමි. [illegible] මිය ගොස් සති ගණනක් යනතුරු මම එය විශ්වාස නොකළෙමි. එහෙත් නින්ජා සටන්කරු ඔහුට කඩුවෙන් කොටනු මා දැක්කා පමණක් නොව ඔහු අවසන් හුස්ම හෙළුවේද මගේ දෑතෙයි.

"ඉදිරියට යන්නේ කොහොමද කියන එකයි ප්‍රශ්නය" යෝජි කීවේය.

"ඔයා තාත්තාට අවබෝධ කරවන්න ඕනෑ මගුල් උත්සවයේ සිද්ධ වුණ දේට මගේ මිනිස්සුන්ගේ සම්බන්ධයක් නැහැ කියලා." යෝජිගේ පුරුට්ටුව නිවී තිබූ අතර ඔහු එය නැවත දල්වද්දී ඔහුගේ ඇස්වටා හම එල්ලා වැටෙන බව මම දුටුවෙමි. යෝජිට අවශ්‍ය පණ අදින යකුසා රාජ්‍ය බේරාගැනීම බව මට ක්ෂණයෙන් අවබෝධ වුණි. තමා වැඩි කලක් ජීවත් නොවන බවත්, මරණයට පෙර පවුලේ පැවැත්ම සුරක්ෂිත කළ යුතු බවත් ඔහු විශ්වාස කළේය. දෙවුර පහළට එල්ලා ගත් ඔහුගේ මුහුණේ එය මැනවින් ලියවී තිබුණි. "මම කොහොමද ඒක විශ්වාස කරන්නේ?" අසුනේ සෘජුව වාඩිවෙමින් මම ඇසුවෙමි. අතීත සිදුවීම්වල දර්ශන ගලා ඒම වැළැක්වීමට මම උත්සාහ කළෙමි. "මාව පැහැර ගන්න හැදුවේ ඔයාගේ මිනිස්සු. එදා රෑ මා පස්සෙන් පැන්නුවේත් ඒ මිනිස්සු."

"ඔව්. පැහැර ගැනීම සැලසුම් කළේ මම. ඒත් ඝාතනය කරන්න ඕනෑ වුණේ නැහැ. සැලසුම් කරපු විදිහට මගුල සිද්ධ වෙන්නයි ඕනෑ වුණේ. ටෙඩී කියන්න ඇති සල්ලි ගැන"

"ඒත් පදින වෙඩිතැබෙද්දී මට පහරදුන්න මැරයෝ කවුද? වේගාස්වලදී පස්සෙන් ඇවිදින් මාව මරන්න හැදුවේ?" සියල්ල අසිතක තර මම බාධා කළෙමි. "පසුගිය දවස්වල මා පස්සෙන් පන්නපු බව ඔයා පිළිගන්නවා. ටෙඩී මට කිව්වා යුතුකම් ඉටු කොන්ත්‍රාත් ගැන ඔයා එයත් එක්ක කරමින් හිටියා කියලා."

පළමු වතාවට සංවාදය කෙරෙහි පූර්ණ උනන්දුවක් පෙන්වමින්, යෝජ් වකිතයෙන් පුටුව අසුනෙහි හරිබරි ගැසුණි. "ඒ මම නොවෙයි." ඔහු අවධාරණයෙන් කීවේය. "මගේ මිනිස්සුන්ගේ පහරදීම් ගැන මට ආරංචියි. ඔයාට තනියෙන් ආරක්ෂාවෙන්න බැරිවුණා නම් ඒ අය මැදිහත් වෙන්න තිබුණා. ලාස් වේගාස්වලදී පහර දුන්න නින්ජාගෙන් ගැලවෙන්න ටෙඩීට පුළුවන් වුණා කියලා මම විශ්වාස කරනවා. ඒත් ටෙඩී ගැන මම සැලකිරුණා. තාත්තා කෙනෙක් තමාගේ පුතා ගැන එහෙම සැලකිරෙන්නෙ නැද්ද?"

මම ඔහු වෙත දෑස් දැල්වූවෙමි. මහත් වූ දෙගනාවින් ඔහු මා දෙස බලා සිටියේය. ඔහු සත්‍ය කතා කරන බව මම විශ්වාස කළෙමි.

"එතකොට ඒ කවුද?" මම ඇසීමි.

යෝජ් දෙවුර සැලුවේය. "මම දන්නේ නැහැ. අපේ පවුල් එකතු වුණොත් උන්ව හොයාගෙන විනාශ කරන්න පුළුවන්."

"ඒත් පෙනෙන්නේ නැද්ද?" මම ඇසුවෙමි. "කෝලාහලේ විනාශ කරන්න හදන්නේ කවුද කියන එක හොයාගන්න ඔයා උදව් කළොත් මගේ තාත්තාට පවුල් අතර එකමුතුවක් ගැන නිතරම තුර කතා කරන්න දෙයක් නැහැ. ඒක ඔයා කරන ලොකු සේවයක් වෙයි." වෙනසකර මුහුණෙහි වෙනසකින් තොරව යෝජ් නිහඬව වාඩි වී සිටියේය. "අනිත් අතට" කතාව නැවතුණ තැන් අපට පිටවන ලෙස කියනු ඇතැයි සිතූ මම ඉක්මන් කළෙමි. "මම දන්නවා ඔයාට දැනගන්න ඕනෑ



කවුද ටෙඩීව මැරුවේ කියලා. මම විශ්වාස කරනවා ටෙඩීව මරපු මිනිස්සුම තමයි මගේ තාත්තාට පහර දුන්නෙත් මගේ සහෝදරයාව මැරුවේත් කියලා."

යෝජ් අතවූ ගිනිපෙට්ටිය ඒ මේ අත කරකවන්නට විය. එකට ගැටෙන ගිනිකූරු කාමරය තුළ අසාමාන්‍ය නිශ්ශබ්දතාව තුළ විස්මයානුකූල හඬක් නැගුවේය.

"ටෙඩී වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ නැද්ද?" අත්හැරීමට අකමැතිව මම ආයාචනා කළෙමි. මෙය සඳහටම අවසන් කිරීමට නම්, කිසි කලෙක නොවූ පරිදි, මටත් හීරෝටත් යෝජ්ගේ ආරක්ෂාව අවශ්‍ය බව මට අවබෝධ වුණි.

"සිද්ධ වුණ දේ සිද්ධ වුණා." අසුනෙන් මඳක් එසවෙමින් යෝජ් කීවේය. "මම කිව්ව විදිහට පවුල් අතර එකමුතුවකට ඔයාගේ තාත්තා කැමති නම්, ඉක්මනට මේ දේවල් සමථයකට පත් කරගන්න පුළුවන්. මම ඔයා නම් ඉක්මනට ජපානයට ගිහින් ගෙදර ආරක්ෂා වෙලා ඉන්නවා." යෝජ් පුටුවට පිම්බේය. මම ඔහුගේ අඳුරු මුහුණ සමීපව දැක ගතිමි. එවිට මම දුටුවේ මා මරා දැමීමට කවුරුන් පැමිණියද යෝජ් ඒ ගැන මහත් සේ සියව සිටින බවයි. හීරෝටද එය හැඟී ඇතිදැයි දැකගැනීමට ඉගෙම මගේ බැල්ම ඔහුගේ මුහුණට යොමු වුණද ඔහු හිස් බැල්මෙන් යුතු වූයේය. යෝජ් යකමුරාටද බලාපොරොත්තුවක් තබාගන්න දැයි සිතුණ විට මගේ ඇඟේ හිරිගඩු පිපුණි.

"තාත්තාට තවම සිහිය නැහැ" මම කෙඳිරුවෙමි. "මට කරන්න පුළුවන් දෙයක් නැහැ කියලා ඔයා දන්නවා."

"එයාට සිහිය නාවොත්, ඉක්මනටම පවුලේ ප්‍රධානියා හැටියට කවුරු හරි පත් කරාවි." යෝජ්ගේ ස්වරයේ දැඩි පුවම්නාවක් ගැබ් විය. "හොඳම කෙනෙක්ව අපි බලාපොරොත්තු වෙමු."

බියත්, අවිශ්වාසයත් දැරිය නොහැකි ලෙස නැගෙද්දී, තවදුරටත් යෝජ් සමඟ තර්ක කිරීමට මට ශක්තියක් නොවීය. පිටව යාමට මම නැගිට්ටෙමි.

"ඔයාගේ කාලය දුන්නාට ස්තූතියි." මම කීවෙමි. හීරෝ[illegible] නැගිටින හඬ මට ඇසුණ අතර දොර වෙතට යත්ම, ඔහුගේ ඇ[illegible] මගේ උරහිස මත පතිත වන උණුසුම මට දැනුණි.

"පොඩි හීරෝ යෙමොටෝ, දැන් ලොකු මිනිහෙක්" යෝ[illegible] අප පසුපසින් සිට හඬ නැගුවේය. මම වහා හැරවුණෙමි. හීරෝගේ නම ඔහු දැනගත්තේ කෙසේද? මා හීරෝ දෙස බලද්[illegible] ඔහුගේ අත මගේ උරහිසින් හෙමිට පහතට ඇදුණේය. ඔහුගේ හනු පේශීන් තද වන්නට විය.

"ඔයාගේ තාත්තා දැන් මා ළඟ වැඩ" විඩාපත් බවක් ගත්[illegible] තරමක් දරුණු ස්වරයකින් යෝජි කතා කළේය. එය ටෝකියෝ[illegible] සිට ලොස් ඇන්ජලීස් දක්වා බියගෙන දිවීමට හා හිගාරෝ ස්ව[illegible] සිර කුටියක සිරකර තැබීමට තරම් ප්‍රබල වූත් කට හඬ බව මා[illegible] හැඟුණි. "ඒක දැනගෙන හිටියාද?" යෝජි ඇසීය.

මම හදිසි හුස්මක් ගතිමි. හීරෝ කිසිවක් නොකියා මදා[illegible] අඩලට අත තැබීය. "ඔව්, මිනිහාට නරක කාලයක් ලබලා. ඒත් දැන් මිනිහා අපේ සංවිධානයට නැතිවම බැරි කෙනෙක්. පුතත් එකට කරනවා නම් මිනිහා හුඟක් සතුටු වෙයි. මොකෝ කියන්නේ, හීරෝ? කොහොමද යකුසාලා එක්ක වැඩ කරන්න ආවොත්? එතකොට මේ විකාර ඇමරිකන් සමාගමක් වැඩක් ගන්න පුළුවන්. දියුණු වෙන්න හිතුවොත් නරකද?"

හීරෝ දොර අගුලින් අත සෙමින් පහතට දැමුවේය. පිළිතුර කුමක්වේ දැයි අනපේක්ෂිතව මම ඔහු දෙස බැලුවෙමි. මේ[illegible] සැබෑවක්ද? මගේ කොරවය හීම් හීරෝ, ඔහුත් යකුසා ප්‍රමුඛ[illegible] ලැබූ අයෙක්ද? ඔහු මා රැවටුවේ දැයි හීතියක් නැගෙන්නට විය.

"ඔයා කැදිර වෙන්නේ අපේ පවුල් දෙක කෝගෝ [illegible] එක්ක ඔයාගේ පරණ කොන්තර ගැන නම්," යෝජි බල [illegible] කීවේය. "මේ කතා බහේදී ඔයාට තේරෙන්න ඕනෑ අපි මේවායේ අවසානයක් දකින්න හැර වෙන මොකවත් ඕනෑ නැති කියන එක. ඔයා අපේ පවුලට හොඳින් වැඩ කළොත් අපි ඔයා[illegible] අනේක කෙනෙක් විදිහට බලා ගන්නවා. සමහර විට අපේ පවු[illegible]

එකතු කරන්න ඔයාටයි හෙවන්ටයි පුළුවන් වෙයි."

මගේ මුළුව කැරකෙන්නට විය. අසල වූ මේසයකට සිරුර වාරු කරගත් මම හීරෝ දෙස බැලීමට ඇතිවූ දැඩි වුවමනාව යටපත් කරගතිමි. ඔහුගේ මුහුණේ ලියවී ඇති දෙය දැකීමට මම බිය වූයෙමි. කාමරය සුරුට්ටු දුමින් පිරී තිබුණ අතර මා සිතට මෙරිගෝ රවුමක අශ්වයෙකු පිට සිටින කලක බඳු විය.

යෝජි නැගිට්ටේය. "ඔයා මෙහේ ඇමරිකාවේ දුප්පත් ජීවිතයක් ගත කරන්නේ කියලා මම දන්නවා. මා ළඟට ඇවිදින් වැඩ කරනවා නම් කැමති හැම දෙයක්ම ලැබෙයි. ඔයාගේම මිනිස්සුන්ව ප්‍රමුඛ කරනවා නම් මම හුඟාක් සතුටු වෙනවා. මම දැනගත්ත දේවල හැටියට ඔයා හෙවන් එක්ක ප්‍රාතිහාර්ය කරලා තියෙනවා." යෝජි පියවරක් ඉදිරියට ආවේය. මම හීරෝ දෙස බැලීමි. ඔහු මේවාට සවන් දෙන්නේ ඇයි? ඔහු යෝජිගේ යෝජනාව ගැන කල්පනා කරනවාද? "ඉතින්" යෝජි කතා කළේය. "අපිට එකතු වෙනවාද?"

දැඩි නිහඬ බවක් ඇති විය.

"නැහැ" කී හීරෝ දොර විවෘත කළේය. ජෝ හා ස්ටීවන් වහා පැමිණ මග අවහිර කළහ.

"ප්‍රශ්නයක් නැද්ද, සර්?" ජෝ ඇසුවේය.

"එයාලට යන්න දෙන්න." යෝජි කීවේය. "මගේ යෝජනාව තවම විවෘතයි, හීරෝ" කී ඔහු මදෙස බැලුවේය. "ඔයා මේ යාළුවා ගැන හිතනවා නම් එයාට අවබෝධ කරන්න අපි එක්ක එකතු වෙන්න කියලා. එහෙම නොවුණොත් ඒක සියදිවි නසා ගැනීමක්." ඔහුගේ ස්වරය තර්ජනාත්මක විය.

ආරක්ෂකයින්ව තල්ලු කරගෙන හීරෝ පිටතට පා නැගුවේය. මොහොතකට පසුව මම ඔහු පසු පසින් ගියෙමි. අසාමාන්‍ය ලෙස ඔහුගේ ඇවිදීමේ විලාසය අමුතු ලෙස වැනෙන බවක් ගෙන ඔහුගේ අභිමානවත් පියවර තැබීම වෙනස් විය.

තාදකත පුද්ගලයෙකු පසුපස යන බවක් මට හැඟුණි.



www.sinhalaelibrary.com

# 4.

"මෙහෙවන්" මෝටර් රථයට නැගී වහාම හීරෝ කතා කළේය. "මම......"

"එපා!" මා හොඳින් හඳුනන්නේ යැයි සිතා සිටි පුද්ගලයා දෙස බලා මම එක්වර කීවෙමි. "කතා කරන්න එපා. මට ටිකක් හිතන්න ඕනෑ." හීරෝ දෙතොල තද කරගෙන හිස වනා මට ඉඩ සැලසූ විට මෝටර් රථයේ අසුනට හිස හේත්තු කරගත් මම ඉතින් මුහුණ වසා ගතිමි. පසුගිය දින දහය ඇතුළත, හෝටල් කාමරයේ සිදුවූ ප්‍රහාරයේ සිට සියල්ල අමතක කර, ගුළිව සිටීමට මට අවශ්‍ය විය.

මිගාරෝ, කැරන් හා යෝජි හමුවීම දැරිය නොහැකි තරම් වූ අතර මෙම සිදුවීම වඩාත් දරුණු විය.

"ඒයා කොහොමද මට බොරු කිව්වේ?" මුහුණින් දෙඅත් ඉවත් කර හීරෝ දෙසට හැරෙමින් මම ඇසුවෙමි. යෝජිගේ කාමරයේදී ඇසුණ දේවල් සැක සහිත වූ අතර ඒවා අමතක කිරීම ඉතා පහසු බව පෙනුණි.

"මම පැහැදිලි කරන්නම්, මෙහෙවන්" රථය හරවමින් හීරෝ කීවේය. "අපි කෑම ටිකක් කාලා කතා කරමු."

"හොඳයි" බවසින් ඇති මම කීවෙමි. හීරෝ රථය හොලිවුඩ් දෙසට පදවන්නට විය. මිනිස්සුන්ගේ සිත් කියවීමට මා කොතරම් දක්ෂ වූවද, හීරෝ හා අනුසා මිනිසුන් අතර සම්බන්ධය මා නොදන්නේ මන්දැයි යන්න මගේ ප්‍රශ්නය විය. ඒ සමග තවත් ප්‍රශ්න දහක් මතුවූණි. ඇයි ඔහු මට එය නොකීවේ? එසේ වූවේ නම් අපි තවත් සමීප වන්නට තිබුණි.

හීරෝ මට හමුවූ පළමු දිනයේ, අප ආහාර ගත් සුපුරුදු



හෝටලයට නැවත අපි පැමිණියෙමු. අප දෙදෙනා අතර එදා ඇති වූ බැඳීම අද පස්දු වෙන්නට පටන් ගෙන තිබුණි.

බොජුන් පත කියෙවූ මම හීරෝ ගැන නොසලකා කෑම ඇණවුම් කළෙමි. හීරෝ උගුර පෑදුවේය.



"යෝජි කියපු දේවල් ඇත්ත." කී ඔහු මගේ අත වෙත අත දිගු කළේය. මම අත පසෙකට ඇද ගතිමි.

"සින්දුවක් අහන්න මාරු සල්ලි තියෙනවාද?" මේසය මත වූ කාසි දමන කුඩා තැටි වාදන යන්ත්‍රය දෙස බලමින් මම ඇසුවෙමි. ඔහුව නොතකා රිදවීම නිසා නැවත මගේ සිත දිනා ගැනීමට ඔහුට තවත් සටනක් කරන්නට සිදුවනු ඇත.

සුසුමක් හෙළූ ඔහු මාරු කාසි කිපයක් සාක්කුවෙන් ඇද එළියට ගත්තේය. "දැන් මම කියන්නද?" කී ඔහු මෙවර දෙඅත් බැඳ ගත්තේය.

"කැමැත්තක්" මම ගීත ලැයිස්තුව කියවන බවක් අඟවමින් කීවෙමි. එහෙත් කිසිවක් කියවා ගත නොහැකි වූ මගේ හදවත



www.sinhalalibrary.com

වේගයෙන් ඇහෙන්නට වූ විට එය හීරෝටද ඇසෙනු ඇතැයි මට සිතුණි.

"ස්ථානයෙන් මට එන්න සිද්ධ වුණේ ඇයි කියලා මං හරියටම ඔයාට කිව්වේ නැහැ. ඒකට හුඟක් හේතු වුණේ තාත්තාගේ යකුසා එක්ක තිබුණ සම්බන්ධය"

"එතකොට යකමුරාලා මාව පැහැර ගන්න හදද්දී, ඔයාගේ තාත්තාත් ඒ මිනිස්සුන්ගේ පැත්තේ කියලා කියන්න ඔයා නිකමටවත් හිතුවේ නැහැ?" මම ගීත යන්ත්‍රයේ අංක ඕනෑවට එපාවට ඔබමින් කීවෙමි.

"ඒ වෙද්දී තාත්තා යකුසා මිනිහෙක් කියලා මම දැනගෙන හිටියේ නැහැ, ඇත්තමයි" හීරෝ නිමේෂයක් නතර වූවේය. "මු[illegible] එද්දී එයාගේ එහෙම සම්බන්ධයක් තිබුණේ නැහැ," ඔහු මැදුව කීවේය.

"මම ඒක විශ්වාස කරන්න ඕනෑද?" මුහුණ ඇද කරගෙන මම ඔහු දෙසට හැරී ඇසුවෙමි. මා කිසිදා නොදුටු පරිදි ඔහු පරාජිත පෙනුමකින් යුතුවිය "ඔයා විශ්වාස කරයි" ඔහු කියද්දී පැමිණි වේටර්වරිය කෑම පිඟන් අපේ මේසය මත තැබුවාය. ආහාර ගැනීමට රුචියක් නොවූ බැවින් කුසගින්න උහුලා සිටිය හැකි වුවද ඒ බව නොහඟවමින් මම පිඟානේ වූ දේවල් මුවෙහි රුවා ගතිමි.

"මගේ කුඩා කාලයේදී, තාත්තා සාධාරණ ව්‍යාපාරිකයෙක්." හීරෝ කීවේය. "ඒක හරියට ඔයාගේ තාත්තා යකුසා මිනිස්සු එක්ක සම්බන්ධ බව ඔයා කවදාවත් දැනගෙන හිටියේ නැහැ වගේ. ඔයා නායකයෙක් කියලා මම දැනගෙන හිටියේ නැහැ." හීරෝ නැවතී, හුස්මක් ගත්තේය. "දැන් ඔයාට පෙනෙනවා යකුසාලගේ ඇඟිලි ජපානයේ හැම ව්‍යාපාරයකටම දික්වෙලා. මගේ තාත්තාට තිබුණා හොඳ ලී සමාගම් කීපයක්. තාත්තාගේ තාත්තා දෙවැනි ලෝක යුද්ධයට පස්සේ ප්‍රතිසංස්කරණ කාලයේදී හොඳට ලාභගත්තා. එහෙමයි යෙමොටෝ පවුලට හුඟක් සල්ලි ආවේ."

මම කෑම නැවැත්වීමි. අප පළමුව හමුවූ විට ඔහුගේ පවුලට මුදල් ලැබෙන ආකාරය ඇසීමට මට මතක් නොවුණි. මා මෙහි පළමුව පැමිණෙන විට මා ඒ තරමට බොළඳව සිටියෙමි.

මගේම පියා හෝ වෙන කවුරුන් හෝ පොහොසත් වූයේ කෙසේද යන ප්‍රශ්නය මම කිසිදින අසා නොතිබුණෙමි. ඒ මා ඇති දැඩි වූ වට පිටාව තුළ සිටි මිනිසුන් වූ අතර එම ලෝකයේ සෑම කෙනෙකුටම මුදල් යහමින් තිබුණි.

රථගාල දෙස බලා සිටි හීරෝගේ දෙනෙත් ඉතා ඈත දුරකට, තම ළමාවිය ගත වූ ලෝකයක් තරම් දුරකට යොමු වී තිබුණි. "යකුසා මිනිස්සුන්ට කප්පම් ගෙවනවා කියන කාරණය මම දැනගෙන හිටියේ නැහැ. මගේ සීයාත් තාත්තාත් සැහෙන මුදලක් පාතාල කණ්ඩායම්වලට ගෙවලා තියෙනවා. තැමත්තෙන් ගනාටෙයි ඒක නොකර පැවැත්මක් නැහැ."

"ඒක හරි අපරාධයක්" මම කෙඳුරුවෙමි.

"හරි දරුණුයි. වඩාත්ම නරක යකුසා සලකන්නේ එයාලා අද ඉන්න සමුරායිවරු කියලා. ඒ නිසයි ඔහිකෝට්ටයි මටයි කුඩා කාලේ ඉඳලා එක විදිහක පුහුණුවක් දුන්නේ. ඒත් මම තවත් ඉදිරියට යනවා." හීරෝ තේ උගුරක් බීවේය. "සීයා මැරුණට පස්සේ, තාත්තාට වුවමනා වුණා ව්‍යාපාරය තවත් ලොකු කරන්න. මම උසස් පෙළට ඉගෙන ගන්න කාලයේ තාත්තා ගත්ත වැරදි තීරණයක් නිසා හැමදේම වෙනස් වුණා. එයා ණයක් ගත්තා යකමුරාලගේ අග්‍ර පුරෝහිතයාගෙන්"

"කවුද ඒ?" ඒ සංවිධානයේ ජ්‍යෙෂ්ඨ උපදේශකයා මට හඳුනාගත් මම ඇසීමි.

"මිනිහාගේ නම ටෙට්සුඕ තකහිෂි. දැන් මැරිලා. සැකයක් නැහැ, තවත් සංවිධානයකින් මරන්න ඇති. ඒ කවුද කියලා මම දන්නේ නැහැ. අන්තිමේ තාත්තා පිළිගත්තා ණය ගෙවන්න බැහැ කියලා. උන් තාත්තාවත් අම්මාවත් මාවත් මරණ බවට තර්ජනය කරලා උන්ගේ ජවාරම් මුවා කරගන්න අපේ ව්‍යාපාරය ඉල්ලුවා."

www.sinhalaelibrary.com

"මොනවගේ ජාවාරමද?" මම ඇසුවෙමි.

"ආයුධ, මත්ද්‍රව්‍ය, දන්න හැම විදිහේම හොර වැඩ. තාත්තා හුගක් කල් ව්‍යාපාර කරපු නිසා උන්ට පුළුවන් කරදරයක් නැතුව ඕනෑම දෙයක් පිටරටවලින් ගෙන්වන්න."

"මට තේරෙනවා" මම කීවෙමි.

"තාත්තා හිතුවා ඒක අන්තිම බලාපොරොත්තුව කියලා. ඉතින් එයා කැමති වුණා.

"ඒත් යෝජ් කිව්වේ "අන්තිමේ" ඔයාගේ තාත්තා එයා ළඟ වැඩට ආවා කියලා." ව්‍යාකූල වූ මම කීවෙමි. "ඒත් ඊට ඉස්සර ඉඳලා තාත්තා එතැන වැඩ කළා කියලා ඔයා දැනගෙන හිටියා."

"ඒක විදිහකට, ඔව්." තවත් වතුර ඉල්ලා වේටර්වරියට ඉඟි කරමින් හීරෝ කතා කළේය. "තාත්තාගේ සම්බන්ධය තිබුණේ නකාතිමි එක්ක. මිනිහා මැරුණට පස්සේ තාත්තාට එතැනට එන්න සිද්ධ වුණා. ඒත් තාත්තා කැමති වුණේ නැහැ නි... නාමයක් එක්ක සාමාජිකයෙක් වෙන්න. ඒත් බඩු එන විදිහේ වෙනසක් නැති නිසා යකුසුරා ඒක සැලකුවේ නැහැ. ඒත් පස්සේ මිනිහා තාත්තාට බල කළා."

"උපදේශකයෙක් වෙන්න?" මම කීවෙමි. "ඒත් ඇයි යෝජ්ට ඒක හදිසියේ වුවමනා වුණේ ඇයි?"

"එතකොට තාත්තාට සිද්ධ වෙනවා ලෙයින් දිවුරලා මිනිහාට බැඳෙන්න." හීරෝ මිහානට මෙන් හෙළුවේය.

"මොනවා හරි කන්න." මම ඔහුගේ අත සියුම්ව ස්පර්ශ කළෙමි. මගේ කෝප්ප ඉක්මනට පෙරළුණි. හීරෝ සැන්විචයක් ගෙන හපන්නට විය. වේටර්වරිය වීදුරුවලට වතුර පිරවූ විට හීරෝ එක හුස්මට වතුර වීදුරුවක් බිල දැමුවේය."

"මේ දේවල් සිද්ධ වුණ හැටි කොහොමද දැනගත්තේ?"

"මට අවුරුදු දහඅටේදී, දවසක් තාත්තා මට එයාගේ



කන්තෝරුවට කතා කළා. එයා මට හැම දෙයක්ම කිව්වා. ඊළඟට ව්‍යාපාරය භාරගන්න හිටියේ මම නිසා මම මුහුණ දෙන්න යන දේවල් දැනගන්න ඕනෑ කියලා එයා හිතුවා. පැවැත්මට යකුසා එක්ක සම්බන්ධ වුණාට හොඳ පැත්තට විතරක් වැඩ කළා. ලේ වලින් දිවුරන බැඳීමකට යන්න එපා කියලා තාත්තා මට පැහැදිලි කළා."

"ඒත් ඔයා ඒක විශ්වාස කළේ නැහැ?"

"මම එතකොට තරුණයි." හීරෝ කීවේය. "ඒත් මම මෝඩ නැහැ. ඒ කතා බහට ඉස්සර ඉඳලා මට සැකයක් තිබුණා යකුසා මිනිස්සු තමන්ගේ වාසියට වැඩ කරන විදිහ ගැන - සටන් කාමියෙකුගේ ක්‍රමය පුහුණු චරිතයක්. තාත්තාගේ විශ්වාසයේ හුගක් අවුලකාවුකම් තිබුණ බව පෙනුණා.

"ඉතින් ඔයා පැනලා ගියා......" මම මිමිණුවෙමි.

"ඒ වෙලාවේ නොවෙයි. මුලින්ම මම කියෝටෝවල අසපුවකට ගියා මම කළ යුතු දේවල් ගැන භාවනා කරන්න. මට ලැබුණ උත්තරය තමයි මම පවුල අතහැරලා ඇමරිකාවට ඇවිදින් නියම සමුරායිවරයෙකුගේ ජීවන රටාව අනිත් අයට උගන්වන එක. නවීන දේවලට ගැළපෙන විදිහට ඒක ආපසු පිරිසිදු තත්ත්වයකට ගෙනෙන්න."

"මේවා මට නොකිව්ව එක මට විශ්වාස කරන්නත් බැහැ." මම හිස වැනීමි. "ඔයාගේ ජීවිතයේ ඒතරම් ලොකු දෙයක් මගෙන් වසන් කරලා තියාගෙන හිටියා කියලා හිතාගන්න බැහැ."

"හෙවත් මට සතුටුයි." මගේ අත අල්ලා ගනිමින් හීරෝ කීවේය. මෙවර මම ඔහුට ඉඩ දුනිමි. "ඔයා තේරුම් ගන්න ඕනෑ මම හිතුවේ ඒ කොටස සදහටම අවසන් කරලා දාන්න. ඔයාගේ ජීවිතයට ඒකේ සම්බන්ධයක් තියෙයි කියලා හිතුවේ නැහැ. මම දන්න තරමින්, ඉඳහිට මගේ තාත්තා යකුසුරාලට වැරදි වැඩවලට උදව් කළා..... එයා පොහොසත්. ඒත් මම හිතුවේ නැහැ එයා මේ තරම් ගැඹුරින් සම්බන්ධ වෙයි කියලා."

"ඒක දැනගත්තා නම් මගේ හිත සතුටුවෙයි කියලා ඔයා

නිදුවේ නැද්ද? මගේ තාත්තා කෝගෝ පවුලේ පාතාල සංවිධාන නායකයා කියලා දැන ගත්තාට පස්සේ මට ඒක මොන තරම් වැරැද්ද...... පිළිකුල් කියලා දැනුණු හැටි ඔයා දන්නවාද?"

"ඔයා මට විශ්වාස කරන තුරු මට කියන්න තිබෙන්නේ නැතැයි කියලා විතරයි, හෙවන්" මගේ අත මිරිකමින් හීරෝ ආයාචනාත්මක ස්වරයකින් කීවේය. "මම මෝඩ වුණා කියලා දැන් තේරෙනවා. මගේ ප්‍රශ්නවලින් ඔයාව තවත් අපහසුවට පත්වෙයි කියලා මම හිතුවා."

"ඒත් පස්සේ හරි ඔයාට මට ඒක කියන්න තිබුණා," දෙනෙත් කඳුළු පිරෙද්දී මම කීවෙමි. "මම ඔයාට මේ තරම් ආදරය කරද්දී මට ඒක තේරුම් ගන්න පුළුවන්" හීරෝගේ දෙනෙත් දිලිසුණි. ඔහුගෙන් අත ඉවතට ගත් මම අත් පිස්නාවක් අතට ගතිමි.

"මට කියන්න තිබුණා, හෙවන්. දැන් ඔයාට ඒක විශ්වාස කරන්න අමාරු වුණත් ඒක තමයි ඇත්ත. ඒත් අපිට ඒ තරම් දේවල් කතා කරන්න කාලයක් තිබුණේ නැහැ, නේද?"

"තමත් නැහැ" විශ්වාසයකින් තොරව වුවද රූරා වැටෙන කඳුළු වළකා ගැනීමට තැත් කරමින් මම කීවෙමි. කුඩා දරුවෙකු වීම ගැන මම මටම දොස් පවරා ගතිමි.

"මට සමාව දෙනවාද? හෙවන්" ඔහු බැගෑපත් විය. ඔහුව සහසන වචනවලින් ඔහුගේ ආයාචනය පිළිගැනීමට මට සිත් වුණද, ඉතා ගැඹුරින් ආ සිහුවිල්ලක් හඬ නගමින් මට අනතුරු ඇඟෙව්වේය. හෙළි නොකළ තවත් බොහෝ රහස් තමාගේ ඔා කෙසේ ඔහුට සමාව දියහැකිද? මගේ සිතෙහි වූ ආතතිය මැඩගත නොහැකිව, බොඳවූ දෙනෙතින් මම කෑම පිඟාන් දෙස බලා සිටියෙමි.

"හෙවන්! දෙවියනේ මේ ඔයාමද?" සෙනග පිරි හෝටල් ශාලාව තුළ, ඕං මොහොතකට කම්පනය කරමින්, ප්‍රීතිජනක කට හඬක් රැව් දුන්නේය. මම හිස හරවා බැලීමි.

ෂෙරිල් - ඇය ජීවතුන් අතරි



"ෂෙරිල්!" අපුහින් හැඟිවමින් මම කෑගැසුවෙමි. ඈතක සිට කෑගසා ෂෙරිල් අතවනමින් මේස අතරින් එන්නට වූයේ ඇගේ විශාල ප්‍රමාණයේ අත්බෑගය හිස්වල වැදී සෝන්ති ගන්නා මිනිසුන්ව නොසලකා හරිමිනි.

"හෙවන් කෝගෝ, පිස්සු කෙල්ල!" අවසාන මොහොත දෙක පසෙකට තල්ලු කරමින් ෂෙරිල් මගේ දෙඅත් අල්ලා ගත්තාය. අපි එතැනම මඳක් හැඬුවෙමු. මගේ දෙකම්මුල් දිගේ කඳුළු ගලා හැළෙන්නට විය. කොටසක් හීරෝ හා ඇතිවූ සංවාදය නිසා, කොටසක් ෂෙරිල් ගින්නෙන් දිවි ගලවා ගෙන තිබූ බව නොදැන සිටි නිසා ඇගේ අනපේක්ෂිත හමුවීම දැරිය නොහැකි නිසාද විය. සිදුව තිබූ කිසිදෙයක් මට කියා නොතිබුණි. ලොස් ඇන්ජලීස්හි සිට වේගාස් වෙත පැන ආ දිනයේ සිට මම යටපත් කරගනිමින් සිටියේ කුමක්දැයි මට අවබෝධ විය.

"බලන්න ඔයා දිහා" මම ඇයව ඈත් කර අල්ලා කීවෙමි. "මට - මට ඔයා හොඳින් කියලා විශ්වාස කරන්නත් බැහැ."

"මම හොඳින්" ඈ අවධාරණය කළාය. "විතක් ඉන්න -" යි ඈ මගේ උරපතුවලින් අල්ලා කැරකුවාය.

"මොකක්ද?" දැස පිසිමින් මම ඇසුවෙමි.

"මම ඔයාගේ කොණ්ඩයට ආසයි! අන්තිමේ ඔයා කොණ්ඩය කැපුවා කියලා විශ්වාස කරන්නත් බැහැ!"

"හීරෝගේ වැඩක්" සිනාසෙමින් මම කීවෙමි. අපේ කතා බහ අවසාන වනතුරු බලාගෙන සිටගෙන සිටි හීරෝ දෙස ඈ බැලුවාය.

"හීරෝ!" ෂෙරිල් සිහින් හඬින් කෑගැසුවාය. "ඔයා තම වෙලා" ඈ ඔහුව ඇතින් ඇය වෙතට ඇද ඔහුගේ දෙකම්මුල සිප ගත්තාය. ඇගේ උරහිස මතින් මදෙස බැලූ ඔහු ආයාසයෙන් සිනාවක් නගා ගත්තේය.

"වාඩි වෙන්න," හීරෝ කීවේය. "සිද්ධ වුණ දේවල් කියන්න."

ෂෙරිල් පුටුවක් ඇද මා අසලින්ම වාඩි වූවාය
වෙරපටියකගේ රළුභාවයෙන් ඇද, ඇගේ නුරුස්සනා බැල්
නොසලකා කෑම ඇනවුම් කළාය. මා ඇය නොදැක තිබුණෙ
සතියකට අඩු කලක් වුවද ඇගේ හිස කෙස් රතු පැහැයෙ
තිබූ අතර මුහුණ කෙට්ටු වී තිබුණද ඈ සුපුරුදු ජවයෙන්
වූවාය. ඇගේ එකම වෙනස ඇඳුමයි - උණුසුම් දිනක් වූ
ඇගේ ඇඳුමින් සිරුර බොහෝ සේ ආවරණය වී තිබුණි.

"කොහොමද කකුලේ අමාරුව" හීරෝ ඇසුවේය. ගින්න
පෙර පදික වේදිකාවේදී වූ ප්‍රහාරයේදී ඇගේ වළලුකර ආබා
විය.

"දැන් හොඳටම හරි." ෂෙරිල් සතුටින් කීවාය. "දැ
ඇඹරීමක්. දවස් කීපයකින් හරි ගියා. ටිකක් ඉදිමිලා. ඒ
කැක්කුමක් නැහැ."

"ඉතින් මොකද වුණේ?" මම වතුර උගුරක් බොමි
ඇසුවෙමි. "ගින්න පටන් ගනිද්දී ඔයා ගේ ඇතුළේද?"

මුහුණේ සිනාව මද වේලාවකට අතුරුදහන් වුණද
සිනාවක් මවා ගත්තාය. "මම ඇතුළේ. වැක්සියෙන් බැහැ
මම තට්ටිය උඩට වැටිලා කල්පනා කළා. මාර්කස්ගේ
ගින්දර මවව අල්ල් වෙලා හිටියේ."

මම අනුකම්පාවෙන් හිස සැලීමි. මාර්කස් ෂෙරිල්ගේ
මිතුරෙකු වූ අතර මා අල්ලා ගැනීමට ඔහු ෂෙරිල්ව යොදා
ගෙන තිබූ බව එදින රාත්‍රියේ අපි දැන ගතිමු. ඔහු හා ඔහුගේ
සහචරයින් අප සැම දෙනාටම මරා දමන්නට තිබුණි.

"මම නැගිටිද්දී මුළු කාමරයේම දුම්පිරිලා. ඉස්සරහා දො
බිත්තෙත් වැටිලා. මම නාන කාමරයට රිංග ගත්තා"

"අනේ, ෂෙරිල්" මම කීවෙමි. "මට හුගක් කනගාටුයි."

"කනගාටු වෙන්න ඕනෑ නමයි." ඈ මා පුදුමයට ප
කරමින් සැරෙන් කීවාය.

"විහිළුවට, ළමයෝ" සිනා හඬ නගමින් ඈ නැ



කීවාය.

"ෂෙරිල්, එහෙම කරන්න එපා" මම කෑගැසීමි. "ඔයා මාව හොඳටම බය කළා."

ෂෙරිල් මගේ අත මිරිකුවාය. "හරි, හෙවන් - ඔයයි හීරෝයි නොහිටින්න, මාර්කස් මාව කෝච්චියකට තල්ලු කරනවා."

"ඒත් මම නිසා......" මම පටන් ගතිමි.

"මොකක් වුණත්" මගේ සමාව අයැදීම පසෙකලමින් ෂෙරිල් කීවාය. "මගේ කතාව අහන්නකෝ!"

"හරි" මද සිනාවකින් පුටුව සිට හීරෝ දෙස බලමින් මම කීවෙමි. ෂෙරිල්ගේ නොනවතින කතා විලාසයෙන් ඔහු ප්‍රබෝධමත්ව සිටි බවක් පෙනුණි.

"ඉතින් මම නාන කාමරයට දුවලා ගිහින්" ෂෙරිල් දෑතේ වූ වළලු හඬවා අත් ලෙළවමින් කතා කළාය. "ලොකු තුවාය අරගෙන වතුර පෙගෙව්වා.

"හොඳ කල්පනාවක්" හීරෝ කීවේය.

"කොහොම හරි, මම කොරිඩෝවට ඇවිදින් තුවාය පොරවාගෙන ජනේලයෙන් එළියට පැන්නා."

"එතකොට ගිනි නිවන ට්‍රක් ඇවිදින්ද?" මම ඇසීමි.

"ඔව්, ඒත් මම නැවතුණේ නැතිව යාළුවෙකුගේ ගෙදරට දිව්වා. මිනිස්සු ප්‍රශ්න කරයි කියලා මම හිතුවා. දන්නවානේ? මම හිතුවා ඔයාලටත් මගදී පහර දෙන්න ඇති කියලා!"

"නැහැ, කාමරයෙන් බෑග් එක අරගෙන අපි ආපහු එද්දී ගෙට ගිනි ඇවිළිලා. පොලිසියයි ගිනි නිවන භටයොයි හැම තැනම" යි මම ෂෙරිල්ගේ හිස අත ගෑවෙමි. "ඔයා හොඳින් ඉන්න එක ගැන මට හුගක් සතුටුයි." මගේ දෙනෙත්වල නැවත කඳුළු පිරෙනු දැනුණි. "ඔයාට අනතුරක් වුණා නම් මම මොනවා කරන්නද කියලා හිතා ගන්න බැහැ."

"ඔයා නටන්නත්න" ෂෙරිල් කීවේය. "ඔයා මාව ඇඳෙව්වෙල
මගේ මුහුණ නැගෙවෙයි."

"ඒත් ඔයාගේ හැමදේම නැති වුණා..." වරදකාරී හැඟීමෙ
මා වෙලා ගනිද්දී මම කීවෙමි.

"ඒ ගැන දුක්වෙන්න එපා." සිනාවක් මවා ගනිමින් ෂෙරි
කීවාය. "වැඩකට නැති දේවල්. ඊට පස්සේ සිද්ධ වුණ දේ තමු
දරුණු!"

"ෂෙරිල්ගේ හැම පියාත පැමිණියේය. ඈ උනන්දුවෙ
හැම ගනිමින් කතා කළාය. "ඉතින් ගින්න ඇක්කාට පස්සේ
ඔයාලා කොහේද ගියේ?"

"ඉන්න- ඔයාට මොකද වුණේ?" මම ඇසුවෙමි.

"පස්සේ" ෂෙරිල් කීවාය. "ඔයාලා කොහේද හිටියේ කියල
මට දැනගන්න ඕනෑ."

"මම හෙවන්ට වේගාස් යන බස් එකකට දැම්මා." හීරෝ
කීවේය.

"වෙන්න බැහැ!" ෂෙරිල් විමතිය පළ කළේය. "ඔයා කැමති
වුණාද?"

"ඊතත්..." මම කීවෙමි. මම හැම ගන්නා ඇය දෙස
බැලුවෙමි. ඇගේ යම් වෙනසක් විය - මුහුණේ දැඩි බවත්
ඇස්වල වියරු බැල්මක්. මට එය වටහා ගත නොහැකි විය. ඈ
යමකින් මත් වියයි මම සැක කළෙමි. "ඊට පස්සේ?" ෂෙරිල්
ඇසුවාය.

සිදුවූ සියල්ල ෂෙරිල්ට කිවයුතු යැයි මම තීරණය කළෙමි
ඇය අප සමග සිටිනු දැකීම ඇයට අනතුරුදායක වුවද අප
අල්ලා ගැනීමට එන මිනිසුන් අප සිටින තැනක් දැන නොසිටි
හෙයින් බිය වීමට කරුණක් නොවීය. සිදුව තිබූ සියල්ල කීමෙන්
අනතුරුව මා හා හීරෝ යුරෝපීය රටකට පැන ගොස් අලුත්
ජීවිතයක් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මා කී විට ඈ
උස් හඬින් කෑගැසුවාය.



"වෙන්න බැහැ!" එතකොට ඔයාලා පිටවෙලා යනවා?"

මම රතු වුණෙමි. අවට සිටි මිනිස්සු අප පිටව යා යුතුය යන බැල්මෙන් අප දෙස බලා සිටියහ.

"ෂෙරිල්....ෂ්ෂ්...." මම ශබ්ද කළෙමි.

"කනගාටුයි." ඇගේ සුපුරුදු හඬට මදක් අඩු ස්වරයකින් ඈ කෙඳිරුවාය.

"ඒක-මට විශ්වාස කරන්නත් බැහැ." ඇය අප වෙත හෙළූ බැල්ම දැක මට සිනහා පහළ විය.

"ඔයා හුගක් දුර හිතනවා." මම කීවෙමි. "මම දැන් හැමදේම කිව්වා."

ෂෙරිල්ගේ මුහුණ දෙවන වරටද අඳුරු වුවද ඈ ඉක්මනින්ම නැවත ප්‍රකෘති වූවාය. "මට දුක ඔයාලා හුගක් කරදර වින්ද එක ගැන. ඒත් මම බලන්නේ මේවා ධනාත්මක විදිහට"

"මම ඔයාගේ හැටි දන්නවා" මම කීවෙමි.

"දැන් මොකද කරන්නේ?" ෂෙරිල් ඇසුවාය.

"අපි තවම ඒ ගැන කතා කළේ නැහැ." හීරෝ කීවේය. "අපි හෙට උදේ ලොස් ඇන්ජලීස්වලින් ලාස් වේගාස්වලට යනවා. ඊට පස්සේ ඊළඟට කරන දේ තීරණය කරනවා."

"ඒක හොඳයි." ෂෙරිල් කීවාය. "ඔයාලට පුළුවන් අද මගේ අලුත් කාමරයේ නවතින්න."

හීරෝ පුදුමයට පත්වූ බවක් පෙනුණි. "ඔයා අලුත් තැනක් හොයා ගත්තාද?" මා දෙස බලමින් ඔහු කීවේය. මාද කල්පනා කරමින් සිටියේ ඒ දෙයමය.

"ඔව්- මම කිව්වා වගේ හැම දෙයක්ම හොඳ අතට හැරුණා." ෂෙරිල්ගේ මුහුණ නැවත අඳුරු විය. "හෙවත්" කී ඈ මා වෙතට හැරී මගේ අත ඇල්ලුවාය.

"මට තව දෙයක් කියන්න තියෙනවා." දැස මහත් වූ ඈ

ඇගෙත් අගෙහි නියපොතු ගසන්නට වූවාය.

"මොකක්ද?" මම ඇගේ අත ස්පර්ශ කරමින් ඇසුවෙමි. සමහර විට මට හැඟුණ මුත් කිව නොහැකි දෙයක් ඇය කියන්නට යනවා විය හැක.

"මගේ පවුලේ අයට සල්ලි නැහැ කියලා මම කිව්වා මතකද? මට සතියම යැපෙන්න මොනවා හරි කරන්න ඕනෑ කියලා?"

"මට මතකයි" මම කීවෙමි. අප එකට සිටි නිවසේ කුලී ගෙවීමට මට නොහැකි වීම ගැන මට වරදකාරී හැඟීමක් ඇති වුණි. ෂෙරිල්ට තම පවුලින් මුදල් හෝ වෙනත් කිසිම ආකාරයක උදව්වක් නොලැබුණ බව මම දැන සිටියෙමි.

"හරි..." ෂෙරිල් ගැඹුරු හුස්මක් ගත්තාය. ඇ එක්වරම කතා කිරීම ඇරඹුවාය. "ඒක බොරුවක්. ඇත්ත කතාව, මගේ තාත්තා ප්‍රසිද්ධ නීතිඥවරයෙක්. අම්මා පොහොසත් පවුලක. හුගක් සල්ලි තියෙනවා.මම සතියම හම්බ කරගෙන ජීවත් වුණාට මට ඕනෑ නැම වෙලාවෙම එයාලා සල්ලි දුන්නා. මම එහෙම ජීවත් වුණේ ඇයි කියලා එයාලා තේරුම් ගත්තේ නැහැ. එයාලා හිතුවේ මැඩ කරන එක එපාවෙලා මම තවත් ඉහලට ඉගෙන ගනීවි කියලා." ෂෙරිල් ආයාචනාත්මකව මා දෙස බැලුවාය. "බොරු කියපු එක ගැන මට කනගාටුයි. ෂෙරිල්" මම ඇයව බැලඳ ගතිමි. "මට තේරෙනවා. ඔයා ඒ වගේ පවුලක කෙනෙක් කියලා කියන්න අමාරුයි."

"ඉතින්. ඔයාගේ අම්මලා මෙයත් අරන් දුන්නද?" හීරෝ ඇසුවේය.

ෂෙරිල් ඉස එක ගත්තාය. "ඒ වගේ දෙයක්. එයාලගේ යාළුවෙක් නිවාඩුවට ප්‍රංශයට ගියා. ඒ ගෙදර බලාගන්න කෙනෙක් ඕනෑවුණ නිසා මට එතැන ලැබුණා. අපූරු තැනක්"

"ඔයාට ලොස් ඇන්ජලීස්වල නැවතිලා ඉන්න අම්මලට ඉවදුන්න එක හොඳයි." මම කීවෙමි. "කොහේද ඒ ගෙදර?"



"ස්ප්‍රඩියෝ සිටිවල. එන්නකෝ" ෂෙරිල් තම සුපුරුදු හැසිරීමෙන් යුතු විය. කිසිදින වැඩි වෙලාවක් එක තැනක සිටීමට ඇයට නොහැකි විය.

"ඔයාලා එතැනට හුගක් කැමති වෙයි. ලොකු නිදන කාමර හතරක් ගේ ඇතුළේ පොකුණක් එහෙම තියෙනවා."

"හොඳයි, ඔයාට කරදරයක් නැතිනම්...." මම කීවෙමි.

"මම අහන්න." ෂෙරිල් කිව්වාය. "ඒක අපහසු නැහැ. ඔයාලගේ කුලී කාර් එක ආපහු දෙන්න. ඔයාලට පුළුවන් මගේ කාර් එක අරගෙන ගව්ගාස්වලට යන්න."

"මොකක්ද ඔයාගේ වාහනය?" හිස කෙස් අතරින් ඇඟිලි යවමින් හීරෝ ඇසුවේය.

"ස්පෝට් කාර් එකක්. ගේත් එක්කම ලැබුණා. අර තියෙන්නේ" යි ෂෙරිල් රථ ගාලේ වූ රන්වන් පැහැ BMW වර්ගයේ වහලය ඇකිළිය හැකි මෝටර් රථයක් දැක්විය. එය තවත් රථ දෙකක් හරස් වන ලෙස නවතා තිබුණි.

"අපූරුවට නවත්වලා" මම හඬ නගා සිනාසුණෙමි.

"හේයි - ඒක මගේ හැටි. අනික මම විනාඩියකට වැඩිය මෙතැන ඉන්න හිතුවේ නැහැ!" යි ඇ මේසය යටින් අත් බෑගය අතට ගත්තාය.

"මම බාත් රූම් එකට ගිහින් එනතුරු ඔයාලා කතා කරන්න. මෙන්න සල්ලි තියෙනවා බිල ගෙවන්න."

ඩොලර් පනහක නෝට්ටුවක් මේසය මත දමා ෂෙරිල් නාන කාමරය දෙසට ගියාය.

"මට ෂෙරිල් ගැන සතුටුයි." මම හීරෝ දෙස බලමින් කීවෙමි. යෝජිගේ ස්ථානයේදී දැනගත් දේවලට අමතරව කතා කිරීමට තවත් යමක් ලැබීම ගැන මම සතුටු වීමි.

"ඔව්," හීරෝ පිළිතුරු දුන්නේය. "ඒත් ඔයාට හිතෙන්නේ නැද්ද එයා ටිකක්........" ඔහු නැවතී වචන සොයන්නට විය.

"වැඩියි කියලා?"

"හරි. එයාගේ කතාව වැඩියි" ෂෙරිල් මා පසුපස දුවී බැලීමට හැරී මම කීවෙමි.

"එයාගේ ඇස් දෙක දිලිසෙන හැටි දැක්කාද?"

"ඔව්. කෑම කටවල් දෙකයි කෑවේ." මම ඇගේ පිඟාන දෙස බලාගෙන කීවෙමි. "මම හිතන්නේ මත්ද්‍රව්‍යය අරගෙන"

හීරෝ උස සුඩා කළේය. "ඒක හොඳ දෙයක් නෙවෙයි."

"එයා හුඟක් කරදරවලට මැදි වුණා. ඇය මත්පැන් බොන තරම් හීරෝව කොයි මම ඇය නවත් දෙයකට අබ්බැහිවීම ගැන පුදුම නොවීමි.

"ඔයා මට වඩා එයා ගැන දන්නවානේ....." හීරෝ කීවේය.

මම සුසුමක් හෙළිමි. ෂෙරිල් කොතරම් ත්‍යාගශීලී බව ද ඇ මට ඇගේ හැසිරීම විවේචනය කළ නොහැකි බවක් හැඟුණි.

"ඔයා හිතන්නේ මොකක්ද?" මම ඇසීමි. "අපි යමු. අනිත් අපි වෙන කොහේද අද රෑට නවතින්නේ? එයාගේ කාර් එක ඉල්ලාගන්න එක.... ඒකත් හොඳ අදහසක්."

# 5.

වේගයෙන් රථය පදවා ෂෙරිල් ටයර් හඬ නංවමින් හරවා ඇගේ නිවසේ බිම් මහලේ රථගාල වෙතට පැමිණ නැවතුණාය. අනෙක් සෑම දෙයකදීම මෙන්ම, ෂෙරිල්ගේ රිය පැදවීමද එතරම් කල්පනාකාරී බවකින් යුතු නොවීය. හුස්මක් පිට කළ හීරෝ තදින් අල්ලා සිටි දොර හැඬලය අත හැරියේය. නින්ජා ප්‍රහාරයක් ප්‍රශ්නයක් නොව.... එහෙත් වෙනත් කෙනෙකුට රථය පැදවීමට ඉඩදීමෙන් හීරෝ බියට පත්වන්නේය.

"ෂාහ්!" නවීන පන්නයේ සුඛෝපභෝගී නිවසක ඉස්තෝප්පුවක් බඳු වූ තැනකට පියවර තබමින් මම හුස්මක් ගතිමි.

අප ඉදිරියේ වූ සර්පිලාකාර යකඩ තරප්පුව කෙළින්ම උඩුමහලේ වූ නිවහනට දිවුණි. එක් බිත්තියක් වීදුරුවලින් පමණක් නිමවුණ අතර ඉන් පිටත වූ සඳලු තලයට නගරයේ විදුලි පහන් දිස්වුණි. පළමුවරට ජීවමාන මිනිස් රූ මෙන් පෙනුණ ලෝහ ප්‍රතිමා කාමරයේ තැන තැන තිබුණි. එහෙත් සමීපව බැලූ විට ඒවා කුරුල්ලන්ගේ හා සත්තුන්ගේ බව පෙනුණි. විශාල කාමරය නවීන ගෘහ භාණ්ඩවලින් පිරී එකක් විය.

"ලස්සනයි" හීරෝ ප්‍රශංසාත්මකව කීවේය.

"පාළුයි වගේ නේද?" යතුර වීදුරු මේසයක් මතට විසි කරමින් ෂෙරිල් කීවාය. "මේ ගෙයි අයිතිකාරයින්ට තියෙන ඉඩම් තුන හතරෙන් එකක් මේක. ප්‍රංශයේ, ලන්ඩන්වල, නිව්යෝර්ක්වලත් ගෙවල් තියෙනවා." කී ඇ ශීතකරණය වෙතට ගියාය. "මොනවාද බොන්නේ. විස්කිද බියර්ද?"

"මට මොකවත් එපා. හුඟක් මහන්සියි." මම කීවෙමි.

"හීරෝ," වීදුරුවකට අයිස් කැට දමා ගනිමින් ෂෙරිල් බිම කැබිනෙට්ටුවේ වූ මත්පැන් බෝතලයක් අතට ගත්තාය.

"මටත් එපා"

"එහෙම නම්, මම තනියම බොනවා, හත් හා!" අයිස් කැට පතට විසිකර එක් කරගත් ෂෙරිල් වීදුරුව ඔසවා එක් උගුරක් බිව්වාය. මුලදී අප කතා කර තිබූ දේවල් කිසිවක් අසා නොතිබුණ කලක මෙන් ඇ හැසිරුණාය. සියල්ල අමතක කර විනෝදවීමට ඇයට අවශ්‍ය බව පෙනුණි.



ගිනි උදුන අසලට ගොස් දණ නැමූ ඇ දුම්වැටියක් දල්වාගෙන හාන්සි පුටුවට බර වූවාය. "මොනවා හරි අරගෙන බොන්න."

"මම වතුර ටිකක් ගෙනෙන්නම්" කී හීරෝ මුළුතැන්ගෙය දෙසට ගියේය. මම ෂෙරිල් අසලින් වාඩි වුණෙමි.

"ඔයා සිගරට් බොනවා?" මම කීවෙමි.

"එහෙම නැහැ. ඉඳලා හිටලා. ගෙට ගිනි ඇවිළෙන තුරු නින්දෙන් සිගරට් බොන සමහර ගැහැනු ඉන්නවා."

මම හිස සැලුවෙමි. නිසැකවම ඇය යම් මත්ද්‍රව්‍යයක් ගෙන



ඇත. සිතුවිලිවලින් තොරව හිතට එන වචන පිටකරන බවක් පෙනුණ ඇගේ දෙනෙත් නිතර ඉදිරියටත්, පසු පසටත් යොමු වුණි. "මම කිව්වේ, පසුගිය සතියේ හුගක් කරදර තිබුණා. මාර්කස්ගේ සිද්ධියයි ගින්නයි. දැන් මට සැහැල්ලුවෙන් [illegible] කරන්නේ මොනවාද කියලා හිතන්න ඕනෑ."

"මට තේරෙනවා." මම කීවෙමි. ඇය කිවයුතු ඇති දේවල් දීර්ඝ ලෙස විස්තර කරන්නට වූ අතර ඒ ගැන අවධානයකින් තොරව මම ඇගේ කටහඬින්, අංග චලනයන් හොඳින් නිරීක්ෂණය කරමින් නිගමනයකට ආවෙමි. ඇය මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී ඇති නමුත් දැනට මට ඒ සම්බන්ධව ඇය හා කතා නොකළ හැකි හෙයින් ඇගේ දෙමව්පියන් ඇය ගැන සෝදිසි කළ යුතු යැයි මට සිතුණි.

වහා නැගිට ගත් ෂෙරිල් යතුර අතට ගත්තාය. "එන්න ඔයාලා පොකුණ බලන්න ඕනෑ. ඒක තියෙන්නේ වහලය උඩ. එතෙන්ට වටුම හොඳට පෙනෙනවා."

හීරෝ හා මම ෂෙරිල් පසු පසින් තරප්පුව ඔස්සේ ඉහළට ගියෙමු. ෂෙරිල් කියා තිබුණේ සැබෑවකි. පොකුණ මනරම් එකක් විය. කෙළවර වූ ජල මල්වලින් සීතල වතුර වැටුණි. විදුලි එළියෙන් ජලය ඉතා පැහැදිලිව දිලිසුණි. අපි තිදෙනා ගරාදි වැටට හේත්තු වූවෙමු. සීතල පවන් රොදක් හමා ගිය අතර පහතින් සාමකාමීව වැතිර ඇති නගරය දිස්වුණි. හීරෝ හා මා උස් බීම වීදුරු දෙකක් අතැතිව වද මල් පඳුරු අසල ඇති ගල් බංකුවක වාඩි වී සතුටු සාමීචියක යෙදී සිටින අයුරු මගේ හිතේ මැවුණි.

"හරිම නිස්කලංකයි." හීරෝ කීවේය. ඔහු මගේ සිත කියවූ බව මට නිසැක විය. ප්‍රඥාව - මට ඔහුගේ හිස පළා මොළය කියවීමට තරම් සිත්විය.

"ඩෝසන් පාරේ තිබුණ අපේ මුඩුක්කුවට වඩා මේක කොයිතරම් හොඳද, නේද හෙවන්?" ෂෙරිල් කීවාය.

"ඒත් මම ඒකට කැමතියි." මම කීවෙමි. මගේ පියාගේ

කාර්යාලය හැර ගෙනේ නිවස මෙවැනි නව තාක්ෂණික ක්‍රමවලින් ඉදිවූවක් නොවුණද සෑම දෙයම නිසි සපිරි තිබුණි. කාමරවල සහිත රූ ඉතා පිරිසිදු හා ජපන් පිළිවෙළට සැකසූ සාමයවලින් පුත් ඉතා සුන්දර තැනක් විය. එහෙත් ෂෙරිල් සමග [illegible] වෙනස් වුණි. ඇඳුම් හා භාජන ඇගේ පැරණි නිවසේදී සියල්ල වෙනස් වුණි. ගොඩ ගැහුණ. අවශ්‍ය විට ක්‍රියා කළ හැකි රූපවාහිනී ද බලන් සහිත එම ස්ථානයට මම ඇලුම් කළෙමි.

"එතැන කරදර නැහැ." මම කීවෙමි. "ඒකයි මම කැමති."

"කරදර?" ෂෙරිල් අවඥාවෙන් කීවාය. "ජරමර ගොඩක්, හෙයි. මෙහේ වැඩට ගැහැනු කෙනෙක් ඉන්නවා කියලා මම හිතුවේ නැද්ද? එයා සතියට දවස් දෙකක් එනවා. මට කරන්න කිසිම දෙයක් නැහැ."

"ඇයි ඒ ගෑනිට මේ ගෙය බලාගන්න බැරි?" හීරෝ ඇසුවේය.

"අපොයි" ෂෙරිල් සිනාවක් නැගුවාය. "කවුරුවත් ඇහැ ගහගෙන නොහිටියොත් වටිනා කලා භාණ්ඩ වගේ දේවල් හොරකම් කරගෙන යයි කියලා සැකයි."

ෂෙරිල් වෙවුලන ඇඟිලි නැවත දුම්වැටියක් දල්වා ගත්තාය. එදින රාත්‍රියට ඇය කිසිවක් නොකෑ බව මට සිහිවුණි.

"කුරුල්ලන්ගේ සත්තුන්ගේ රූප කවුද හොරකම් කරන්නේ?" මම විහිළු කර ඇගේ බඳ වටා අතක් යැව්වෙමි. මගේ ස්පර්ශයෙන් ඇගේ සිරුර සැළු වනු දැනී මම අත ආපසු ගතිමි. ඇගේ දෙනෙතට දුටු බැල්මක් නැමිණි අතර හදිසි චිත්ත වේගයකින් අප අතර ඇති වපසරියක් ඇතිවිය. ඇගේ මුහුණ කෝපයෙන් රතුවිය.

"දැන් නිදාගන්න වෙලාව හරි" සන්සුන් බවක් ඇති කරගැනීමට මම කීවෙමි. මත් ගතිය හෝ වෙනත් යමකින් ඇය කෝපයට පත්වූවා විය හැක.

දුම්වැටිය නිවා දැමූ ඇගේ මුහුණ සැහැල්ලු විය. "ඔයාලට



මහන්සි ඇතිනේ යමු පහළට"

ෂෙරිල් අපව පහත මාලයට කැඳවා ගියාය. රවුම් සිලිමක් සහිත මැද ඉඩ කඩක් වටා කාමර පිහිටා තිබුණි. ෂෙරිල් අපගේ නිදන කාමරය පෙන්වූවාය.

"මෙන්න මධුසමයට කාමරය" ෂෙරිල් විහිළු කළාය. "ඔයාලටම ගැලපෙනවා." ඇය ඇසක් ඉඟි [illegible] රත්විය. කාමරය තුළ විශාල ඇඳක්, මේසයක් හා [illegible] පුටුවක්ද තිබුණි. තෙල් සායම් චිත්‍ර දෙකක් ඇඳට ඉහළින් විය. මම හීරෝගේ මුහුණ මග හැරීමි. මට වෙනම කාමරයක අවශ්‍යතාවය තිබුණද ඒ අවස්ථාවේ එය පැහැදිලි කිරීම අපහසු විය.

"සුබ රාත්‍රියක්, ළමයි" පොරොත්තු සිනහවක් ඇඳට විසිකරමින් නැවත ඇසක් ඉඟි කර නී ෂෙරිල් දොර වසා ගෙන පිටත් වූවාය. හීරෝ ඇඳ මත වාඩි වූයේය.

"දැන් නිදාගනිමු" මම කීවෙමි.

"ඒක හොඳයි" කී ඔහු මගේ අත ගෙන සිප ගත්තේය. ඇඳේ පෙරළී වූ ඔහු පෝරෝනාවක ගුලි වී නිදන්නට විය. මා සුබ රාත්‍රියක් පැතීමටත් පෙර ඔහු නින්දට ඇද වැටී තිබුණි. උදයේ මෝටර් රථයේදී නිදාගැනීමේ අවස්ථාව ඔහුට නොලැබුණ බව මට සිහිවුණි. අප සැන්ඩියාගෝවල සිටියේත් අද උදේමද?

මගේ දෙනෙත් තිගැස්සී විවර වුණි. හුස්ම ගැනීමේ හඬක් ඇසුණ අතර ඒ මගේම හුස්ම ගැනීම බව අවබෝධ වීමට පෙර භීතියකින් මගේ පපුව හිර වුණි. මා සිටින්නේ කොහේදැයි හිදිසියේම මට සිහිපත් වුණි. දෙනෙත් තද කරගත් මම සිත පහදා ගැනීමට වෙහෙසුණෙමි. නැවත නින්දට යාමට අවශ්‍ය වුවද ඊළඟ දිනයේදී කුමක්වේ දැයි යන සිතුවිල්ල මා අවදිව තැබුවේය.

රාත්‍රියේ නිසල බව තුළ සිට සිහි කිරීමට මට බොහෝ දේ තිබුණි. ටෙඩි, මිගාරෝ, යෝජි, ෂෙරිල් කෑමට වාඩි වූ තැන සිට මගේ සිත තුළ ඇති වන නොසන්සුන් බව. ඇඳෙන් බැස ගත් මම ඇඟමැලි කඩමින් නාන කාමරයට වැදුණෙමි. බිත්තියේ

පසෙකට තිබූ ඔරලෝසුවේ 5.20 පමණක් වුණි. ඉක්මනින් හිරු උදා වනු ඇත. මුහුණ සෝදාගත් මම කණ්ණාඩියෙන් නැවත සිරුර පරීක්ෂා කළෙමි. ඊයේට වෙනසක් සිදු නොවී තිබුණි.

පහත මාලයට යාමට තීරණය කළ මම කඩුවද රැගෙන යා යුතු යැයි මොහොතකට සිතුවෙමි. එය මෝඩ ක්‍රියාවක් විය හැක. හදිසියේ අවදි වන ශෙරිල් විශාල කඩුවක් ගෙන සිටින මා දුටුවහොත් කුමක් සිතනු ඇතිද? කිරි වීදුරුවක් සොයා යාම අසතුටුදායක නොවනු ඇත. බෝසන් මාවතේ නිවසේදී කිරි හෝ බිත්තර තබාගැනීමේ පුරුද්දක් ශෙරිල්ට නොතිබුණද සතියට දෙවරක් මෙම නිවසට එන සේවිකාව යමක් ඉතිරි කර තිබිය හැක.

මා තරප්පුව බැස එන විට නිවසෙහි දැඩි නිහඬ බවක ගිලී තිබුණද සාලය ආලෝකවත්ව තිබුණි. ශෙරිල් ගිනි උදුන නිවාදමා නොතිබුණි. හඬ නොනගා මම මුළුතැන්ගෙයට වැදුණෙමි. බියර් බෝතල අතර කිරි පැකැට්ටුවක් තිබුණි. මම එය නාසයට කිට්ටුකර බැලීමි. එහි වරදක් නොවීය.

කිරි වීදුරුවක් ද රැගෙන මම සාලයට පැමිණ ගිනි උදුන ඉදිරියේ වූ සෝපාවේ වාඩි වී වටපිට බැලීමි. එතෙක් වේලා මගේ සිතට වද දුන් කාරණය මට අවබෝධ විය. මෙම නිවසේ අයිතිකරුවන්ගේ කිසිදු හෝඩුවාවක්... ඡායාරූපයක් වැනි කිසිවක් එහි නොවීය. ඔවුන් පොහොසත් බවත්, නවීන පන්නයට කැමති බවත් පමණක් පෙනුණි. මෙය හදිසියේ මිලට ගත් එකක් විය යුතුය. බොහෝ රටවල බොහෝ ස්ථාන හිමිකරුවන්ගේ නිවෙස් මෙබඳු විය හැක.

මම කවිච්චිය අත ගා බැලුවෙමි. එය ඉතා මිල අධික ඉතාලි නිෂ්පාදනයක් විය. එහෙත් කුඩම්මා මිකෝ ද නවීන පන්නයේ දේවලට රුචිවූ හෙයින් ඇය ළඟද සඟරාවලින් තෝරාගත් බොහෝ නවීන ගෘහ භාණ්ඩ එකතුවක් විය. උදේ පාඩම් කිරීම, තටාකයේ පිහිනීම හා අනතුරුව ලොකු අයිස් තේ වීදුරුවක් බීම..... ඒ මගේ ජීවිතයේ එක් කාලයක් විය.

උදුනේ උණුසුම වැඩි වූ හෙයින් මම සඳළු තලයට ඇති



දොර අසල වූ මේසය වෙත ගියෙමි. ශෙරිල්ගේ අත් බෑගය මේස කෙළවරින් බිමට වැටීමට ආසන්නව තිබුණ අතර එහි වූ දේවල් පිටතට පැමිණ තිබුණි. මම එය හරි ගස්සා තැබුවෙමි. රිසිට්පත්, ක්‍රීම් වර්ගවල ටියුබ් හා අඩක් බිජ් වූ දුම්වැටි පැකට්ටුවක්, ලයිටරයක්ද නැවත ඒ තුළට දැමූ මගේ හදවත ගැහෙන්නට විය. කුරුටු ගා තිබූ රිසිට්පත් මම එකින් එක පෙරළා බැලුවෙමි.

එක් සිහින් රෝස පැහැ කඩදාසි තීරුවක් මගේ නෙත් ඇද ගත්තේය. මුලදී එය තවත් බැංකු රිසිට්පතකැයි සිතුණ ද උදුනේ එළියෙන් මම එය කියෙව්වෙමි. එය මුදල් තැන්පත් කළ රිසිට්පතක් විය.

ඩොලර් විසිදහසක්!

ගණන නිවැරදි දැයි බැලීමට මම එය නැවත කියෙව්වෙමි. ඩොලර් විසිදහසකි. රිසිට්පත මේසය මත තැබූ මගේ හදවත තවත් තදින් ගැහෙන්නට විය. ශෙරිල්ගේ දෙමව්පියන් කිසිදින ඩොලර් විසිදහසක් වැනි මුදලක් ඇයට නොදෙන බව මම හොඳින් දැන සිටියෙමි. අනෙක් අතට ඔවුහු ඇයට කුලී රහිත නිවසක් සොයාදී තිබුණි. එසේ නම් ඇයට මුදල් දුන්නේ කවුද? කොළ කැබලි බෑගයට ඔබා දැමූ මම ශෙරිල්ගේ මෝටර් රථයේ යතුර ගෙන සාක්කුවේ දමා ගතිමි.

මමත් හීරෝත් වහාම මෙහෙන් පිටව යා යුතු බව මම සිතුවෙමි. මම තරප්පුව වෙතට දුව ගියෙමි. දොරක් ඇරී වැසුණි. මම ගල් ගැසුණි. කැස්සක්... ශෙරිල්ගේ.

මගේ පුහුණුව ප්‍රයෝජනයට ගෙන හඬ නොනැගෙන පරිදි මම තරප්පුවේ පහළට බැසීමි. සාලය තුළ අසරණව මම වට පිට බැලීමි. ආලෝකවත්ව තිබූ එහි සැඟවීමට කිසිදු තැනක් නොවීය. මා අවදියෙන් සිටින බවත් ශෙරිල්ට දැනගැනීමට ඉඩතැබිය නොහැක.

ඇගේ අඩි හඬ ළඟාම ඇසෙන්නට විය. තව මිනිත්තුවකදී ඇය මෙහි එනු ඇත. මුළුතැන්ගෙයට පැනගත් මම කබඩයක පහත සැඟවී සිටීමට බැලුවද ඒවායේ සෑම දොරක්ම වාගේ

රාමුවලට සවිකරන ලද විදුරු දොරවල් බව දැන ගතිමි. ඇය මා දකිනවා පමණක් නොව මා උමතුව හැසිරෙන බවද ඈ සිතිය හැකිය.

වහලයේ බාල්කයක්. කිසිවක් නොසිතා බාල්කයේ එල්ලුණු මම දැතින් හා දෙපයින් තිරස්ව බාල්කය බදාගෙන අඳුරුම කෙළවරට බඩ ගා ගියෙමි. අඩි විස්සක් උස් වූ සිලිම දෙස ඈති තරම් බලා ඇති ඇය මේ වතාවේ උඩ නොබලනු ඇතැයි මම සිතුවෙමි. සැඟවීමේ උපක්‍රම ගැන සිත යොමු කරමින්, විශාල ශීතකරණයෙන් නැගෙන හඬ සමඟ මුසුවන පරිදි හුස්ම ගැනීම පාලනය කරගැනීමට මම තීරණය කළෙමි.

සාලයට පැමිණි අඩි හඬින් අනතුරුව, ජංගම දුරකථනයක් රැගෙන ෂෙරිල් මුළුතැන්ගෙයට පැමිණියාය. ඇය මුලදී ඇඳ සිටි ඇඳුමින්ම සිටි නිසා නින්දට නොගොස් තිබූ බවක් පෙනුණි. දුරකථනයේ අංක එබූ ඈ එය කනටත් ගෙලටත් හිර කර තබාගෙන ශීතකරණයේ දොර ඇර එය තුළට එබී සිටියාය.

"එයාලා මෙහේ" ශීතකරණයේ දොර වසමින් ඈ කීවාය. මම හුස්ම නතර කර ගතිමි. අනෙක් අන්තයෙන් කතා කරන මිනිසෙකුගේ හඬක් මට අපැහැදිලිව යාන්තම් ඇසුණි. එයට සවන් දුන් ෂෙරිල් කතා කළාය. "කැරන් මට අසපුවෙන් කතා කළා. එතැන ඉඳලා මම එයාලා පස්සෙන් ආවා."

සවන් දෙමින් ඈ මොහොතක් ගත කළාය. "ඒක හරි" ඈ කීවාය. "මම ලැස්තියි. ඉතුරු සල්ලි ටික ලැස්ති කරගෙන එන්න."

ඇමතුම නිමා කර සාලයට ගිය ඇය දුරකථනය සෝපාව මතට විසිකරන හඬ ඇසුණි. මා හුස්ම ගැනීම අරඹද්දී ගිනිකූරක් ඉල්වෙන හඬ ඇසුණු අතර ඇය දුම්පානයට පිටතට ගිය බව මම දැන ගතිමි. මම බාල්කයෙන් බැස හැකි තරම් ප්‍රවේසමෙන් අපේ නිදන කාමරයට රිංගා ගතිමි.

"හීරෝ," ඇඳ අසල දණ නමා, මම තිඹුණු ලෙස කෙඳිරුවෙමි.



ඔහුගේ දෙනෙත් තිගැස්සී විවර වූණි. "ඇයි මේ?" හදිසියේ අවදිව ඔහු ඇසුවේය.

"මේක උගුලක්" මම යටහත් කරගත් හඬින් කීවෙමි. "ෂෙරිල් කාටද ෆෝන් එකෙන් කතා කරනවා මට ඇහුණා. එයා කිව්වා කැරන් අසපුවෙන් කතා කළාට පස්සේ අපි පස්සෙන් ආවා කියලා."

"ෂෙරිල් කතා කළේ කාටද කියලා දැන ගත්තාද?" ඇඳේ වාඩි වී පූර්ණ අවධානයෙන් යුතුව හිස කෙස් ඇඟිලිවලින් සකස් කරගනිමින් හීරෝ ඇසුවේය.

මම හිස වැනිමි.

"අපි මෙහෙන් යමු" ඇඳුම් සකස් කරගනිමින් ඔහු කීවේය. "ෂෙරිල්ට අපිව නවත්වන්න බැරි වුණත් එයා කතා කරපු කෙනා එයි."

ඇඳ ඇතිරිල්ල යට වූ කඩුව මා ගත් අතර හීරෝ අපේ ගමන් මල්ල කරේ එල්ලා ගත්තේය. කාමරයෙන් පිටතට පැමිණ අපි වේගයෙන් තරප්පුව බැස ගත්තෙමු. සාලයට එත්ම ෂෙරිල් සඳලු තලයේ සිට ඇතුළට පා තැබුවාය.

"හේයි!" ඈ කෑගැසුවාය. "ඔයාලා මොකද කරන්නේ?"

ඒ මොහොතේම, හදිසියේම විවෘත වූ දොරින් මිනිස්සු සිව් දෙනෙක් ඇතුළට පැමිණියහ. ෂෙරිල් මඟ හැර මුළුතැන්ගෙයට යනු ඇස් කොනින් මම දුටුවෙමි. දැත් විදහා ගත් හීරෝ සටනට සූදානම්ව සිටියේය.

එක් මැරයෙකු මා වෙත කඩා පනිත්ම මා කැරකී දුන් පා පහර ඔහුගේ මුහුණේ පතිත වෙද්දී මට සතුටක් දැනුණි. ඔහු බිම ඇද වැටෙද්දී ඒ මෙක්සිකෝහි හෝටල කාමරයට කඩා වැදුණු එක් මැරයෙකු බව මම දුටුවෙමි.

"උඹ ආයෙත්" මම හුස්ම ඇද ගතිමි. මා තුළ තීතියක් නැගෙත්ම මම කඩුව කොපුවෙන් ඇද ගතිමි. මේ ටෙඩිගේ ඝාතකයින්ය. ඔවුහු එයට වන්දි ගෙවිය යුතුය.



www.sinhalaelibrary.com

එහෙත් වැටුණු හීරෝ දෙදෙනෙකු රඳවා ගත්තේය. සටන් කලාව දත් ජපන් ජාතිකයෙකු වූ අනෙකාට මුහුණ දීමට මං සූදානම් වූයෙමි. කපුටන් මෙන් හැසිරවිය හැකි දිගු මුගුරකින් ඔහු සන්නද්ධව සිටියේය. පළමු මැරයා මෙන් ඔහු එතරම් මා වෙත පනා නොපැන්න නමුත් මුගුරින් මගේ අසිපත් පහරවල් වළකමින් ඔහු මා මුල්ලකට කොටු කර ගත්තේය. බිත්තියට පිට දුන් මම පහර වළකන්නටත්, ප්‍රතිප්‍රහාර දෙන්නටත් වූයෙමි. ඔහුගේ ඉතා සමීපයට පැමිණි මිනිසා මට පා පහරක් දුන්නේය. ඔහුගේ වළලුකරින් අල්ලා, මුළු ශක්තියම යොදා පසුපසට තල්ලු කර ඇඳි මම වැටුණ මිනිසාට කඩුවේ නොකැපෙන පැත්තෙන් පහරක් දුනිමි. තවමත් කෙනෙකුට තුවාල කිරීමට මට සිතුවිල්ලක් නොවිය. ලෝහ ප්‍රතිමාවක හැල්ලෙමින් ඔහු පෙරළී ගියේය. එයට ගතවූයේ තත්පරයක් තරම් කාලයක් වුවද නිරවූ හැකින් ඉදිරියට ඒමට මට එය ප්‍රමාණවත් විය. මම කවුන්ටරය මතින් පැන මුළුතැන්ගෙයට දිව්වෙමි.

ෂෙරිල් ගැහෙමින් සින්කය යට වූ මුල්ලේ විය.

"ඇයි?" මම නැගසෙත්ම මැරයා ළඟාවන්නට විය. කවුන්ටර ලෑල්ල අල්ලාගෙන මම ඔහුට දෙවරක් පා පහර දී පසුපසට යැව්වෙමි. ඔහුගේ මුගුරු පහර කඩුවෙන් පිළිගනිමින් මම උඩ පැන නැවත සටනට යෙදුණෙමි. හීරෝ අත කඩුව තිබුණේ නම් මුගුර පැටී යන්නට ඔහු පහර දෙනු ඇත. මට එතරම් ශක්තියක් නොවිය. මුවාවෙමින් හා මග හරිමින් ඔහුව අවසන් කිරීමට පහරක් දීමට ප්‍රමාණවත් ඉඩක් ලබාගැනීමට මම වෙහෙසුණෙමි. "ඇයි මෙහෙම කළේ?" මැරයා වැළකීමට උත්සාහ කරන අතරම ඇය කෝපයටත්, කලකිරීමටත් පත් මම නැවත නැගුණෙමි.

"උඹ තව මරනවා මැරුවා, බැල්ලී!" ෂෙරිල් බෙරිහන් දුන්නාය. "මම කොහොමද දන්නේ උඹ බොරු කියනවද කියලා? මේ මිනිස්සු කියන්නේ ඇත්ත වෙන්න පුළුවන්. උඹ මගෙන් ප්‍රයෝජන ගත්තා."

සටන් කරමින් මං එළියට එන අතර ඇගේ වචන මගේ හිස තුළ දෝංකාර දෙන්නට විය. හීරෝ එක් මැරයෙකුට උඩු



ඉදිරියේ ඇද වැටෙන්නට පහර දී තිබුණි. හිමිදිරියේ හිරු එළියෙන් කාමරය හා නිල් පැහැයෙන් ආලෝකමත් වූ අතර සෙවණැලිවලට මුවාව සතුරා ප්‍රහාර කර පහරදීම අපහසු විය. මුළු ශක්තිය උපදවා, ඉදිරියට පැන, නැගසමින් සතුරාගේ අත තුවාල වන පරිදි මම කඩු පහරක් එල්ල කළෙමි. වේදනාවෙන් නැගසමින් ඔහු පැද්දී පසුපසට යද්දී අත වූ මුගුර බිම වැටුණි. එහෙත් ඔහු නැවත ඉදිරියට ආවේය. ඔහු නැවතිය නොහැකි අතර මගේ ශක්තිය හීන වන්නට විය.

"හීරෝ!" මම කෑගැසුවෙමි. මගේ වචනත් සමගම යමක් බිඳෙන විශාල ශබ්දයක් නැගුණි. කුඩා ප්‍රතිමාවක් ගත් හීරෝ දෙවැනි මැරයාගේ හිසට පහරක් එල්ල කර තිබුණි. ඔහුගේ හිස් කබල බිඳෙන හඬ අප්‍රසන්න වුවද තෘප්තියක් ගෙනාවේය. වැටුණු මැරයා වෙත හීරෝ ඇවිත වන හඬ ඇසෙත්ම මගේ සතුරාගේ ප්‍රබල පා පහරකින් මා ගුලිවී පසුපසට විසිවෙත්ම මගේ අතින් ගිලිහුණු කඩුව පියාඹා ගියේය. මට කළ හැකි එකම දෙය අත් පහරින් අත් පහර වැළකීම පමණක් වූ අතර මා ඉතා වෙහෙසට පත් වූයෙමි. එහෙත් ඒ සමගම වම් පසින් පැමිණි හීරෝ මගේ සතුරාට ඇඹි පා පහරක් එල්ල කළේය. මැරයා දෙකට නැමෙද්දී හීරෝ තවත් ක්ෂණික පා පහරකින් ඔහුව බිම ඇදුවේය.

"අපි යමු." මගේ අතින් අදිමින් හීරෝ කීවේය. අත දිගු කර කඩුව ඇහිඳ ගත් මම සුදු බුමුතුරුණෙහි තද ලේ පැල්ලමක් ඉතුරු වන පරිදි එය ඉක්මනින් පිස ගත්තෙමි.

"මාව මෙහෙ දාලා යන්නද හදන්නේ?" ෂෙරිල් කතා කළාය. "මේ මිනිස්සු මට මොනවා කරයිද?" මුළුතැන්ගෙයින් පිටතට එමින් ඇ කෑගැසුවාය. ඇ හොල්මනක් සේ කෙට්ටුව සුදුමැලිව සිටියාය. මා තුළ නැගුණ අනුකම්පාව මම මැඩ ගතිමි.

"මෙක තමුසෙගේ තීරණයක්." හීරෝ ක්ෂාන්තියෙන් කීවේය. "දැන් මිනා දෙයක් කරගන්න එකයි."

"උඹ බොරුකාරියක්" මම හඬ නැගුවෙමි. පහර දුන් කලක මෙන් ෂෙරිල් හැකිලී ගියාය. "අම්මලාගේ සල්ලි... මම්මුව, මම

දැනගන්න උඹට පුළුවන් හොලිවුඩ්වල මුහුක්කුවක ඉන්න විතරයි කියලා, සල්ලි හදාගන්න......"

"එන්න, හෙවන්" මගේ අත මෘදුව අදිමින් හීරෝ බාධා කළේය. මම පසෙකට ඇද්දෙමි. මට හැගැසීමට වුවමනා වුණි. "කොහොමද මේවගේ වැඩ කළේ?" කී මං පියවරක් ඉදිරියට තබද්දී පහර කෑ පුනයෙකු මෙන් ෂෙරිල් හැකිළුණාය. "මේ මිනිස්සුන්ට මහා අසීව මරන්න කියලා උඹ දන්නේ නැද්ද? ගන්නෙනවාද? මේක සෙල්ලමක් නෙවෙයි!"

"උන් පොරොන්දු වුණා ඔයාලාට කරදරයක් කරන්නේ නැහැ කියලා...." ෂෙරිල් කමිසය මිරිකමින් ආයාචනාත්මකව කීවාය.

මට උඹ පිළිකුල්" කෙළ ගැසූ මම ආපසු හැරුණෙමි.

"මෙණ ගහනවා!" ෂෙරිල් වැලපුණාය. "අර ගේ ඇතුළේ මාව පිච්චිලා මැරෙන්න ඇරියා. ඒකෙන් මගේ ජීවිතය විනාශ වුණා. බලපල්ලා! මේ බලපල්ලා!"

මම හැරී බැලුවෙමි. ෂෙරිල් ක්ෂණයෙන් කමිසය ඇද හිස මතින් ගලවා දැමුවාය. සිහින් පටි සහිත ඉතා තුනී කපු ඇඳුමකින් ඈ අප ඉදිරිපිට සිට ගත්තාය.

ඇගේ සිරුර අවලස්සන රතු බිබිලිවලින් වැසී තිබුණි. අත් පවා දරුණු ලෙස පිලිස්සී තිබූ අතර තුවාලවල ගල්වා තිබූ ආලේප දිලිසුණි. ඇගේ පෙනුමේ දරුණු බව දැක යම් වරදකාරී හැඟීමක් මා තුළ ජනිත වුවද මම එය පසෙකට තල්ලු කළෙමි. ඈ අප මරණය කරා යැවෙන්නට තිබුණි. "පේනවාද මට වෙලා තියෙන දෙය. මුළු ජීවිත කාලෙම මට හැංගිලා ජීවත්වෙන්න වෙනවා. මේ ඔක්කොම උඹ නිසා." ෂෙරිල්ගේ දෙනෙත් කඳුළින් දිලිසුණි. ඈ කෝපයෙන් ඉහවහා ගොස් සිටියාය. "මට දැන් සාමාන්‍ය ඇඳුමක්වත් අඳින්න බැහැ!"

"ගිනි තියපු එකේ හෙවන් නෙවෙයිනේ" හීරෝ කඩා පැන්නේය. "ඔයා උදව් කරන මිනිස්සුම තමයි ඒක කළේ"

"අපි යමු හීරෝ" මම කීවෙමි. අවසාන වතාවට මම ෂෙරිල් දෙස බැලුවෙමි. "උඹට කිසිම දෙයක් කියන්න වචනයක් නැහැ. මොනවා වුණත් කමක් නැහැ."

අප කාරප්පුව පහළට දුව එන අතරතුරදී හුස්මක් ගත් හීරෝ කතා කළේය. "දැන් මොකද කරන්නේ?"

සාක්කුවට අත දැමූ මම ෂෙරිල්ගේ මෝටර් රථයේ යතුර ගත්තෙමි. වේගයෙන් ගරාජයට දුවගොස් මෝටර් රථයට නගින අතරේ මම යතුර හීරෝ වෙතට විසි කළෙමි.

"අන්න අතන" මම කෑගැසුවෙමි. කළු ඇඳ කළු කණ්ණාඩි දමාගත් මිනිස්සු පිරිසක් අප දෙස බලා සිටියහ. ඔවුන්ගෙන් දෙදෙනෙක් අප වෙත දුව එද්දී අනෙක් පිරිස වෑන් රථයකට පැන ගත්හ. හීරෝ මෝටර් රථය වේගයෙන් පසුපසට ධාවනය කර රථ ගාලෙන් නික්මුණි.

අත් දිගු කර හීරෝගේ ආසන පටිය සකසා මම මගේ ආසන පටියද තද කරගතිමි. වේගය බාල නොකර, නළාව නාදවමින් හීරෝ අධික වේගයෙන් රිය පැදෙව්වේය.

"දකුණු පැත්ත!" කුඩා සුදු වෑන් රථයක් අප ඉදිරියට එද්දී මම කෑගැසුවෙමි. හීරෝ වහා රථය හරවා ආසන්න වූ ගැටුම වළකා ගත්තේය. පසුපස හැරී බලද්දී කළු වෑන් රථය අප වෙත වේගයෙන් එනු දුටු මම කෑගැසුවෙමි. "ඉක්මනට යමු."

"යනවා තමයි" කී හීරෝ ලොස් ඇන්ජලීස් මාවත් මිස්සේ හොලිවුඩ් කඳු බලා රථය පැදවීය. දැන් එකට අකුල්ලමින් අනතුරක් නොවේවා යි මම යාච්ඤා කළෙමි. හීරෝ වංගු සහිත අතුරු පාරකට රථය හැරවීය. ඒ මස්සේ අපි කඳුකරයේ ඉහළට නගින්නට වීමු. එහෙත් කළු වෑන් රථය මග හැරීමට අපට නොහැකි විය. ගැස්මක් සමග රථය තියුණු වංගු සහිත තවත් පාරකට හැරුණු අතර පැයට සැතපුම් හැත්තෑවක වේගයකින් වංගු හැරෙමින් රථය දිවුණි.මම දෙනෙත් තද කර වසා ගතිමි.

"හීරෝ, නවත්වන්න." මම වෙව්ලන ස්වරයෙන් කීවෙමි. ජනේලයෙන් බැලූ විට අප කොතරම් ඉහළක සිටිනවාද යනු දැක මගේ හිස කැරකෙන්නට විය.

"මුලින් අපි නොමැරුණොත් පාරේ යන සෙනඟක් මැරෙයි!"

මා ඒ දෙයට පිළිතුරක් මෙන් කිරිංග නද වූ රෝද හඬක් සමග සීඝ්‍රතර ගැටුම් හඬක් පසුපසින් ඇසුණි. කළු වෑන් රථය වැදී මාවතින් ධාවනය වූ අතර එය මෝටර් රථයක් ප්‍රපාතය අයිනේ බිත්තිය වෙත යවා තිබුණි. එය ඉවුරින් පහතට වැටීමට ආසන්නව තිබුණි. තවත් වංගුවක් ගෙන අප ඉහළට ඇදෙන්නට වූ නිසා ගැටුම කොතරම් දරුණුදැයි දැකගැනීමට මට නොහැකි විය.

"වටුමේ තත්ත්වය මීට වඩා දරුණුයි." දැනින්ම සුක්කානම අල්ලාගෙන, රථය පාලනය කරගැනීමට ගන්නා වෙහෙසින් මුහුණේ මස් පිඬු තදව හීරෝ කෑගැසුවේය. "මේ වේලාවට වාහන වැඩියි."

කළු වෑන් රථය වේගයෙන් පැමිණියද කන්ද නැග ආ අපි වේගයෙන් නගරයට ඇතුළු වූවෙමු.

"උන් මග හැරුණා වගේ" විනාඩියකට පමණ පසු හීරෝ කීවේය. උදෑසන සීතල සුළං රොද මගේ හිස කෙස් වටා දැවටෙද්දී මම දෙනෙත පියා ගතිමි.

"වේගාස්වලට ඊට පස්සේ?" හීරෝ ඇසීය.

මම හිස සැලීමි. එහි යාමට මට වුවමනා නොවුණද ආරම්භයක් සඳහා හොඳම තැන එය බව පෙනුණි.

"හෙවත්," හීරෝ සෙමින් කතා කළේය. "අපි අද බේරුණේ ඔයාගේ උසස් ප්‍රඥාව නිසා කියලා මට හිතෙනවා."

"විකාර" මම තුරුස්සන හඬින් කීමි. "කරන්න ඕනෑ දේ දැනගෙන හිටියා නම් මම කවදාවත් ශෙරිල් එක්ක එකඟ වෙන්නේ නැහැ," මම හිස වැනුවෙමි. "එයා දෙමව්පියෝ ගැන කියපු කතාව? මම හොඳටම රැවටුණා!"

"නැහැ... ඔයාට නින්ද යන්නේ නැතිව යමක් හිතට දැනුණ එක කොයි තරම් පුදුමද කියලා හිතන්න. ඒ නිසයි ඔයා



නැගිටලා පහළට ගිහින් සෙවීම කළේ. එහෙම නොකළා නම්..." හීරෝ සෙමින් හුස්ම ගත්තේය. "නින්දේදීම උන් අපිව මරලා දාන්න තිබුණා."

"ඔයා ඇහැරෙන්න තිබුණා." මම කෙඳිරුවෙමි. හීරෝගේ ප්‍රශංසාත්මක වචනයකින් තරම් කිසිම දෙයකින් මම සතුටක් නොලැබුවෙමි. හීරෝ දැඩි පුහුණුකරුවෙකු වූ අතර ජයග්‍රහණ ගැන ඔහු කතා කළේ කලාතුරකිනි. එහෙත් ඔහුගේ දිරිමත් කිරීම මට භාර ගත නොහැකි විය. මා තුළ එතරම් ප්‍රබල ප්‍රඥාවක් හෝ බුද්ධියක් සැඟවී තිබුණේ නම් ශෙරිල් පළමුවරට හැමුණු වේලාවේදී ඇය තැන සිටි ඇගේ කපටි හැසිරීම මට නොතේරුණේ ඇයි? නැතහොත් මුළු කාලය පුරාම මගේ හයවන ඉන්ද්‍රියට මා පමණ නොදැනුණේ ඇයි? මම අනුවණ ලෙස සංඥා මග හැර තිබුණෙමි - නවීන පන්නයේ මෝටර් රථය, සුඛෝපභෝගී නිවස සහ ඇය හැසිරුණ අසාමාන්‍ය ආකාරය එවැනි උඩඟුකම පා තැබීම වැළැක්වීමට නොහැකි වූයේ නම් මගේ කුසලතාවයන් දුර්වල වී තිබිය හැක.

සුක්කානම සැහැල්ලුවෙන් අල්ලා සිටින හීරෝ දෙස මම බැලුවෙමි. ඔහු පසුපස බලන කණ්ණාඩිය සකස් කළේය. "ඔහුගේ රහස? හිස තුළ නැගෙන හඬක් මගෙන් විමසුවේය. මා විශ්වාස කිරීමට අකමැති දේවල් ගැන මගේ බුද්ධිය මට ඉඟි නොකරන බව පෙනුණි.

"උන් ආපහු ඇවිදින්!" මගේ කල්පනා ලොව බිඳිමින් හීරෝ කෑගැසුවේය. අතුරු මාවතකින් ඔතුව ආ කළු වෑන් රිය වේගයෙන් අප පසු පසින් එන බව හිස හරවා බැලූ මම දුටුවෙමි. එය ඉතා සමීප වූ හෙයින් මට එහි රියදුරා දැක ගත හැකි විය. ඔහු ජපනෙකු බව පමණක් මා දැනගත් නමුත් මට ඔහු හඳුනා ගත නොහැකි විය. හීරෝ වේගය උපරිම වැඩි කළේය.

වයිනා වටුන් දෙසට අපි වේගයෙන් ඇදුණෙමු. සංඥා එළි නොතකා හීරෝ නොකඩවා ධාවනයේ යෙදුණ අතර අපැහැදිලි ලෙස වාහන පසු වුණි. අපට ප්‍රධාන මාවතට පිවිසීමට සිදුව තිබුණි.

හදිසියේම.. සයිරන් හඬ.

"ඉවරයි! ඉවරයි!" හීරෝ කෑගසද්දී පොලිස් වාහනයද පසුපස හඹා ඒමට එක්විය.

"යමු, යමු!" එය ඉතා භයානක මොහොතක් වුවද විනෝදයක් දැනී මම කෑගැසුවෙමි. හීරෝ නොදැනුවත්වම ගාය කරන්නට විය. එය තවදුරටත් විනෝදයක් නොවිය.

"අන්න!" මම කෑගැසුවෙමි. ප්‍රධාන මාර්ගයට පිවිසුම ඉදිරියේ විය. හීරෝ පැයට සැතපුම් අනූ පහක වේගයක් ගෙන තිබුණි. වාහනය පේළි දෙකක් හරහා ගොස් ඉදිරි රෝද එසවී අපි පියාඹන්නට වීමු. ඒ සමගම.........

සයිරන් හඬ නගමින්, පිවිසුම් මග අවහිර වන පරිදි පොලිස් රථ තුනක් අප ඉදිරියේ නැවතුණි. හීරෝ එක්වරම තිරිංග තද කරද්දී ආසන පටියද ඇදගෙන මගේ සිරුර ඉදිරියට විසිවුණි. වටයක් කැරකී මෝටර් රථය නැවතුණි. පසුගිය දින අනතුරේදී, පපුවේ කැපුණු තුවාලය මතම ආසන පටිය තදවීමෙන් ගිනි බෝලයක් බඳු වේදනාවක් මගේ පපුව හරහා ඇදුණේය. මම දත විසාගෙන වේදනාව තුළින් හුස්ම ගැනීමට උත්සාහ කළෙමි. මගේ ඇස්වලින් කඳුළු වැක්සෙන්නට විය.

තම ආසන පටිය ගැලවූ හීරෝ අතින් මා සිට කරගත්තේය. "ඔයාට මොකද? ඇයි මේ?" ඔහු මගේ මුහුණට අත තැබුවේය.

"මේ සීට් බෙල්ට් එක" කී මම එය මුදා හළෙමි. වේදනාව අඩුවන්නට විය. "වැන් එකට මොකද වුණේ?" මම කෙඳිරුවෙමි.

හීරෝ වට පිට බැලුවේය. "ගිහින්, උන් පැන ගන්න ඇති."

"කාර් එකෙන් බහිනවා!" කට හඬක් ගිගුම් දුන්නේය. පොලිස් නිලධාරීහු අපට කෑගසන්නට වූහ. වාහනවලින් බැසගත් ඔවුහු අප වෙත ආයුධ එල්ල කරගෙන සිටියහ.

"මට දුවලා එපා වෙලා" මම හීරෝ දෙස බලා කෙඳිරුවෙමි. යටත්වීම මෙතරම් සහනයක් බව මට කිසිදා සිතී නොතිබුණි.



මට දිවීමට තවත් තැනක් නොතිබුණි.

"අත් ඔසවා ගෙන කාර් එකෙන් බහිනවා!" කට හඬ ගෙරෙව්වේය.

"අපි බහිමු" හීරෝ කීවේය.

දෑත් ඔසවා ගත් මම රථයෙන් බැස්සෙමි. හීරෝද එසේ කළේය. ක්ෂණිකයෙන් දුව ආ නිලධාරීහු අපව රථයට හේත්තු කරගත්හ. අපිව සෝදිසි කර අපේ අත් පසුපසට අඹරවා මාංචු දමන අතරේ හීරෝත් මමත් එකිනෙකා දෙස බැලුවෙමු.

"කාර් එක ඔයාගේද?" පොලිස් කාන්තාව මා පසෙකට කැටුව යමින් ඇසුවාය. ඇයට නොතකා මම වෙනත් දිශාවකට රැගෙන යමින් සිටි හීරෝ දෙස බලා සිටින්නට වීමි. සියලුම කතාව හෙළිදරව් කිරීමට මා සූදානම් බව ඔහු දැනගත හොත් ඔහුට කුමක් සිතෙනු ඇතිදැයි මම කල්පනා කළෙමි.

"මම ඇහුවේ කාර් එක ඔයාගේද?"

ඔහුගෙන් වෙන්වීම කෙසේ දැනෙනු ඇතිදැයි මම කල්පනා කරන්නට වීමි. ඔහු මා දෙස හැරී බැලීමට උත්සාහ කළද නිලධාරීහු ඔහුව ඉදිරියට තල්ලු කරමින් සිටියහ. කාන්තාවගේ අත මගේ බාහුවේ ඉහළ තද විය. "මේ අහන්න, මිස්..."

"නැහැ" මම සිහිනෙන් මෙන් කීවෙමි. "ඒක මගේ නොවෙයි."

පොලිසිය හීරෝව වාහනයක් පිටුපසට තල්ලු කළහ. මා පියවර බාල කළ විට කාන්තාව කෑගැසුවාය. "ඉක්මන් කරනවා."

වාහනය හීරෝව රැගෙන යනු මම බලා සිටියෙමි. ඔහුගේ මුහුණ පසුපස ජනේලයෙන් දර්ශනය වූ අතර මා බලන විට ඔහු තොල් සෙලවුවේය. "මම ආදරෙයි"

මම ඉවත බලා ගතිමි. කෙනෙකු එසේ කියන විට කීමට ඇත්තේ එක් දෙයකි.

මට එය කීමට නොහැකි බව මම දනිමි.

# 6.



"තීමන්ලා කොහොමද ඒ කාර් එක ඉස්සුවේ?" තරබාරු පොලිස් නිලධාරියා වාහනයේ ඉදිරි හා පසුපස අසුන් වෙන් කරන යකඩ දැල තුළින් කතා කළේය. මම ඔහුව නොසලකා හැරියෙමි.

"ඔව්" පොලිස් කාන්තාව කතා කළාය. "කොහෙන්ද බෙවර්ලි හිල්ස්වලින්ද, නැත්නම් හයිවේස්වලින්ද?" ඔවුහු දෙදෙනාම හඬ නගා සිනාසුණහ. දෙනෙත් වසාගෙන මම ඉවසිලිවන්ත වීමට උත්සාහ කළෙමි. "නිශ්ශබ්දව සිටීමේ අයිතිය තමන්ට තියෙනවා." දැනට මා කිරීමට සිතා සිටියේද ඒ දෙයම විය.

එහෙත් සෑම දෙයක්ම ඔවුන්ට කීමට මා සූදානම්ව සිටියෙමි. සංචාරක පොලිස් නිලධාරීන් දෙදෙනෙකු සමග

දොඩවා කාලය නාස්ති කිරීම මට අවශ්‍ය නොවීය. වාහනයේ කළු වීදුරුවෙන් අඳුරුව පෙනෙන නගරය දෙස මම බලා සිටියෙමි. මගේ පරිකල්පන ඥානය දුර්වල එකක් විය. ඕගාරෝ සිටියේ... කුඹුව ආවේ ආරම්භකයෙකුගේ වාසනාවයි... ඔහු බියපත් වූ, කළකට නැති පුද්ගලයෙකු බව ඕනෑම මෝඩයෙකුට දැකිය හැකිය. මා කළේ ඔහු බිය වැද්දීමයි. ශෙරිල්ගේ නපුරු තුළත් ඕරෝගේ අතීත රහසක් දැනගැනීමට මං අපොහොසත් වීමි.

"ඔන්න ආවා." තරබාරු නිලධාරියා කී අතර එය ඈත දුරකින් එන හඬක් මෙන් ඇසිණි.

අප පොලීසියට අසු නොවුණේ නම් යකුසා මිනිස්සු අපව අල්ලා ගන්නට තිබුණි. නැතහොත් වෙනත් කවුරුන් හෝ විය හැක. ඒ කවුද? මා දැනගෙන තිබූ කරුණු එකතු වී නවත් විශාල ප්‍රශ්නයක් නිර්මාණය වුණි.

හුදෙකලාව දිවීමෙන් මගේ ජීවිතයට සිදුවන දෙය මට පෙනේ.. කෙටි වීම. ජීවිතය රැක ගැනීමට එකම අවස්ථාව මගේ සම්පූර්ණ කතාව හෙළිදරව් කර කරදර වෙනත් කෙනෙකුට භාරදීමයි.

අපි පොලිස් ගොඩනැඟිල්ල තුළට ඇතුළු වීමු. මා අපේක්ෂා නොකළ කලබලකාරී පරිසරයක් එහි වුවද ලිපි ගොනු ගොඩ ගැසී තිබියදී සමහර නිලධාරීන් ඇවිදිමින් කෝපි බොමින් සිටියදී සමහරු මාංචු දමන ලද සැකකරුවන්ව ඇඟිලි සලකුණු ගැනීමේ අංශය වෙතට ලුහුසුලුව රැගෙන එමින් සිටියහ. ඇඟිලි සලකුණු ගැනීමේදී රස්තියාදුකාරයෙකු නිලධාරියාට කඩා පනිද්දී ඔහුගේ මුහුණ රතුවිය. රස්තියාදුකාරයා තුමක් කර තිබුණිදැයි මම කල්පනා කළෙමි. නිලධාරියෙක් අඩි හතක් පමණ උස් වූ මෝස්තර රැජිනක් ඇඟිලි සලකුණු මේසය වෙතට ඇදගෙන ආවේය. එහෙත් තරබාරු නිලධාරියා මාව නිලධාරිනියට භාර කළ හෙයින් මට කවදුරටත් එම දසුන දැකගත නොහැකි විය.

ඉවතට කැඳවා යනු ලබමින් සිටි හීරෝගේ ඡායා මාතෘකක් දැකගැනීමට හැකි විය. නිලධාරිනිය මාව ඉදිරි මේසය වෙතට ඇදගෙන ගිය පසු එහි සිටි ලිපිකාර නිලධාරිනිය මගේ සාක්ෂි

හිස් කළාය.

මෙහිදී මා ද අපරාධකාරියක ලෙස පෙනුණි.

"නම?" නිලධාරිනිය ඇසුවාය.

"හෙවන් කෝගෙ" එට පිටාව නිරීක්ෂණය කරමින් මම කීවෙමි. එය සිනමා පටයකදී මෙන් විය. නගරයේ සිහියමින් හා අවශ්‍ය කරන අපරාධකරුවන්ගේත්, අතුරුදහන් ළමුන්ගේත් ඡායාරූප බිත්තිය මත තිබුණි. මම ඒවා දෙස හොඳින් බැලීමි... ඔව්, මම ද එහි සිටියෙමි. විවාහ මංගල්‍ය දින ව්‍යසනයෙන් පසුව පුවත්පත්වලට පෙන්වූ මගේ ඡායාරූපයම එහි විය. මගේ අතුරුදහන් වීම වර්තා කළේ කවුදැයි ඒ වනතුරු ද මම දැන නොසිටියෙමි. අවසාන වතාවට පියා හමුවූ අවස්ථාවේදී ඔහු එය නොකළ බව කියා තිබුණි.

ලිපිකාරිනිය ගල් ගැසුණාය. "ආයෙත් කියන්න?"

"හෙවන් කෝගෙ" මම ඉවසිලිවන්තව කීවෙමි. "මම අර බිත්තියේ ඉන්නවා."

"හැන්ක්" මගේ පින්තූර සහිත දැන්වීම පුවරුව යට වූ මේසයක් අසල සිටි නිලධාරියෙකු අමතා ලිපිකාරිනිය කතා කළාය. "අර පෝස්ටරය ගන්න."

"මොයි එකද?" ඔහු කෑගැසීය.

"හෙවන් කෝගෙ" මාව දක්වමින් ඇ කීවාය. හැන්ක් කොළය ගලවා රැගෙන ආවේය.

"ඔයා කොණ්ඩය වෙනස් කරලා" මා දෙසත්, අනතුරුව පින්තූරය දෙසත් බලමින් හැන්ක් කීවේය. එය මීට අවුරුදු දෙකකට ඉහතදී ගත් එකක් විය. මා කොතරම් ළාබාල ලෙස පෙනුණේද යන්න ඇදහිය නොහැකි විය. දිගු කොණ්ඩය හා හිස මත අභිෂේකයක්, මගේ මුහුණ වඩාත් රවුම්ව පෙනුණි. පිහිතුම් තටාකය අසලදී මගේ මිතුරියක ගත් එම ඡායාරූපය විශාල කර තිබුණි.



ලිපිකාරිනිය මගේ මුදල් පසුම්බිය ගෙන රෝස් මිතුරුව ඉවියදී මට ලබාදුන් ව්‍යාජ හැඳුනුම්පත එළියට ගත්තාය. "ජොන්සන්?" ඇහිබැමි උස් කරමින් ඇ කීවාය. "හෙවන් නැලීමි. "කමක් නැහැ" ඇ කීවාය. "හැන්ක්, රහස් පරීක්ෂක වොවර්ට කතා කරන්න. එයා මිනී වෙනවා මේ වැඩේට" ඇය මා කවුන්ටරය වෙත කැටුව ගිය පසුව පොලිස් කාන්තාව මගේ මාංචු ඉවත් කළාය.

ඇඟිලි සලකුණු ගැනීමෙන් පසු අත් සෝදා ගැනීමට අවසර දීමෙන් අනතුරුව කාන්තාව මා කැඳවා ප්‍රශ්න කිරීමේ කාමරයකට ගියාය. ලෝහ මේසය අසල මම වාඩි වූයෙමි. නැවත මට මාංචු ඇමූ කාන්තාව දොර වසාගෙන පිටව ගියාය.

ජනේල නොමැති සීතල කාමරයේ එක් බිත්තියක් දිගට කණ්ණාඩියක් වූ අතර එය පිටතින් පමණක් ඇතුළත බැලිය හැකි වීදුරුවක් බව මම දැන ගත්තෙමි. කැමරාවක් ඇතිදැයි මම වටපිට බැලුවෙමි. ඔව්, මුල්ලේ ඉහළ එකක් විය. සිලිමෙන් විදුලි බුබුලක් එල්ලෙමින් තිබුණි.

විනාඩි කීපයකට පසු විවෘත වූ දොරින්, පොඩි වූ දුඹුරු කලිසමක් හා සුදු කමිසයක් හැඳි උස් කෙට්ටු මිනිසෙක් ඇතුළට ආවේය. අවුරුදු තිස්පහක් පමණ වූ ඔහු දිගු කලක් නොනිදා වෙහෙසව සිටි කෙනෙක් මෙන් විය.

"හායි, හෙවන්" ඔහු කීවේය. "මම රහස් පරීක්ෂක වොවර්. කාල් වොවර්" ඔහුගේ දෙනෙත් ළා නිල් පැහැවිය. සිනාමුසු ඔහු කරුණාවන්ත බව මට පෙනුණි.

"හායි" අසුනින් එසවෙමින් මම කීවෙමි.

"ඔයාට බඩගිනි ඇති කියලා මම හිතුවා." කී ඔහු බීම බෝතලයක් හා ලොකු මාළු බනිසයක් මේසය මත තැබීය.

"ස්තූතියි" මම හිස සලා කීවෙමි. මා පසුපසට පැමිණි ඔහු මගේ මාංචු ගලවා දැමුවේය.

"දැන් හොඳද?" ඔහු ඇසුවේය.



www.sinhalaelibrary.com

"හුගක් හොඳයි." මම දත් පිරිමදිමින් කීවෙමි. දත් ඔසවා, ඇඟිලි කැඩු මම කීප උගුරක් බී මාළු බනිසය හපන්නට විමි. මා හද කුසගින්නෙන සිටි බව මට දැනුණේ එවිටයි.

රහස් පරීක්ෂක වොවර් වාඩි වී පටිගත කිරීමේ යන්ත්‍රයක් ඔහු ඉදිරියේ තබාගත්තේය. "මම හිතනවා අපි ඔයාව මෙහාට ගෙනාවේ ඇයි කියලා දන්නවා ඇති?"

"මාස කීපයකට ඉස්සර ප්‍රවෘත්තිවලට මගේ පින්තූරය පෙන්නුවා මම දැක්කා." මුව පිරී තිබියදී මම කීවෙමි. ආහාර කැබලි ස්වල්පයක් මුවින් විසිවුණි.

"කනගාටුයි. හුගක් බඩගිනියි."

"ඒකට කමක් නැහැ" ඔහු සිනාවක් පෑවේය. "ඉවර කරන්නකෝ. ඊට පස්සේ මුල ඉඳලා මම අහන්න පටන් ගන්නම්."

"මොකක්ද මුල" මම මෙවර අතින් මුව වසා ගෙන ඇසුවෙමි.

"හොඳයි. මගුල් ආ දා ඉඳලා?" රහස් පරීක්ෂක වොවර් පෑනෙන් මේසයට සෙමින් තට්ටු කරමින් ඇසුවේය. ඔහු වැනි කෙනෙකු මගෙන් ප්‍රශ්න කිරීම ගැන මම සතුටු වූවෙමි. මගේ කතාව කීම ඉන් බොහෝ පහසු වනු ඇත.

"තව එක දෙයක්" ඔහු කීවේය. "මම මේවා ටේප් කරනවා."

මගේ උගුර මදක් හිරවුණි. "මට තේරෙන්නේ නැහැ...... මේක පාපොච්චාරණයක් නොවෙයි නේද?"

"නැහැ. ඒත් හොරකම් කරපු කාර් එකක් තියෙනවා?"

"ඒත් අපිට වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ." මම කීවෙමි. "ඒ මිනිස්සු පහර දෙද්දී අපිට එතැනින් පැනලා එන්න සිද්ධ වුණා..."

"නවත්වන්න, නවත්වන්න!" රහස් පරීක්ෂක වොවර් කීවේය.



"අපි එතැනට පසුව එමු. මම මේක ටේප් කරන්නේ ඔයාගේ ආරක්ෂාවට. ඒ ඔයාගේ කතාවේ සාක්ෂියක් හැටියට."

මම දෙගිඩියාවෙන් පසු විමි. හදිසියේම මා දන්නා දේවල් බලධාරීන්ට කීමේ යථාර්ථය මා වෙලා ගන්නට විය. එම් කෝගෝ පවුලේ අප්‍රසන්න කටයුතු හෙළිදරව් කිරීමේ අනතුරුව ඊළඟට සිදුවන දේ පාලනය කිරීමට මට නොහැකි වෙයි.

එහෙත් මට අවශ්‍ය එය නොවේද?

"ඉතින් මගුල් ආ දා" රහස් පරීක්ෂක වොවර් පටිගත කිරීමේ රතු බොත්තම ඔබමින් ආරම්භ කළේය.

"මේවා පටන් ගන්නේ ඊට ඉස්සර" බිම උගුරක් බොමින් මා කීවෙමි. "ඒක දිග කතාවක්."

"මම අහගෙන ඉන්නම්" ඔහු කීවේය. "කියලා බලන්න."

"හොඳයි" මම ආරම්භ කළෙමි. "මේක පටන් ගන්නේ මගේ තාත්තා මට ටෙඩී යකඩුරාව කසාද බඳින්න යෝජනාව ගෙනා දා ඉඳලා....."

එය කීමට මා සිතුවාට වඩා කල් ගතවිය. මගේ වචන ගලා එන විට ඒවා ඇදහීමට නොහැකි කලක මෙන් රහස් පරීක්ෂකයාගේ මුහුණ වෙනස් විය. මගේ පියා ටෙඩී යකඩුරාගේ යෝජනාව නොගෙනාවේ නම් මේ කියන දේවල් වෙනස් වන්නට තිබුණේද? ඔහිගෝ තවමත් ජීවත් වන්නට තිබුණේද? මා තවමත් ටෝකියෝ හි පලකට නැති ජීවිතයක් ගත කරමින් ඉන්නට තිබුණේද? කෙසේ වෙතත් ඉරණමින් ගැලවීමක් නැත.

ටෙඩීගේ මරණය ගැන කියන විට මගේ උගුර හිර වෙන්නට විය. "උන්... උන් ටෙඩීට වෙඩි තිබ්බා..." මම ගොත ගැසුවෙමි. "මම තාරකින් කැගැහුවා. ඒත් දැන් එයා මැරිලා."

රහස් පරීක්ෂක වොවර් මොහොතක් ව්‍යාකූලව බැලුවේය. "මට දැනෙයි මේ දේවල් අහන්න සිද්ධවෙන එක ගැන" ඔහු කීවේය. "ඒත් ඔයා අවසාන වතාවට ටෙඩීව දැක්කේ කොයි

වෙලාවේද?"

"උන් ටෙඩිව ජනේලයෙන් එළියට තල්ලු කළා." මම කීමි. "නැතිනම් එයා පැන්නා. එයා ලේ ගලමින් හිටියේ."

"ඔයා මිනිය දැක්කාද?" රහස් පරීක්ෂක ඇසුවේය.

"නැහැ. උන් මාවයි හීරෝවයි පහළට ගෙනෙද්දී මිනිය තිබුණේ නැහැ. උන් මහා තිරිසන්නු" මම බිම උගුරක් බිව්වෙමි. "ටෙඩි මැරුණා කියලා යෝජි පිළිගත්තේ නැහැ."

"ටිකක් ඉන්න.... ඔයා යෝජි යකමුරාට කතා කළාද?"

"මට ඒ ටික මග හැරුණා." කී මම හීරෝ හා මා යෝජි සැන්ඩියාගෝ වලට පැන ආ හැටි හා මිගාරෝ අපව යෝජි වෙතට යොමු කළ ආකාරය පැහැදිලි කළෙමි. හීරෝ හා යෝජි අතර ඇතිවූ සංවාදය හැර ඔහු හමුවීම මම ලුහුඬුව කීවෙමි. හීරෝ පිළිබඳ පොලිසිය වැරදි වැටහීමක් ඇති කරගැනීමට මට ඉඩදිය නොහැකි විය.

පටිගත කිරීම අවසාන කරන බොත්තම එබූ රහස් පරීක්ෂක වොචර් උගුර පාදුවේය. " අපි තත්පරයකට එතැනින් නවතිමු" ඔහු කීවේය. "ඔයා දැනගන්න ඕනෑ දෙයක් තියෙනවා."

මම මත් වූ දෙනෙතින් ඔහු දෙස බැලුවෙමි. "මගේ තාත්තා ගැනද?" වෙව්ලන ස්වරයෙන් මම ඇසීමි. වේගාස් වෙත ආ දින සිට ඔහු ගැන තොරතුරක් මට ලැබී නොතිබුණි. ඔහුට සිහිය ලැබීමට හෝ මියගොස් තිබීමට පුළුවන.

"නැහැ. ඒක නෙවෙයි" ඔහු කීවේය. "ටෙඩි යකමුරා ජීවතුන් අතර"

"මොකනවා?" හුස්ම ඉහළට ඇදගත් මම අසුනේ සෘජු වෙමින් කීවෙමි. "ඒක වෙන්න බැහැ, මට හොඳටම විශ්වාසයි එයා ජනේලයෙන් පහළට වැටුණා කියලා."

"ඔව්, මම දන්නවා. ඒත් ඔයාම කියනවා මිනියක් තිබුණේ නැහැ කියලා. අපේ නිලධාරීන් ටෙඩි මෙහේ ලොස් ඇන්ජලීස්වල



ඉන්නවා දැකලා තියෙනවා."

"නැහැ" මම හිස වැනීමි. "ටෙඩි අපිව මේ විදිහට අමාරුවේ දාන්නේ නැහැ. එයා මට හුඟක් සලකනවා."

"මට කනගාටුයි, හෙවන්. ඒත් ඒක ඇත්ත." ලිපි ගොනුවක් විවෘත කළ ඔහු එය මා වෙතට තල්ලු කළේය. ඡායාරූප රැසක් විය. ටෙඩි රාත්‍රී සමාජ ශාලාවකට යන අයුරු, ටෙඩි සුදු තරුණියෙකු සමග කතා කරන අයුරු, ඔවුන්ගේ මුහුණුවල බැරෑරුම් පෙනුමක්. ටෙඩි හා මිනිසුන් පිරිසක් මෝටර් රථයකට නගින අයුරු.

"මේවා ඊයේ රෑ හොලිවුඩ්වල හෝටලයකදී ගත්ත ඒවා."

"මට තේරෙන්නේ නැහැ." ඡායාරූප දෙස නෙත් හෙළාගෙන මම කීවෙමි. ටෙඩි ජීවතුන් අතර සිටීම ගැන මා බොහෝ සතුටු වුවද ඔහු එලෙස මා අතහැර ගියේ කෙසේදැයි මම පුදුම වීමි.

"මිනිහා බේරෙන්න බොරු රඟපෑමක් කරන්න ඇති. මම දන්නේ නැහැ ටෙඩි මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අපට අවශ්‍ය කරන මිනිහෙක් කියන එක ඔයා දන්නවාද කියලා. හෙවන්. අපි දන්නවා මිනිහා පෙරිසෝසා කියලා පවුලක් හරහා කොලොම්බියානුවෝ එක්ක ගනුදෙනු කරනවා කියලා."

එසේ නම් එය සැබෑවකි. ටෙඩි මට බොරු කර තිබුණි. යම් අමිහිරි දෙයකින් මගේ උගුර හිරවෙද්දී මම මේසය තදින් අල්ලා ගතිමි. ඔහු මා ගැන කිසිසේත් නොසලකා තිබුණි. ඔහු විනාශ මුඛය ආසන්නයේ සිටින දුගඳ හමන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙක් පමණි. ඔහු වරක් මා සමග පැරිසියට යන්නට බලාපොරොත්තු වූවේ එහි හොඳ ගනුදෙනුකරුවෙකු වීමට විය හැක. මගේ කුස තුළ පෙරළියක් විය.

"මඟුල්දාට පසු වෙනිදා මට මෙහාට එන්නයි තිබුණේ" කලකිරීමෙන් වෙළෙමින් මම කීවෙමි. "මම කරපු හැමදෙයක්ම අවුල් වුණා. මට දැනගන්න ලැබුණු එකම දෙය හැම දෙනෙක්ම බොරු කියනවා කියන එක විතරයි." මම රහස් පරීක්ෂක

වොචර් දෙස බැලුවෙමි. "මේක තේරුම් ගන්න" අඩුම තරමේ එක් පුද්ගලයකු හෝ සිදුව ඇති දේවල් වටහා ගනු ඇතැයි සිතා මම ආයාචනා කළෙමි.

"ඒ දවස්වල මම කිසිම දෙයක් නොදන්න අහිංසු කෙනෙක්. එයා මම දැනගෙන හිටියේ කාන්තාගේ ගෙදර ගැන විතරයි. එයා යකුසා පාතාලයට සම්බන්ධ කෙනෙක් කියලා මම දැනගෙන හිටියේ නැහැ."

"අපි ඔයාට උදව් කරනවා, හෙවින්. ඔයත් අපිට උදව් කරන්න ඕනෑ." ඔහු උතුර පැදුවේය. "ටෙඩිව අල්ලා ගන්න ඔයා අපිට උදව් කරන්න ඕනෑ."

එය ප්‍රියජනක සිතුවිල්ලක් විය. ටෙඩී කමකට නැති සියල්ලෙක් පමණක් විය. මට එය වැටහේ.

"අපට සාක්ෂි අවශ්‍ය නැහැ. අපට අවශ්‍ය මිනිහාව අල්ලාගන්න විතරයි. අපේ නිලධාරීන්ට ඊයේ ඊ මිනිහාව මග හැරිලා. ඔයාට පුළුවන් වෙයි මිනිහා ඉන්න තැනක් හොයාගන්න."

"මම ඒක දන්නේ නැහැ." මා එය දැන සිටියේ නම් ගොයා ගොස් ඔහුගේ හිස ගසා දැමීමට තරම් මට සිත්වී තිබුණි.

රහස් පරීක්ෂක වොචර් තළල රැලි ගැන්වූවේය. "මිනිහාගේ ෆෝන් නම්බර් එක?"

මම හිස සැලුවෙමි. "ඒක මා ළඟ තියෙනවා. ඒත් ඒකෙන් ඇති වැඩිය මොකක්ද?"

"හොඳයි" රහස් පරීක්ෂක වොචර් කතා කළේය. "එහෙනම් හරි, ඔයා මිනිහාට කතා කරලා හම්බවෙන්න තැනක් යොදාගන්න. එතකොට අපි මිනිහාව අල්ලා ගන්නවා."

මම ඇසුවෙමි. "හොඳයි, මම ඒක නොකළොත්?" මම ඇසීමි.

"අවංකවමද?" මඳ කතාගාවුවකින් සිනාසී රහස් පරීක්ෂක



වොචර් කීවේය.

"අපිට කරන්න පුළුවන් දෙයක් නැහැ. අපිට පුළුවන් කාර් එක සම්බන්ධව ඔයාව හඳුනාගන්න විතරයි. එහෙම වුණත් ඔයාට වැඩිකල් මෙහේ ඉන්න ලැබෙන්නේ නැහැ. එහෙම වුණත් එකක් නැතිවීම ගැන තවම කවුරුවත් පැමිණිලි කරලා නැහැ. ඒත් ඔයාට අපේ ආරක්ෂාව අවශ්‍යයි. අවංකවම මම හිතන්නේ යකුඩාලා කොයි තරම් භයානකද කියන එක ඔයා තේරුම් අරගෙන නැහැ. මේ හැමදේම සැලසුම් කළේ ඔයාට නෙමෙයි කියලා ඔයා කොහොමද හිතන්නේ? මේ කාලෙවලදී ටෙඩී ඔයාව රැවැට්ටුවේ නැද්ද?"

මම සුසුමක් හෙළුවෙමි. "මම දන්නේ කොහොමද?" මා දැන සිටියේ අන් අය කියා තිබූ දේ පමණි. ටෙඩී සිත් පිත් නැති මිත්‍රද්‍රෝහී ජාවාරම්කාරයෙකු බව විශ්වාස කිරීමට තවමත් මගේ සිත මට ඉඩ නොදේ. තම පියාගේ අභිලාෂයන් ඉටුකිරීමට නොහැකි නිහුවකාර අයෙකු ලෙස විනා ඔහු අනුකම්පා විරහිත පුද්ගලයෙකු ලෙස මා දැක නොතිබුණි.

නැහැ. ටෙඩී දුර්වලයෙකි. ඔහු පරාජිතයෙකි. තමා මියගොස් ඇති බව මට ඒත්තු ගන්වා බේරී පලා ගිය ඔහු පොලිසියට කොටු කරදිය යුතුය. එහෙත් කිකිකෝගේ මරණයට හෝ මගේ පියාට සිදුවූ දෙයට ඔහු වගකිව යුතු නැති බව මම දනිමි.

"මම ඒක නොකළොත් මට මොනවා සිද්ධ වෙයිද?" උදව් කිරීමට මට ඇති වුවමනාවක් තිබුණද මට ඇති වාසි හරි හැටි දැනගැනීමට මට අවශ්‍ය විය.

රහස් පරීක්ෂක වොචර් බැරෑරුම් ලෙස බැලීය. "මගේ උසස් නිලධාරීන් ටෙඩීව අල්ලාගන්න උනන්දුවෙන් ඉන්නේ. අපි හුඟක් කල් ඉඳලා ඇහැ ගහගෙන ඉන්නේ. ඔයා අපිට උදව් නොකළොත් ඒ අය වැඩේ අමාරු කරයි. ඇමරිකා - ජපන් සම්මුතිය සම්බන්ධව වැඩකරන අයගේ හැටි දන්නවා, නේද?" රහස් පරීක්ෂකයා දෙබෑම එසේවීවේය. "ඒක හරක දෙයක් කියලා අපි කවුරුත් දන්නවා."

"ඇත්තෙන්ම නෑ." මම කීවෙමි. ඔහු කියන සියලුදේ මම වටහා ගතිමි. ජපාන පොලීසිය මැදිහත් වී පරීක්ෂණ කළහොත් වෝනා පොලීසියට උදව් කරන බව යකුසා සියල්ල එළිදරව් වන අතර මා පොලීසියට උදව් කරන බව යකුසා පාතාල පවුල් දැන ගතහොත් එය අවසානය වනු ඇත. මගේ ජීවිතයත් නොව බොහෝ වරක් වෙන්දේසි වනු ඇත.

මේ මගේ දිවි රැකගත යුතු වේලාවයි.

"මම ඒක කරන්නම්." මම ස්ථිරව කීවෙමි.

"ඒ ගැන මට සතුටුයි." රහස් පරීක්ෂක වොවර් කීවේය. ඔහු පරිගණ කරන යන්ත්‍රය නැවත ක්‍රියාත්මක කළේය. "එතකොට වයයි හීරෝසි සාර් එකෙන් ඇවිදින් අහු වුණේ කොහොමද?"

මම කතාවේ ඉතිරිය නොසඟවා කීවෙමි. ටෙඩි ජීවතුන් අතර සිටින නිසා සියල්ල වෙනස්ව තිබුණි. හීරෝෂ් මාත් මෙතැනින් ගැලවුණ පසු තුමක් කරන්නද? ටෙඩි ජීවතුන් අතර බව යෝජ් දැන තිබුණේද? එය එසේ බව පෙනුණි. ඒ ගැන ඔහු බොරු කීවේ නම් ඔහු කියා තිබුණේ සෑම දෙයක් ගැනම බොරු විය යුතුය.

"බොහොම අපූරුයි, හෙවන්." රහස් පරීක්ෂක වොවර් ඔරලෝසුව දෙස බලමින් කීවේය. "දැන් ඇති."

"වේලාව කීයද?" මම ඇසුවෙමි.

"මධ්‍යාන්නය වෙලා" ඔහු කීවේය. මිවිතව මම ඇස් පිය හෙළිමි. අපි පැය හතරක් පුරා කතා කර තිබුණෙමු.

"දැන් මොකක්ද?" මම ඇසුවෙමි.

"හොඳයි වැදගත්ම දෙය ඔයාගේ ආරක්ෂාව, මේක තමයි හුගක්ම ආරක්ෂිත තැන, නිර්මැව්දිරියක් තමයි දෙන්න වෙන්නේ.. ඒක පහසුකම් ලැබෙයි."

"තනියම ඉන්න තැනක් නම් හොඳයි" මම කීවෙමි. "ඒත් හීරෝ කොහෙද?"

"මම හොයලා බලන්නම්" රහස් පරීක්ෂක වොවර් කීවේය.

ඔහු මේසය යට වූ බොත්තමක් එබූ අතර සුපුරුදු පොලිස් කාන්තාව පැමිණ නැවත මගේ මාංචු ඇඳුවාය. "මේක නීතිය." ඇ සමාව අයදින කලක මෙන් කීවාය.

අපි ගොඩනැගිල්ල හරහා යමින් කළෙළුං උදයට වඩා එය පැහැදිලි බවක් පෙනුණි. "ම, හුගක් වෙනස්." මම කීවෙමි.

"ඔව්, ඉරිදා උදේ හුගක් නරකයි...... සෙනසුරාදා රෑ අපිට හුගක් වැඩ." ඇ කීවාය.

එය සති අන්තය බව මට අමතක වී තිබුණි. කරන්නට දෙයක් හෝ යන්නට තැනක් නැති විට දින ඉබේ ගතවී යයි.

ගොඩනැගිල්ලේ වෙනත් අංශයක් වෙත ගිය පසු මැදිරි සමූහයක් ලෙස පෙනුණ දොරවල් අතරින් ඇ මා කැටුව ගියාය. යකඩ කූරු පිටුපස වූ ඇඳන් හා බංකු මත නිදන කාන්තාවන් දකගන්නට ලැබුණි. විලාසිතා රැජිනද එහි වූ අතර අඩි උස පාවහන් ගලවා සිටි ඇ අඩි හතක් උස නැති බව පෙනුණි. කෙටි සාය හා කොට කලිසම්වලින් සැරසුණු බොහෝ තරුණියෝ ලී බංකු මත දෙපා පද්දමින් සිටියහ. පසුගිය රාත්‍රියේ ගැල්වූ දුහුණු ආලේප වියකුණ විදි සරන්නියන්ගේ දෙනෙත් වඩා තදව පෙනුණි.

"මම කට්ටියක් එක්ක වැටෙන්නේ නැහැ, නේද?" යකඩ කූරුවලින් මෑත් වෙමින් මම ඇසුවෙමි.

"බයවෙන්න එපා, ළමයෝ" ඇ කීවාය. "අපි ඔයාව අධි ආරක්ෂිත මැදිරියට දානවා."

"මොනවා?" මම කම්පනය වීමි. "ඇයි?"

"ඒක හිස්" ඇ සතුටට පත්ව කීවාය. "ඔයාට වෙනම කාමරයක් ලැබෙයි. සුව පහසු එකක්"

"හේයි, බෝනික්කා" පපුව නිරවත සේ සිහින් ඇඳුමකින් සැරසුණු මගේ වයසේ තරුණියක් කෑගැසුවාය. "එන්නකෝ අපේ එකට"

www.sinhalaelibrary.com

"ඔව්, නෝනා" තව එකියක් කෑගැසුවාය. "මොකක්ද එයාගේ විශේෂය?"

"කට වහනවා" පොලිස් කාන්තාව කෑගැසුවාය. "පරිස්සම් වෙනවා."

අප තවත් දොරකින් ඇතුළු වෙද්දී සිවරුහම් හඬ හා උසුළු විසුළු හඬ බිත්ති අතර රැව් දෙන්නට විය. කාන්තාව යකඩ කූරු දොර විවෘත කළ විට මම ඇතුළට පා තැබුවෙමි. මගේ මාංචු ඉවත් කළ ඈ දොර වසා දැමුවාය. ඇඳක්, හෝදන බේසමක් හා වැසිකිළියක් එහි විය. තවත් මිනිත්තු කිපයකින් පැමිණි ආරක්ෂකයෙක් පොරෝනා කීපයක් හා කොට්ටයක් දොරට යටින් මා වෙතට තල්ලු කළේය.

"දැන් හුගක් පහසුවෙයි." ඔහු කීවේය. එක් ඇතිරිල්ලක් ගත් මම එය ගසා ඇඳ මත එළුවෙමි. අනින් පොරෝනය ගෙන කොට්ටය ඇඳ මත දමා මා වැතිරෙන්නට සූදානම් වෙත්ම කොරිඩෝවේ කොහේ හෝ යකඩ දොරක් විවෘත වන හඬ මට ඇසුණි. මොහොතකට අනතුරුව, නිලධාරියෙක් විසින් කැටුව පනු ලැබූ හීරෝ ඇවිද ආවේය.

"හීරෝ!" කෑගැසූ මම යකඩ කූරු වෙතට දුව ගියෙමි. එතුළින් මා අත් දිගු කළද මාංචු නිසා ඔහුට මා ස්පර්ශ කළ නොහැකි විය. ඔහු ඔවුන්ට කුමක් කියා තිබුණිදැයි දැන ගැනීමට ඉඟියක් ඇති දැයි දැකගැනීමට මම ඔහුගේ මුහුණ දෙස බලාගෙන යකඩ කූරු තදින් අල්ලා ගතිමි.

"මාව නිදහස් කළා, හෙවන්" ඔහු සුදුමැලි මුහුණින් යුතුව කීවේය. "ඔයා හැම දෙයක්ම කිව්වා" එය ප්‍රශ්නයක් නොව ප්‍රකාශයක් විය.

"ඔව්" මම කීවෙමි. "කරන්න තිබුණේ එච්චරයි."

"ඔයාට කරදරයක් නැද්ද?" ඔහු ඇසුවේය. මා ගැන සැලකිලිමත් එකම පුද්ගලයා හීරෝ පමණක් බව මට පෙනුණි. මම හිස සැලුවෙමි. අත දිගුකර ඔහුගේ මුහුණ ස්පර්ශ කිරීමට මට අවශ්‍ය වුවද යමක් මා ඉන් වළකනුවේය. මම යකඩ කූරු



වෙතින් ඈත් වූයෙමි. වෙන කළ හැකි දෙයක් නොවූ බව ඔහුට නොතේරේද? ඔහුට එය තේරුම් ගැනීමට අපහසු ඇයි? කෙසේ වෙතත් දැන් නිදහස් වී සිටින ඔහුට අවශ්‍ය නම් මා අමතක කර ඉවත බලාගත හැක.

"හෙවන්... කරපු දේ හරියි කියලා හිතෙනවාද?"

"ටෙඩි ජීවකුන් අතර" මම කෝපයෙන් කීවෙමි.

හීරෝගේ දෙනෙත් මහත්වුණි. "විශ්වාසද? ඔයා කොහොමද.."

"මම දන්නවා" ඔහුව වළකමින් මම තියුණු ලෙස කීවෙමි. "මම කියන දෙය විශ්වාස කරන්න."

හීරෝ හිස වැනුවේය. "ඒකෙන් වෙනසක් සිද්ධ වෙන්නේ නැහැ. මිනිහා මොනවා කළත් වැඩක් නැහැ."

ටෙඩි ජීවකුන් අතර සිටින ප්‍රවෘත්තිය හීරෝ බැරෑරුම් ලෙස සලකනු ඇතැයි මා සිතුවද ඔහු එය නොසැලකීම මට පුදුමයක් විය. ඔහුගේ පවුල හා යකුසා පාතාලකරුවන් සමඟ සම්බන්ධය නිසා බොරුකීම සිහිවූ මම තවත් පසුපසට ගියෙමි.

"ප්‍රධානම දෙය මේ ගැන පොලිසිය කරන්න යන්නේ මොකක්ද කියන එකයි, හෙවන්" ඔහු කීවේය. ඔහු බොරු කළේ මගේ සිත ගැනීමට බව මම දැන සිටියෙමි. කෙසේ වෙතත් ටෙඩි නම් කවුද යන්න වසන් කර නොතිබුණි.

"දැන් ඒක ඉවරයි හීරෝ." වෙහෙස මා වෙළා ගනිද්දී මම කීවෙමි. ඔහු දෙස බැලීමෙන් මට කිසිවක් නොහැඟුණි. "මට මේක තවත් කරන්න බැහැ." ඉන් කුමක් අදහස් වුවද එය සත්‍ය පමණක් බව මම දැන සිටියෙමි.

හීරෝගේ දෙනෙත දිලිසුණ අතර පසුපසට පියවර තැබූ ඔහු ආරක්ෂකයාට ඔහුව කැටුව යාමට ඉඩ කළේය.

ඇඳේ ගුළි වූ මම ඉකි බිඳින්නට වීමි.

තෙත් ගඩොල්වලින් හැමූ ගඳ, කම්බුලට දැනෙන

පොරෝනයේ රළ බව සියපත් තට හැඩවල්. තීගරෝගේ උණුසුම සිරුර ස්පර්ශ කිරීමට මම අත දිගු කළෙමි.

මගේ දෙනෙත නිරුත්සාහී විවෘත වුණි. තීගරෝ නැත. කිසිවක් නැත. අළු පැහැ සිලිමක්. මා කොහේද?"

"හෝටන්!" ජපන් කට හඬක් ඇසුණි. මා සිහිනයක් දකිමින් සිටියා විය නැත. "හුගක් කල්ගත වුණා."

අවදි වී මම ඉක්මනින් වාඩි වුණෙමි. රළ පොරෝනය මගේ ඉණ වටා එතී තිබුණි. මගේ ටී-ෂර්ටයත් නිස කොටුත් දාඩියෙන් තෙත් වී තිබුණි. මා සිටියේ ලොස් ඇන්ජලීස්හි සිර මැදිරියක. කෙට්ටු ජපන් ජාතිකයෙක් මැදිරියේ යකඩ කූරු අසල හිටගෙන සිටියේය. ඉතා වටිනා ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි ඔහු උපැස් පැළඳ සිටියේය. ඔහු තරමක හුරුපුරුදු බවක් පෙනුණි... මම දෙනෙත් පියා ගතිමි. මා නිදි අතරේදී මා සැනසීමට එවන ලද දූත ආත්මයක්ද?

එහෙත් මා නැවත දෙනෙත් විවර කරන විට ඔහු තවමත් එහි විය. හදිසියේම මට සියල්ල සිහිපත් වුණි. මසාතෝ, මීකෝගේ සහෝදරයා - මගේ මාමා. ඔහු මට ප්‍රථම වතාවට හමු වූයේ මඟුල් දින රාත්‍රියේදීය.එය සැබෑ හමුවීමක් නොවේ. එහෙත් මගේ පියා පල්ලියේ ආසන මැදින් මා කැඳවා යන විටදී ඔහු මා දෙස නෙත් දල්වා සිටිනු මට මතකය. දැනුම් තේරුම් එන කාලයේදී මා මසාතෝ මාමා ගැන නිතර අසා තිබුණ අතර ඔහු තෝගෝ පවුලේ මධ්‍යම ඇමරිකානු ව්‍යාපාර බලාගන්නා බව මම දැනගතිමි. එහෙත් මා දන්නා තරමින් ඔහු අපව බැලීමට කිසිදින ජපානයට පැමිණ නොතිබුණි.

"මසාතෝ මාමා" හිස පහත් කළ මම මඳක් ගැහෙන ස්වරයෙන් කීවෙමි. ඒ නිදිමතත්, හදිසි ආවේගයත් හේතුවෙනි. මීකෝගේ දුවට අනපේක්ෂිත සහනයක් විය.

"ඔයාව හොයාගත්ත බව කියන්න පොලීසිය ඔයාගේ අම්මාට කතා කළා." මසාතෝ කීවේය. අධ්‍යක්ෂ මණ්ඩලය අමතා කතාවක් කරන කලක පරිදි සෘජුව සිට ගත් ඔහු



චාරිත්‍රානුකූලව කතා කළේය. "එයා මට කිව්වා ඇවිදින් ඔයාව බලන්න කියලා."

කොරිඩෝව තුළ දෝංකාරය දුන් අඩි හඬක් සමග පැමිණි ආරක්ෂකයෙක් මැදිරියේ දොර විවෘත කළේය. අපව සංවාද කාමරයකට කැඳවූ යනු ලැබීමෙන් අනතුරුව මම මාමා ඉදිරියේ වාඩි වුණෙමි.

"මම රහස් පරීක්ෂක වොට්ස් එක්කත් කතා කළා. ඔයා මගේ ආරක්ෂාව යටතේ ඉන්න තීරණය කරනවා නම් කරන්න ඕනෑ හැම දෙයක්ම කරනවා කියලා මම එයාට පොරොන්දු වුණා."

"ස්තූතියි, මාමේ" මම නැවත හිස නමා කීවෙමි. ඔහුගේ සිත දිනා ගැනීමට මා එසේ කළද ඔහු යෝජනා කරන්නේ කුමක්දැයි මට නොවැටහුණි. "රහස් පරීක්ෂකයා කිව්වාද, ටෙඩි යසුමුරා ගැන?"

"ඔව්. ඔය මිනිහා හරිම ලැජ්ජාවක්. ජීවිතය හොඳටම අවුල් කරගත්තා. රහස් පරීක්ෂකයා කිව්වා මිනිහාව අල්ලාගන්න ඔයා උදව් කරන්න කැමතියි කියලා."

මම හිස සැලුවෙමි.

මසාතෝ සුසුමක් හෙළුවේය. "ඔයා මාර්ගයෙන් මේ මිනිස්සුන්ගේ කැත වැඩ කරවා ගන්න එක මම අනුමත කරන්නේ නැති වුණත් අනිත් අතට මම විශ්වාස කරනවා එයාලා ඔයාට කරදරයක් නැතිව රටින් පිටවෙලා යන්න වැඩ පහසු කරයි කියලා."

"ඒක හරි දෙය කියලා හිතනවාද?" මාමාගේ මුහුණ දෙස හොඳින් බලමින් මම ඇසුවෙමි. මීකෝගේ සමාන හැඩහුරුකම් පැහැදිලිව දැකගත හැකි විය. ඇස හා නාසය...... එමෙන්ම මීකෝගේ නොපහන් බව හා නැන්පත් බව. එහෙත් මීකෝ තුළ නොවූ දීප්තියක් මම දැක ගතිමි. ඔහුට ශක්තිය දුන් ඇතුළාන්තයේ වූ ජීවයක්. දෙදෙනාම පිටතින් නැන්පත් වුවද මීකෝ දුර්වල චරිතයක් ලෙසද මසාතෝ දැඩි බවක් ගත් බවද

පෙනුණි.

"හරි වැරදි කාටද කියන්න පුළුවන්? ඒක යකුමුරා කොල්ලාට සිද්ධ වෙන දෙයක් වෙයි... අනිත් ඔයාව අතහැරලා ගිය එකෙත් ජෝනට මිනිහා තමන් ගැන විතරක් හිතන ආත්මාර්ථකාමියෙක් කියලා. බයගුල්ලෙක්. සමහර විට පොලීසියට අහුවුණොත් එකෙත් හැදෙයි... යෝජිස් මිනිහාගේ මෝඩ ගැතියි කොල්ලාව නරක් කළා. කුඩම්මා කියන විදිහට, ඒ අය ළමයා ගැන හොයලා බලන වැඩි එකෙත් ළමයා නරක් වුණා."

මම ආශාවෙන් අසා සිටියෙමි. මගේ පවුලේ වැඩිහිටියෝ හෝ මගේ පවුලේ වටපිටාවේ සිටි කිසිවෙකු එවැනි දේ එලෙස කතා කර නොතිබුණි.

මා මෙන්ම ඕපාදූපවලට මසාහෝ මාමාද කැමති බව පෙනුණ අතර අපි අතර එක හෝ සමාන කමක් තිබීම ගැන මම සතුටු වූයෙමි. එහෙත් ඔහු තවමත් ඇමරිකාවේ සිටින මිනිසෙකි.

"මේ කරදරයෙන් පස්සේ," මසාහෝ තවදුරටත් කීවේය. "මම ඔයාව ජපානයට එක්ක යන්නම්. මේවා. ඉවරයක් වෙනතුරු ඔයාට මගේ ගෙදර නවතින්න පුළුවන්. ඒක හුඟක් ආරක්ෂිතයි."

"සමාවෙන්න මාමේ," මම කීවෙමි. "ඔයා මඟුල් ගෙදර ආවාට ඔයා ඇමරිකාවේ නැවතිලා හිටියා නේද?"

"නැහැ, නැහැ" කී මසාහෝ මේසය මත දෑත් විහිදා කල්පනාවෙන් යුතුව නියපොතු දෙස බැලුවේය. "ඊට පස්සේ හදිසියේම මම කොස්ටාරිකාවලට ගියා. මෙහෙත් කාටවත් මගෙන් ප්‍රයෝජනයක් නැහැ. ඊත් ඔයාගේ තාත්තාට පහරදීලා සිහි නැතිව ඉන්නවා කියලා ආරංචි වුණ වහාම මම ජපානයට ගියා. අක්කාට, ඔයාගේ කුඩම්මාට ව්‍යාපාර බලාගන්න උදව් කරන්න."

මීකෝ කුඩම්මා පියාගේ ව්‍යාපාර පාලනය කරන බව මට අලුත් ආරංචියක් විය. තම ඇඳුම් රාජ්‍යය පමණක් පිළිවෙලට



නඩාගත හැකි වැදගැම්මකට නැති කුඩම්මාට එවැනි දෙයක් කිරීමට හැකියාවක් තිබූ බව මම සිහිනෙන් හෝ සිතා නොතිබුණි. මසාහෝ සියලු දේ මෙහෙයවන්නට ඇති බව පෙනුණ නමුත් වසර විස්සක් පුරා ජපානයේ නොසිටි ඔහුට වඩා පවුලට වඩාද සමීප උපදේශකයින් තාත්තාට සිටි බව මම දැන සිටියෙමි.

"තාත්තාට කොහොමද?" මම ඉක්මනින් ඇසීමි.

"කොනිෂි තවම ඒ වාගේ. සමහර දොස්තරලා කියනවා තවදාහරි නැගිටියි කියලා. තවත් සමහරු කියනවා බලාපොරොත්තු තියාගන්න අමාරුයි කියලා." මසාහෝ අසතුටුයෙන් අත වැනීය. "පරීක්ෂණ කරලා අන්තිමට කවුරුත් කියන්නේ එකම දෙය" මසාහෝ සුසුමක් හෙළුවේය. ඔහු අපූරු චරිතයකි. මගේ පියා ඉක්මනින් සුවපත් ගැනීමට හදිස්සියක් ඔහුට නැති බව මට හැඟුණි. මීකෝගෙන් ඔහු මාව ආරක්ෂා කරගන්නේ කෙසේද යන්න මගේ ප්‍රශ්නය විය. එය ඇසීමට සිත් වුණද ඔහු හා මීකෝ කොතරම් සමීපද යන්න දැන ගන්නා තුරු එය කල් දැමීමට මම තීරණය කළෙමි.

"මඟුල් ගෙදරට තින්ජාව එව්වේ කවුද කියලා දන්නවාද?" මම ඇසුවෙමි.

"මීකෝයි මමයි හොඳම මිනිස්සු යෙදෙව්වා. මමත් තනිවම සෝදිසි කළා. දන්නවානේ, කුඩම්මා මේ වැඩවලදී පස්ස ගහනවා." මම මඳ සිනාවක් පෑවෙමි. ඇ සංශයික කල්පනාකාරියකි. මොනවා යෝජනා කළද එය නොගැළපෙන දෙයක් ලෙස ඇ නිතර සලකයි.

"මම හිතන්නේ අපි අපරාධකාරයාව හොයාගෙන තියෙනවා කියලා හෙවත්" මසාහෝ උපැස් යුවළ නාසය මතට තල්ලු කරමින් කීවේය. "පාවා දෙන්නෙත්, කෝනිගේ පවුලට හුඟක් කිට්ටු කෙනෙක්. කොනිෂි මේක කළා වගේ පෙනෙන්න හොඳින් දන්නා කෙනෙක් කරවලා තියෙන්නේ.

"කවුද?" මගේ පියාගේ උපදේශකයින් හා සමීප මිතුරන්



www.sinhalaelibrary.com

සිනේ මවා ගනිමින් මම ඇසුවෙමි.

"හා, හා, හා" මසාහෝ මා දෙසට ඇඟිල්ල වනමින් කීවේය. "වේලාව ආවට පස්සේ, අපි ජපානයට ගිහාම, අපි එකතු කරගත්ත සාක්ෂි මම පෙන්වන්නම්. එතකොට ප්‍රහාරය සැලසුම් කරපු මිනිහාගේ මුහුණ ඔයාට දැකගන්න පුළුවන්..... ඊට පස්සේ ඔයාට පළිගන්න පුළුවන්."

"ඒකට කොයි තරම් කල් යයිද?" දත් මිට මොලවමින් මම ඇසීමි. මගේ සහෝදරයා මැරූ මිනිසුන් ගැන සිතන විට, සටනකට පෙර පුපුරුළු ලෙස සිදුවන පරිදි මගේ දත් දෙපා රත්වෙන්නාක් මෙන් දැනුණි.

"මාසයක්, හෝ ඊට අඩුවෙන්." මසාහෝ දෙවුර සලා ඉදිරියට නැඹුරු විය. "ඒ නිසයි ඔයා මා එක්ක ජපානයට එන්න ඕනෑ. මෙහේ ඉන්නවාට වඩා එහේ ආරක්ෂිතයි. අනික තාත්තාට සනීප වෙද්දී ඔයා ළඟ ඉන්න ඕනෑ.

"ඒ සනීප වුණොත්." මම නිරස ලෙස කීවෙමි. ඔහු අවදිවනු ඇතැයි බලාපොරොත්තුව දිනෙන් දින මා වෙතින් දුරස්වන්නට විය.

"එයාට සනීප වෙනවා ඒක විශ්වාස කරන්න. ඔයාගේ තාත්තා හුගක් ශක්තිමත් මිනිහෙක්. නයෙක් වගේ දරුණුයි." මසාහෝ දිලිසෙන දෑසින් යුතුව මිට මොලවූ අත එසෙව්වේය. මම අසුනේ හැකිළුණෙමි. ඔහු තුළ සැබෑ කෝපයක් විය. ඉන් ඔහුගේ පක්ෂපාතීත්වය පෙනුණි. අනෙක් අතට ඔහුගේ යකුසා පාතාල සම්බන්ධතාම කොතරම් ගැඹුරට දිවුණේ දැයි මම නොදනිමි. අනෙක් අයට මෙන්ම ඔහුටද නොසිට හැරීමට හැකි වූ අතර පියා පුව තොටුව මහත් කෝගෝ යකුමුරා වෛරය අවසන් කිරීමට ඔහු කටයුතු කරනු ඇතැයි විශ්වාස කිරීමට හේතුවක් නොවීය.

"ඇත්තටම, මාමේ" මම විඩාබර දෙනෙත් පිස ගනිමින් කතා කළෙමි. "පසුගිය මාස කීපයේදී කෝගෝ ව්‍යාපාර ගැන හැම දෙයක්ම මම දැනගත්තා. මම නොමේරූ කෙනෙක්



වෙන්න පුළුවන්. ඒත් අපේ පවුල කරන දේවල් දැනගන්න එක සම්ප්‍රදායක්." ඔහුද ඒවා අනුමත නොකරන්නේ නම් එළු ඒ ගැන මා සමග කීමට ඔහුව පොළඹවා ගැනීමට මට අවශ්‍ය වූවද සැබෑ දේවල් කීමෙන් ඔහුව බිය වැද්දීමට මට වුවමනා නොවීය.

උපැස් යුවළ තුළින් දැවි කරගත් දෙනෙතින් මසාහෝ මා මොහොතක් නිරීක්ෂණය කළේය. "මම වයස ඇට්ටකාලේ කෝගෝ ව්‍යාපාරවල ලොක්කා වුණේ කොහොමද කියලා දන්නවාද?"

"නැහැ" මම හිස වැනුවෙමි. "කවුරුවත් ඒ ගැන කිව්වේ නැහැ."

"ඒක හරි" ඇත ලුහු දෙනෙත් රඳවාගෙන කල්පනාවෙන් යුතුව මසාහෝ කීවේය. "මම වැඩට ආවට පස්සේ දැනගත්තා අක්කා කරන්න යන දේ. ඒ වෙන කොට අක්කාගේ විවාහය ලියාපදිංචි කරලා නම් ප්‍රසිද්ධ කරලා ඉවරයි. මඟුල් ඇඳුමත් හදලා..... මේවා දැනගත්තාට පස්සේ මම අක්කාට පිංසෙණ්ඩු වුණා මිනිහාව බඳින්න එපා කියලා....."

"යකුසා සම්බන්ධය නිසා?" මම ඇසීමි.

"ෂ්, ෂ්!" මසාහෝ අනතුරු ඇඟෙව්වේය. "නරකම වචනයක්. අපි කියමු 'බිස්නස් එක' කියලා. ඒ කාලය හුගක් වෙනස්. අද කාලයේ වගේ තරුණ අය වැඩ කළේ නැහැ. ඒ කාලයේ නම් ප්‍රසිද්ධ කළාට පස්සේ ඒක ඉවරයි. විවාහ ගිවිසුම කැඩුණොත් ඒක පවුලට ලොකු ලැජ්ජාවක්. මිනෙකුට තවදුරටත් වෙන කෙනෙක්ව බඳින්න ලැබෙන්නේ නැහැ. මිනිස්සු කියන්නේ එතකොට කැඩුණු බඩුවක් වගේ කියලා."

මා ටෙඩී සමග විවාහ වන බව ඔහුගේ පියා ප්‍රකාශ කරන විට මිතෝ අනුකම්පා විරහිත වූයේ ඇයිද යන්න දැන් පැහැදිලි විය. ඇයට කරන්නට සිදුවූ දෙය මාද කළ යුතු යැයි ඇ සිතුවා විය හැක.

"විශ්වාස කරන්න බැහැ. ඒත් කනගාටුවෙන් වුණේ කොහොමහරි නිවැරදි පාඩම ඇත්ත." මසාහෝ තවදුරටත් කීවේය.

වැටෙයි කියලා බලාපොරොත්තුවෙන් මම බිස්නස් එකට උදව් කරන්න පොරොන්දු වුණා. මිනෝරු දරුවෙක් ලැබෙන්න ඉද්දී ඔයාගේ අභිජාත සහෝදරයා ශිනිතෝ, මම හිතුවා මිනිහා වෙනස් වෙයි කියලා. එතකොට මිනිහා හුඟක් දුර ගිහින්. මේ ගැන කතා කරපු හැම වේලාවකම මිනිහා මාව මැස්සෙක් වගේ පන්නා ගත්තා. ඔව් කරදරකාර මැස්සෙක් වගේ."

මම මසාතෝ දෙස බැලීමි. ඔහුගේ ස්වරයෙහි කෝපයක් ගැබ් නොවුණි. එය මට බොහෝ ඉහත වෙනත් කෙනෙකුට සිදුවූ දෙයක් පිළිබඳව කතාවක් කියන්නාක් බඳුවිය. ඔහු කෝපයෙන් තොරවීම ගැන මම පුදුම වීම, කිසිවෙකු තමා කියන දෙය පිළිගන්නා විට මට ඇති වී තිබුණි.

"ඒත් ඔයා දන්නවා," මසාතෝ කීවේය. "කෝගෝ පවුලේ නීත්‍යානුකූල ව්‍යාපාර හුඟක් තියෙනවා. තාත්තාට මාව වදයක් වෙලා මට ඇමරිකාවේ ව්‍යාපාර බලාගන්න මාව එව්වා. මම කොස්ටාරිකා, ගෝතමාලා, නිකරගුවා වගේ රටවලට ආදරය කරන්න පටන් ගත්තා. නොදැනීම අවුරුදු ගතවෙද්දී මම මගේම ජීවිතයක් ගොඩනගා ගත්තා."

"ජපානය අල එන්න දුක හිතුණේ නැද්ද?" ජීවිත කාලය පුරා ඇමරිකාවේ නැවතීමට මට සිදු වුවහොත් දැනෙනා හැඟීම ගැන සිතාගැනීමට උත්සාහ කරමින් මම ඇසුවෙමි.

"මුලදී" මසාතෝ සෙමින් කීවේය. "මිනිස්සු පෙනුණේ මිලේච්ඡයෝ වගේ. කෑම කන්න බැහැ. කොහොම වුණත් ඔයාගේ තාත්තා හොඳ මිනිහෙක්. මට ජපන් පන්නයට ගෙයක් හදලා දුන්නා. ටෝකියෝවලින් කෝකියෙක් එව්වා. කොස්ටාරිකාවේ මුහුදු කෑම හරිම අපූරුයි. අනික මම ආපහු ගියා නම් අක්කාට කරදර වෙනවා. මගේ දෙමව්පියෝ මැරිලා. මම බැඳලා නැහැ.... නිවාඩුවට නිව්යෝර්ක්. නැති නම් ටස්කනිවලට යනවා. ස්විට්සර්- ලන්තයට යනවා හිම ක්‍රීඩාවලට. කොහොම වුණත් හරිම අපූරු ජීවිතයක්. මට දුක්වෙන්න දෙයක් නැහැ."

සිතුවිලි එකාග්‍රව තබාගැනීමට උත්සාහ කරමින් මම නැවතත් දෑස පිස ගතිමි. "ඔයා හිතනවාද තාත්තාට තේරුම්



කරලා දෙන්න පුළුවන් කියලා. තරහ මිනිස්සු එක්ක සම්බන්ධය නවත්වන්න" අවසාන මොහොතේ එම වචනයට මාමාගේ ඇති පිළිකුල සිහි කඩා ගනිමින් මම ඇසුවෙමි.

"ඇයි බැරි? මැරෙන්න ආසන්න වුණ නිසා මිනිහා ඒ ගැන හිතයි. මම දන්නා තරමින් මිනිහා ඔයාට හුඟක් ආදරෙයි."

"මම දන්නේ නැහැ" විනීත වීමට උත්සාහ කරමින් මම කීවෙමි. කොහොමත් කෝගෝගේ බැඳීම ආදරය නොවීය.

මසාතෝ මා නොසැලකීය. "සමහර විට ඔයා ජපානයට ඇවිදින් එයා සනීප වෙනතුරු ළඟ ඉන්නවා නම් සිද්ධ වුණ දේවල් නිසා, කැමති වෙයි."

"ඔයා එහෙම හිතනවාද?" පොඩි දරුවෙකු සේ අපේක්ෂා පිරි ස්වරයකින් මම ඇසුවෙමි. මට අවශ්‍ය වූයේ කිසිවක් නොව මගේ පියා ආපසු එමයි, මුලදී මා දැන සිටි ආකාරයේ සාධාරණ ව්‍යාපාරිකයා වීමයි; ධනවත් ව්‍යාපාරිකයෙකු මෙන්ම සමහර විට සැර පරුෂ පියා වීමයි; අපරාධ රජකු වනවාට වඩා එය ඉතා යහපත්ය.

"කවුද දන්නේ?" මසාතෝ කීවේය. "දැන් මිනිහාට වයසයි. මහිකෝන් නැති එකේ සම්බන්ධ අඩු කරන එක පාඩුවක් නැහැ. ගහේ මුලට පහර වැදිලා තියෙද්දී කොළ දෙක තුනක් වැටුණාට මොකද?"

"ඒකට මොකද?" මම එම වචන ප්‍රතිරාවය කළෙමි. එවැනි අනාගතයක් උදා කරගත හැකි බව මම විශ්වාස කළෙමි.

"ඉතින්..." මසාතෝ මෘදු හඬින් ඇසීය. "ඔයා මා එක්ක ජපානයට එනවාද?"

මම මේසය වෙතට නෙත් යොමා සිටියෙමි. මගේ මනස ව්‍යාකූල වන්නට පටන් ගත් අතර ඔහුගේ වචන සිත තුළ පාවෙමින් අවුලක් ඇති කළේය. මට නිවැරදිව කල්පනා කිරීමට අවශ්‍ය විය. ඔහු කියන කතාව මා දැනට දන්නා දේවල් සමග ගැළපෙන්නේ කෙසේද? ඔහු කියන පරිදි සියල්ලට වගකිව



www.sinhalaelibrary.com

ජුන්ගෙන් යකුළුරා පවුලයි. එහෙත් එමෙන්ම කෝගෝ හා යකුළුරා පවුල් විනාශ කිරීමට නාඳුනන වෙනත් බලවේගයක් ඇති බව ගොප් සි පරිදි මට අවබෝධ වී තිබුණි.

නැවත, පසුගිය දින කීපය තුළදී මට හරි හියාට වඩා බොහෝ වරක් මට වැරදී තිබුණි. සමහර විට ඒ කවුරුන් වුවද ආරක්ෂාව සඳහා පවුලින් පැනයාම පිළිගැනීමට කාලය මෙය විය.

දැන් මට අලුතින් ලැබුණ මාමා සිටී, ඔහුගෙන් කුමක් කරන්නද? මම හිස ඔසවා ඔහු දෙස බැලීමි. ඔහු කෙසඟ හා තරමක් දුර්වල පෙනුමින් යුතු විය. මගේ පියා තරමට නොවුණද ඔහු පහසුවෙන් තාප්තිමත් නොවන බව පෙනුණි. ඔහුගේ විශේෂ කාරුණාවන්ත බවක් නොතිබුණද නපුරු බවක්ද නොතිබුණි. සමහර විට තරමක් දුකට පත් හා හුදෙකලා බවක්.....

මගේ සිත ඉබාගාතේ යන්නට විය. ඔහු දෙස බලා සිටීම නවතා නැවත මේසය වෙත නෙත් යොමු කළ මම, මට ලැබී තිබුණ ආහාරයට ඉඩදීමට උත්සාහ කළෙමි. මට හිස් බවක් දැනුණි. ස්නායු දුර්වලවී තිබුණි. මට නිදිමත දැනෙන්නට විය.

"වේලාව කීයද?" මගේ සිතුවිලි නැවත හීරෝ ඉවා හදිස්සියේ එතෙන්නට යන බව අවබෝධ වී මම ඇසුවෙමි.

මසාහෝ ඔරලෝසුව දෙස බැලුවේය. "අටයි, කෑම වේලාව. ඔයා එනවා නම් හොඳ කෑම වේලක් කන්න පුළුවන්. හෙට පොලීසියේ වැඩේ ඉවර වුණාට පස්සේ අපි ඔයාගේ විර වාරිකාව සමරමු."

"එතකොට අපි ජපානයට ගියාට පස්සේ?" මම ඇසීමි. "මම තෝරාගන්න ඕනෑම දෙයක් කරන්න මට නිදහස තියෙනවාද?"

මසාහෝ දෙබැම එසෙව්වේය. "ඒ කියන්නේ?"

මම ධෛර්ය උපදවා ගතිමි. "මට විශ්වවිද්‍යාලයකට යන්න පුළුවන්ද? මගේ කාලසටහනකට? මට කැමති අය



හමුවෙන්න?"

"හූ" මසාහෝ කාමරය සකසා ගත්තේය. "ඔබ සිතන්නේ ඔයාගේ සතුට තරම් කිසිම දෙයක් පුළුවනටම ඕනෑ නැහැ. ඔයාගේ අධ්‍යාපනය නවත්වන්න කිසිම හේතුවක් මට පෙනෙන්නේ නැහැ. අනිත් නිදහස...... සාප්පු යන්න, හෝටලයකට යන්න හැකියි මේ තත්ත්වය පාලනය කරගන්නා තුරු ආරක්ෂකයෝ උන්න."

ජපානයට ආපසු යාම කොතරම් දෙයක් දැයි කල්පනා වනාවට මට සිතුණි. එහි අදහස මේ තාක් කල් මට අහිමි වූ සැප සම්පත් වෙත ආපසු යාමකි. අවශ්‍ය තැනක් සොයා ගැනීමට කෝකියෙක්, මට රිසි පරිදි ඇඳගැනීමට ඕනෑම අවස්ථාවකට ඇඳුම්, තව මොනවාද? මගේ පියා මට දීමට බලාපොරොත්තු වූ ජීවිතය මට ලබාගත හැකි වනු ඇත. මට විශ්වවිද්‍යාලයකට ඇතුළු වී ඉතිහාසය හෝ කලාව සම්බන්ධ උපාධියක් කළ හැක. ඒ අතර විවේකය. පිහිනන්නත්, පොත් කියවන්නත්. තව...... තව......

රිහිකෝ නැත. මගේ මිතුරියන් විදේශ ගතව ඇත. මා ඔවුන් දැකීමට උත්සාහ නොකළද මිකෝ මා ඇගුම් නොකරයි. තවද හීරෝ.

"එතකොට...." කියන්නට ගිය දෙය මම ගිල ගතිමි.

"මොකද?" මසාහෝ අපේක්ෂාවෙන් යුතුව දෙබැම එසෙව්වේය.

හීරෝ කොහේදැයි ඇසීමට මම ආසන්න වුණෙමි. හදිසියේම එය අනවශ්‍ය බව මට සිතුණි. හීරෝ හා මා අතර කුමක් සිදුවුවද, මට තීරණයක් ගැනීමට ප්‍රමාණවත් තරම් කාලයක් හෙට වනතුරු ඇත.

"ඉතින්, මාමේ තීරණයක් ගන්න මට කාලය ඕනෑ" මගේ පියා සමග කතා කරද්දී දක්වන නිහතමානීකම දක්වමින් මම කීවෙමි. "මාමා ආවේ මට ලොකු උදව්වක් කරන්න කියන එක මම දන්නවා. කොහොම හරි ඔයාට හෙට එන්න පුළුවන්ද? එතකොට මම තීරණය කියන්නම්."

"ඇත්තටම ඔයා මේ ජරා ගොඩේ ඉන්න කැමතිද?" පිළිකුල දනවමින් ඔහු ඇසීය. "මාත් එක්ක ඇවිදින් ඒ ගැන පස්සේ හිතන්න."

"මට දැන් නිදාගෙන භාවනා කරන්න ඕනෑ." මම කීවෙමි.

"ඒක හොඳයි" පුටුව පසුපසට තල්ලු කරමින් ඔහු කීවේය. "ඔයා රාත්‍රී කෑම මතක් වී ඔහු හදිසි වී ඇති බව මට හැඟුණි. "ඔයා ආපහු ජපානයට යනවා කියලා තීරණය කළොත් මම මෙහෙට නොවෙයි අනිද්දා ඉවත් තොටුපොළට යන අතරේ මෙහාට එනවා. ටිකට් ලෑස්ති කරගෙන එනවා ඔයා කැමති නම්. තවත් ටෙව්ඩ් හොය හොයා ළතවෙනවා නම් ඒක රහස් පරීක්ෂකයාට කියන්න. ඊට පස්සේ මට කතා කරන්න. මම ඒට හරි දවාලට හරි හෙලිකොප්ටරයක් එවනවා ඔයාව අරගෙන යන්න." ඔහු නැගිටවේය. "ඔයා කරන ඕනෑම දෙයක් මම අනුමත කරනවා."

මමද නැගිට්ටෙමි. "බොහොම ස්තූතියි, මාමේ" මම හිස නමා කීවෙමි. "ඔයා මා එක්ක කතා කළ එක හුඟක් හොඳයි."

"මම ඔයාව හමුවෙන්න ඉක්මනින් එනවා, දුවේ." කී මිසාතෝ දොරට තට්ටු කළේය. තවත් හිස නමා කළ ආචාරයකින් පසුව මිසාතෝ පිටව ගිය අතර මා සිරමැදිරිය වෙත කැඳවාගෙන යනු ලැබුණි.



# 7.

පාලක මැදිරිය කාර්ය බහුල විය. සාමාන්‍ය ඇඳුමින් සැරසුණු රහස් පරීක්ෂකයෝ හා නිල ඇඳුමින් සිටි පොලිස් නිලධාරීහු කඩිමුඩියේ ඒ මේ අත ගියහ. මේස වටා පිරිස් රොත් වී සිටි අතර ග්‍රහලෝකාගාරයේ විශාල සිතියමක් බිත්තියේ ප්‍රක්ෂේපිත වී තිබූ අතර හැම දෙනෙක්ම එය අධ්‍යයනය කළහ. එය ග්‍රහලෝකාගාර භූමිය බව මා දැනගත්තේ යමෙකු එය විශාල අකුරින් ලියා තිබුණ හෙයිනි. සෝෆාව අතරින් රහස් පරීක්ෂක වොවර්ගේ හඬ පැමිණියේය.

"මෙහෙට මෙහෙන් එන්න." පිරිස අතරින් මා කැටුව යමින් ඔහු වැඩුව කීවේය. අප කාමරය හරහා යන විට මිනිස්සු කතා නවතා මහත් වූ දෙනෙතින් බැලූහ.

"ඇයි මිනිස්සු අපි දිහා බලන්නේ?" මම කෙඳිරුවෙමි.

"ඔයා කවුද කියලා කවුරුත් දන්නවා." රහස් පරීක්ෂක වොවර් කීවේය. "ඔයා මෙහේ ප්‍රසිද්ධ කතාවක්. අපි මාස ගණනක් ඔයාව හෙව්වා."

එය අමුතු හැඟීමක් විය. ජපානයේදී මම ප්‍රසිද්ධ චරිතයක් වීමි. මම කොනිෂි කෝගෝගේ දුව වීමි. මගේ පියාගේ නම ටෝකියෝහි ගෙදර දොරේ නමක් විය. එහෙත් මා සෙවීමට ඇමරිකාවේදී මෙතරම් ප්‍රයත්නයක් ගැනුණ බව මම නොදැන සිටියෙමි. එසේ වී නම් බොහෝ කලකට ඉහතදී මා හාරවන්නට තිබුණි.

දැන් මේ සියලු දෙනා ටෙව්ඩ් සොයන අතර මම ඔවුන්ට උදව් කිරීමට යමි.

මේ රහස් පරීක්ෂක මාටිනා. එයා වැටලීම ගැන විස්තර කියයි. රහස් පරීක්ෂක වොවර් මේසයක් වෙතට මා කැඳවා



www.sinhalaelibrary.com

ගෙන ගියේය. ඒ පිටුපස වාඩි වී සිටි දුඹුරු හිස කෙස් ඇති කාන්තාවක් නැගී සිටියාය. ඇය දිගු කළ අතට මා අත දුන් විට ඈ එය තදින් ග්‍රහණය කළාය.

"හායි, තෙවන් මේ උදව්ව අපි හුඟක් අගය කරනවා."

"ප්‍රශ්නයක් නැහැ," මම විශ්වාසයෙන් යුතුව කීවෙමි. ටෙඩීට දුරකථන ඇමතුමක් දී මා කළේ විශාල කාර්යයකැයි මට නොහැඟිණි. මුලදී මට ඇති වූයේ කෝපයකි. මගේ වෙව්ලන කට හඬ පාලනය කරගැනීම අසීරු විය. එහෙත් මා හමු වීමට ඔහු එක්වරම කැමති විය.



"අපි පටන් ගනිමුද?" රහස් පරීක්ෂක වොවර් කීවේය.

"හරි" මේසය අසල පුටුවේ වාඩිවෙමින් මාටිනා කීවාය. මා පුටුවක වාඩි වූ අතර වොවර් මේසය කොනක වාඩි වූවේය. "ඔයා දන්නවා අපි වැටලීම කරන්න යන්නේ ග්‍රහලෝකාගාරයේදී" මම හිස සැලීමි. අද ඒ ටෙඩී මා හමුවීමට බලාපොරොත්තුව සිටින්නේ එහිදී විය.

"සෙනඟ අතරේ මේක කරන්නේ කොහොමද?" මම



ඇසුවෙමි. "මිනිස්සු කලබල වෙයි."

රහස් පරීක්ෂිකා මාටිනා මඳ සිනාවක් පෑවාය. "ග්‍රහලෝකාගාරය මේ දවස්වල අලුත්වැඩියාවට වහලා තියෙන්නේ. වට පිටාව නරඹන කිපදෙනෙක් ඉන්න පුළුවන්. ඒත් අපි කණ්ඩායමක් යවනවා කල් ඇතිව එතැන සෝදිසි කරන්න. ඇතුළට එන පාරට අපි ඔත්තු දානවා. අපිටයි ටෙඩීටයි විතරයි ඇතුළු වෙන්න පුළුවන්."

"හුඟක් නිලධාරී?" මම කීවෙමි.

"ඔව්" වොවර් කීවේය. "ඔයාට බයවෙන්න කිසිම දෙයක් නැහැ. හැම මොහොතේම අපි ඔයාට ඇහැ ගහගෙන ඉන්නවා."

"ප්‍රශ්නය ඔයාව මයික් එකක් පලඳින්න ඕනැද කියන එක. අපිට සාක්ෂි අවශ්‍ය නැහැ. අපි ළඟ හුඟක් තියෙනවා. ඒත් වැරැද්දක් වෙලා ඔයා කලබල වුණොත් අපි වහාම දැනගන්න ඕනැ."

"මොන වගේ දෙයක්ද?" මම ඇසුවෙමි.

"හොඳයි, උදාහරණයකට, ටෙඩී ඔයා එක්ක රණ්ඩුවට ආවොත්."

"එහෙම වෙයි කියලා හිතන්න බැහැ." මම අකමැත්තෙන් කීවෙමි. "එයා මට කැමතියි."

"ඒත්........" රහස් පරීක්ෂක වොවර් කීවේය. "ඒක ඔයා හිතලා බලන්න ඕනැ දෙයක්."

"නැහැ." මම දැඩිව කීවෙමි. "මට කරදර වෙන්නෙ නැහැ." මට ටෙඩීගෙන් අසා දැනගැනීමට යම් යම් දේ විය. පොලීසියට කිසිසේත් අදාළ නොවන ඒවාට සවන් දීමට ඔවුන්ට ඉඩ දියයුතු නැත.

"ඒත් මතක තියාගන්න" රහස් පරීක්ෂක මාටිනා කීවාය. "ඔයාට මයික් එකක් පැළඳගන්න අවශ්‍ය නැති නම් අපිට

බැහැ. ඔයාලගේ කතා මහට ඇහුම් කන් දෙන්න. නමුත් ඔයාට කරදරයක් නම් අපට දැනගන්න සංඥාවක් තියෙන්න ඕනැ."

මගේ මුවට නැගී සිනාව නද කරගැනීමට සිදුවිය. වෙඩි සමග කතා බහක් මගේ ජීවිතයට තර්ජනයක් වෙමින් අවසාන වනු ඇතැයි මට සිතා ගැනීමට හෝ නොහැකි විය. ඔහු මාව වැලඳ ගැනීමට සමහර විට උත්සාහ කළ හැක.

"විකිළ වැඩක්ද?" වොවර් ඇසුවේය.

"නැහැ" යටි තොල සපමින් මම කීවෙමි. "මොකක්ද? සංඥාව"

"ඔයාට පහසු ඕනෑම දෙයක්" මාටිනා කීවාය." ඒත් අවට ඉන්න අපේ අයට පෙනෙන විදිහේ ලොකු එකක් වෙන්න ඕනැ, අනික වැරදියට තේරුම් නොගන්නා එකක්."

"කොහොමද තොප්පියක්?" මම යෝජනා කළෙමි.

"තොප්පියක්" රහස් පරීක්ෂක මාටිනා මොහොතක් ව්‍යාකූලව ඉඳ කීවාය.

"ඔව්, කැප් එකක්" මම උනන්දුවෙන් කීවෙමි. "මම ඒක දාගෙන යනවා. මොනවා හරි නරක අතට හැරුණොත් මම ඒක ගලවනවා. ඒක පැහැදිලිව පෙනෙයි මට කරදරයක් නම්."

රහස් පරීක්ෂක දෙපොළ එකිනෙකා දෙස බලාගත්හ. "ඒක හොඳයි" සිනාවක් පෑ රහස් පරීක්ෂක වොවර් කීවේය.

"එකඟයි" මාටිනා කීවාය. මට අනුවණ ආඩම්බරයක් දැනුණි. සමහර විට පෙර ආත්මයක මම රහස් පරීක්ෂිකාවක්ව සිට තිබුණා විය හැක.

"හරි" රහස් පරීක්ෂක මාටිනා නැගිටිමින් කීවාය. "මම අපේ කණ්ඩායමට සංඥාව ගැන කියන්නම්. ඊට අමතරව, ඔයා වෙඩිව එතැන විනාඩි හත හමාරක් රඳවාගන්න ඕනැ. ඒක අපේ කණ්ඩායමට කඩා පනින්න ඉස්සර සූදානම් වෙන කාලය. මෙන්න ඔරලෝසුවක් තියෙනවා. හරියට වෙලාව බලාගන්න.



පත්වෙන්න පුළුවන්."

"හරි" මම ඔරලෝසුව අතේ බැඳ ගතිමි. "ප්‍රශ්නයක් නැහැ"

"ඇත්තටම ඔව්" රහස් පරීක්ෂක වොවර් කීවේය. "අපි හට තැයකින් යන්න සූදානම් වෙමු." ඔහු මා දෙස බැලුවේය. "ඒ වෙනකුරු ඔයා මෙහේ නවතිනවාද?"

"ප්‍රශ්නයක් නැති නම්" මම කීවෙමි. කවදුරටත් හුදෙකලා වීමට මම නොකැමති වීමි. මට අවශ්‍යව තිබූ දේ කිරීමට මම සූදානම්ව සිටියෙමි. රහස් පරීක්ෂක මාටිනා ඉඳ සිනාවක් පෑවාය. "කියවන්න සඟරාවක් දෙන්නද?" කී ඈ කබඩය ඇර සඟරා ගොන්නක් පිටතට ගත්තාය.

"බොහෝ කාලයකින් කියෙව්වේ නැහැ" මම කීවෙමි.

"කියවන්න" කියමින් රහස් පරීක්ෂක වොවර් ඉවතට යන්නට වූ අතර මම ප්‍රසිද්ධ පුද්ගලයින්ගේ ඕපාදූප පිටුවක් පෙරළා ගතිමි.

* * * *

"කරදරයක් නැහැ කියලා විශ්වාසද, හෙවන්?"

"ඔව්" මම පසුපස අසුනේ සිට මගේ සපත්තු පටිය ගැට ගසා ගනිමින් කෙටියෙන් කීවෙමි. මට මේ සියල්ල ඉක්මනින් අවසාන වීම අවශ්‍ය විය. මුලදී එය දුෂ්කර ක්‍රියාවක් ලෙස පෙනී තිබුණි. කරන්නට යන දෙය මා තුළ කිඳා බසින්නට විය. පාදය පහත හෙළූ මම කැප් තොප්පිය ඒ මේ අත කරකවන්නට වීමි. වෙඩිට එය උරුම විය යුතුය. මට ඔහු හමුවන විටදී ඇතිවන කෝපය පාලනය කර ගත යුතු ආකාරය ගැන මම සිත යොමු කළෙමි. ඔහු මා අතහැර ගිය ආකාරය ඉවසිය නොහැකි වූ අතර මාව මේ තත්ත්වයට පත් කිරීම කොතරම් කරදරකාරීද?

"දැන් අහගන්න. මොනවා හරි අමුතු දෙයක් සිද්ධ වුණොත් පුළුවන් තරම් ඉක්මනින් එතැනින් පැනගන්න. අපිට විනාඩි හත හමාරක් ඕනැ සූදානම් වෙන්න. අනික ඔයා තමන්ගේ

ඥානය පාවිච්චි කරන්න. මොනවා හරි වෙනසක් වුණොත් අපි මිනිහෙක්ව එවනවා." රහස් පරීක්ෂක වොවර් මට වඩා හැකි ගස් බවක් පෙන්විය. ටෙඩී අල්ලා ගැනීම ඔහුට වැඩි වාසියක්, උපස් විශේෂඥයා විට එහි ඇති බව මට සිතුණි. ඔහු ග්‍රහලෝකාගාරය දෙසට රථය හැරවීය.

අතරමගදී ඇති වූ සංවාදයේදී, මා සිතනවාට වැඩිය ටෙඩී භයානක බව රහස් පරීක්ෂකයින් සිතන බව මට පෙනුණි. ගිනි අවියක් ලැබුණේ නම් ඔහු විටස්තරයෙකුට නොව තම කකුලට පවා වෙඩි තබාගන්නා අඥානයෙකු බව ඔවුන්ගේ අදහස විය. මෙක්සිකෝවේදී ඔහු හැසිරුණ ආකාරය ගැන මා ඊට වඩා සිහිය ප්‍රවුව තිබුණි. ඔතුල් දවසේදී ද එය ඔප්පු විය. තින්ජාගේ පැමිණීමත් සමග ඔහු සැඟව ගනිද්දී මා බේරාගැනීමට ධුව ආවේ මහිතෝසි.

අපි ග්‍රහලෝකාගාරය වෙත පැමිණියෙමු.

"මයික් එකක් මිනු නැහැ කියලා ඔයා හිතනවාද, හෙවන්" රහස් පරීක්ෂක මාටිනා නැවත ඇසුවාය. "ඒක කරගන්න අපිට තවම කාලය තියෙනවා."

"අවශ්‍ය නැහැ." ගොඩනැගිල්ලේ උස් රවුම් වහලය දෙස බලමින් මම කීවෙමි. මෙය සිනමා පට බොහෝමයක පසුතලයට යොදාගෙන තිබූ බව දැන සිටි මට මාද එවැනි ක්‍රියාදාම චිත්‍රපටයක තීරණාත්මක ජවනිකාවක් රඟ පෑමට පැමිණි කලක මෙන් හැඟීමක් ඇතිවිය. එය ඉතා මනරම් ස්ථානයක් වූ අතර ග්‍රහලෝකාගාර දර්ශනයක් නැරඹීමට අවස්ථාව නැතිවීම ගැන මම දුක්වීමි.

"හැම දෙයක්ම සූදානම් කියලා දැනගන්නා තුරු අපි මෙතැන නවතිමු." රථගාලේ නැවති බීම බෝතලයක් අතට ගනිමින් රහස් පරීක්ෂක වොවර් කීවේය.

සැලසුම ඉතා සරල විය. මම ඇමක් වීමි. මාළුවා ටෙඩීය. මට ඇතුලට යාමට හෝ පිටතට ඒමට හැකි වූ අතර හෙට මේ ජීවිතය අතහැර මට ජ්‍යානයට යාමට හැකි වනු ඇත.



"වෙලාව හරි" රහස් පරීක්ෂක මාටිනා ඇගේ කෙටි කොණ්ඩය ඇඟිලිවලින් අවුස්සමින් කීවාය. "ඔයා හරිද?"

"දහයයි හතරයි" සිනාසීමට උත්සාහ කරමින් මම කීවෙමි.

"හරි, යන්න." වොවර් හිස් බීම බෝතලය පිටත කසළ භූමියකට විසි කරමින් කීවේය. "මතක තියාගන්න, අපි මෙතැනම ඉන්නවා."

ලාංඡන නොමැති මෝටර් රථයෙන් බැස ගත් මම දොර වසා ඇමුවෙමි. හිසේ වූ කැප් තොප්පිය සකස් කරගත් මම මගේ යෝජනාව ඥානවන්ත දැයි මොහොතක් කල්පනා කළෙමි. අනුවණ බවක් දැනුණද එය පහසුවෙන්ම කළ හැකි දෙයක් බව පෙනුණි. සංඥා කිරීමක් කිසිවිට අවශ්‍ය නොවන බවට මට නැඹුරුව විශ්වාසයක් තිබුණි.

ඇඳුරුව තිබූ වටපිටාව පාළු බවක් ගත්තේය. එසේ වීමට පොලීසිය කල් ඇතිව කටයුතු කර තිබුණි. පඩි පීපය නැග යන අතරේ යම් කෝල ගතියක් මා තුළ ජනිත වුණි. අවට විදුලි පහන් දැල්වී තිබූ අතර බොහෝ දෙනෙකු මා වෙත නෙත් හෙළා සිටින කලක මෙන් මට හැඟුණ නමුත් මම අවට සිරි නරඹමින් ඉදිරියට ගියෙමි. ටෙඩී යම් මොහොතක මෙහි පැමිණෙනු ඇත. එවට කල්පනා කිරීමට අවශ්‍ය විය.

මෙය ටෙඩීව පාවා දීමක්ද? එය මගේ ප්‍රශ්නය විය. එය සැබෑවකි. එහෙත් ඔහු මා පාවා දී තිබුණි. කොයි යම් ආකාරයකින් හෝ සැම කෙනෙක්ම මා පාවාදී තිබුණි. හීරෝ පවා....... ඔහු තවම මා දැකගැනීමට බලාපොරොත්තුවෙන් හෝටලයක නැවතී සිටින බව රහස් පරීක්ෂක වොවර් කියා තිබුණි. ඔහුව හමුවීමට මට අවශ්‍යද යන්න මා පිළිතුරු සොයා නොගත් තවත් ප්‍රශ්නයකි.

"හෙවන්, මොකද වුණේ?" ටෙඩී මගේ බඳ වටා අත යැවීය. අලුත් ඇඳුමක සුවඳින් මගේ නාස් පුඩු පිරී ගියේය.

මම ඉවතට පය තැබුවෙමි. "හායි, ටෙඩී" මම මගේ

වෙව්ලන ස්වරය පාලනය කරගනිමින් කීවෙමි. "ඔයා කොහේද හිටියේ?" ඔහුට අපහාස කිරීමට ගලා ආ වචන මම ගිල ගතිමි. ඔහු මොනතරම් නියමුවූ පරාජිතයෙකුද යන වගත් මාව අතර මං කර පලා යාම හා තමා මිය ගිය බවට බොරු කිරීම ගැනත් දොස් කීමට නැඟී ආ කෝපය දත් මිටි හපමින් මම පාලනය කර ගතිමි.

මගේ කාර්ය වූයේ ඔහු සමග කතා බහ කිරීමයි. මා ඔහුට ශාප කරන්නට පටන් ගත හොත් මෙක්සිකෝවේදී සිදු වූ දේ මට දැන ගැනීමට නොහැකි වනු ඇත. මම ඔරලෝසුව දෙස බැල්මක් හෙළුවෙමි. 8.01 එය 8.08 වනතුරු මම කල් බැලිය යුතුය.

"ඔ, හෙවන් හරි පිස්සු වැඩක් වුණේ" කොට බිත්තිය මත වාඩි වී මටද වාඩි වන ලෙස ඔහු ඉඟි කළේය. "හේයි! ඔයා කොණ්ඩය කපලා!" ටෙඩ් අත දිගුකර මගේ හිස් වැසුම ඇල්លුවේය.

"එපා!" කෑගැසූ මම එය ගැලවීමෙන් ඔහු වැළැක්කිමි. වේගයෙන් ඔහුගේ අතගසා දමමින් මම මගේ අකැමැත්ත දැඩිව ප්‍රකාශ කළෙමි.

"ඔන්" ටෙඩ් තම අත පිරිමැද්දේය. "මම දකින්නට කැමති නැද්ද?" ඔහු සිත රිදුණු බවක් පෙන්විය.

"හ්ම්.... නැහැ, මේක ඒ තරම් ලස්සන නැහැ. මට හරියටම කියන්න බැහැ. මම පස්සේ පෙන්වන්නම්."

"හොඳයි" ටෙඩ් සිනාසෙමින් කීවේය. "මට තේරෙනවා. ඒක බලාගන්න මට ඕනෑ තරම් කල් තියෙනවා."

පපු කුහරය තුළ මගේ හදවත ගැහෙන්න විය. ඔහු මගේ හිස් වැසුම ගැලෙව්වේ නම් කුමන ව්‍යසනයක් වන්නට තිබුණිද?

"කොණ්ඩය හොඳටම කොටයි." ටෙඩ් මගේ හිස වටා එබී බලමින් කීවේය.

"විසිළු නෙවෙයි" මම අවඥාවෙන් කීවෙමි. මගේ කෝපය



දියවී යන්නට විය. ඒ මට හුරු පුරුදු සෙල්ලක්කාර ටෙඩ්ම විය. "මට වෙස් වළා ගෙන ඉන්න සිද්ධ වෙලා. ඔයා ඒකට කැමති නැද්ද?"

"නැහැ, ළමයෝ. ඒක හොඳයි."

මම ඔහුට ඉඩ නොදී කතා කළෙමි. "ඔයා මේ තරම් කල් මොන ලෝකයකද හිටියේ?"

"ඔ, හෙවන්" ඔහු මගේ පිට අත ගාමින් ආයාචනා කළේය.

"මම ඔයාව මෙක්සිකෝවේදී දාලා ගිය එක ගැන කනගාටුයි. ඒත් මම දැනගෙන හිටියා උන් ඔයාට කරදර කරන්නේ නැහැ කියලා. ඒත් උන්ට ඕනෑ වුණේ මාව මරන්න."

"ඇයි" ඔහුගෙන් ඉවත් වෙමින් මම ඇසුවෙමි. "මොකක්ද සිද්ධ වුණේ? පාස්පෝර්ට් අරන් එන්න ගිහින් ඊළඟ විනාඩියේ වැරයොත් එක්ක කාමරයට කඩා පැන්නා. උන් මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයෝද?" මම මගේ ඔරලෝසුව දෙස බැලුවෙමි. තවත් විනාඩි කීපයක් ගතවීමට තිබුණි. සිදුව තිබුණේ කුමක්දැයි හරියටම දැනගැනීමට මට අවශ්‍ය විය.

"උන් මත්ද්‍රව්‍යකාරයෝ නොවෙයි, හෙවන්" ටෙඩ් හිස වැනුවේය. "ඒක උපායක් උන් වැඩ කළේ මට ඕනෑ විදිහට. ඒ යකඩුරා පවුලේ මිනිස්සු."

"මොනවා?" මම හුස්මක් ඇද ගතිමි. "ටෙඩ්, කොහොමද එහෙම දෙයක් කළේ?" මම වහා පැන සිට ගත්තෙමි. පොලිස් නිලධාරීන්ව මට අමතකව තිබුණි. මම නැවත වාඩි වුණෙමි.

"ඒත්... තේරෙන්නේ නැද්ද?" ටෙඩ් ගොත ගැසුවේය. "මට ඒක කරන්න සිද්ධ වුණා! මම දන්නවා උන් ඔයාට කරදර නොකරන බව. නැතිනම් මම උන්ට ඔයයි හීරෝයි ඉන්න තැන පෙන්වන්නේ නැහැ. තාත්තා කිව්වා ඔයාව අල්ලා ගෙන ආවේ නැතිනම් අපි ඔක්කොම මරලා දානවා කියලා"

ඇදහිය නොහැකිව මම

ඔයාගේ තාත්තා එහෙම කිව්වා."



www.sinhalaelibrary.com

ඇසුවෙමි.

"ඔව් ඒත් මම දන්නවා එයා ඔයාට කරදරයක් කරන්නේ නැහැ කියලා. මම පාස්පෝට් අරගෙන ඔයාව හොයාගෙන එන්න හිටියේ, හරිද?" ටෙඩී මගේ කරවටා අත යවමින් කීවේය. "හැම දෙයක්ම සිද්ධ වුණේ හොඳට."

"ඔයාගේ තාත්තා මට බොරු කිව්වා. මම පස්සෙන් එළවන්නේ කවුද දන්නේ නැහැ කිව්වා." මම ඔහුගේ අත ඉවතට තල්ලු කළෙමි. මා බොහෝ විටක නොමග යැවූ බව පිළිගනිමින් එසේ හැසිරීමට ඔහුට හැකියාව තිබුණි. ඔහුගේ පියා ජෝර්ජ් ද කපටියෙකි. මාව හා හීරෝව නොමග යැවීය.

ටෙඩී දෙවුර සැලුවේය, "එයා නිතරම බොරු කියනවා. ඒක අලුත් දෙයක් නොවෙයි."

මම ටෙඩී දෙස මහත් වූ දෙනෙතින් බැලුවෙමි. අපි දෙදෙනාම රවටනු ලැබ තිබුණි. අපි මොනවා කළද, අපව සොයාගැනීමට ඔවුන්ට මගක් තිබුණි.

"මම කියන්නම්" ටෙඩී කතා කළේය. "අපි මේ මෝඩ වැඩය නවත්වන්න ඕනෑ. මෙතන පාස් පෝට් එකයි සල්ලියි තියෙනවා. මම දවස් කිපයකින් එනතුරු ඔයාට සාප්පු යන්න පුළුවන්. මේ ඔයා නවතින හෝටලයේ නම" යි ඔහු කබා සාක්කුවෙන් ලොකු ලිපි කවරයක් ගත්තේය. එහි බෙවර්ලි හිල්ස්හි සංකේත අංකය තිබෙනු මම දැක ගත්තෙමි.

මහත් වූ දෙනෙතින් මම එදෙස බැලුවෙමි.

"ගන්න ළමයෝ" ටෙඩී මගේ උරහිසට තට්ටු කරමින් කීවේය. ඔහු ලිපි කවරය මගේ අතට එබුවේය.

එහෙත් මට එය කළ නොහැකි විය. මම තවදුරටත් ඔවුන්ගේ කිසිම දෙයකට කැමති නොවීමි. මා සමුරායි සටන්කාරියක් බව අමතක කිරීමට මම වෙහෙසී තිබුණෙමි. මේ මිනිසුන් සතු නොවූ එක් දෙයක් මට තිබුණි. ඒ ගෞරවය.

"එපා!" මම ලිපි කවරය ආපසු ඔහු වෙතට තල්ලු කළෙමි.



"මේ අහන්න, ටෙඩී" තව මොහොතකින් රහස් පරීක්ෂක වෝල්ටර් සහ ඔහුගේ පිරිස මෙම ස්ථානය වට කර ගනු ඇතැයි සිතූ මම ඔහුගේ කමිස කොලරයෙන් අල්ලා මා වෙතට ඇද්දෙමි. "මේක උගුලක්, මාව යොදාගෙන පොලීසිය ඔයාව අල්ලගන්න යන්නේ. පොලීසිය දවස් දෙකකට ඉස්සර මාව අල්ලගත්තා. මම හැමදේම කිව්වා. මම හිතුවේ ඔයා මැරිලා කියලා. මිනීමැරුම සම්බන්ධයෙන් ඔයාව අල්ලන්න හදන්නේ."

"මොනවා?" ටෙඩී මහජන වේදිකාව දෙස බැලීය. "මට කවුරුවත් පෙනෙන්න නැහැ. මට තේරෙන්නේ නැහැ."

"අනේ ටෙඩී" මම ලිපි කවරය ඔහු වෙතට දිගු කරමින් කීවෙමි.

"ඉක්මනට මෙතැනින් යන්න. තව විනාඩියකින් එයාලා එනවා."

"විහිළුවක්ද?" ටෙඩී ඇසුවේය.

"විහිළුවක් නෙවෙයි ටෙඩී" මා කිරීමට ආසන්නව සිටි දෙය ගැන සිතී මගේ දෙනෙතින් කඳුළු ගලන්නට විය. "මෙතැනින් යන්න, යන්න!" කම්පනයට පත් වූ ටෙඩී නැගී සිටියේය. "ඒත් පැරිස් ගමන? ආයෙත් කවදාද මාව හම්බවෙන්නේ?"

මම හිස වැනිමි. "මෙතැනින් යන්න!"

හදිසියේ මගේ මුහුණ සිපගත් ඔහු යන්නට හැරුණි. පොලීසිය එන්නට පෙර ඔහුට මෝටර් රථයට යාමට හැකි වේවා යි මම ප්‍රාර්ථනා කළෙමි.

එහෙත් හදිසියේම, කළු රුවක් අහසින් පැමිණි කලක මෙන් පියාඹා පහළට ආවේය.

එක් පහරකින් ටෙඩී බිම ඇද වැටුණේය.

දොරවල් වැසෙන හා අඩි හඬ ඇසෙද්දී, කළු හැඳි රුව මා වෙතට සමීප වෙද්දී මම ගල් ගැසී නැවතුණෙමි.

නින්ජා.

මගේ සිත ඉක්මනින් ක්‍රියා කළේය. කළු හැඳි ගැට වේගයෙන් මා වෙතට එනිදදී, මම ආරම්භක ඉරියව්වට පැමිණියෙමි. පළමු ප්‍රහාරය මගේ මුල ඇට වෙතට එල්ල වූ සියපත් සා පහරක් වුවද පහතට එල්ල කළ අත් පහරකින් මම එය පහසුවෙන් වළකා ගතිමි. නින්ජා එන මාවත මග හැරීමට මම කරන්න යෝද්‍යක් මෙන් තැරැණි පසෙකට පැන ගත්තෙමි. එවිට මගේ හිස්වැසුම ගැලවී යනු දැනුණද මම එය කිසිසේත් නොතැකුවෙමි. දිගු කර ගත් දෑතින් දිවිත්ව ප්‍රහාරයකට මම ඉදිරියට පැන්නෙමි. නින්ජා මා වැළැක්කුවේය. පොලිස් පිරිස පැමිණ වේදිකාව පිරියන බව මට යාන්තමට දැනුණි. එක් තත්පරයකට හෝ මගේ අවධානය නින්ජා වෙතින් ඉවතට යන තොත් ඒ මගේ අවසානයයි.

ඇස් කොනකින්, සිමෙන්ති පොළව මත ඇතිළි වැටී ඇති ටෙඩිගේ සිරුර දැක මම කැගැසුවෙමි. "නැගිටින්න, ටෙඩී! දුවන්න, දුවන්න!

ඔහු යාන්තමට සෙලවෙනු දුටුවද ඊළගට ඔහු කරන දෙය බලාගැනීමට මට කාලයක් නොවීය. විදුලි පහන් ආලෝකය තුළට දූවිලි වලාවක් නංවමින් නින්ජා මා වේදිකා බිත්තිය දෙසට හිර කරන්නට විය. පිට පිට අත් පහර හා පා පහර - මෙකී බිත්තියෙන් පහළ තිබුණු බැවුමකි. ඔහු මා එදෙසට තල්ලු කිරීම වැළැක්වීමට මම කරණමක් ගසා ඉදිරියට පැන්නෙමි. මගේ අසිපත මා ගෙනැවිත් තිබුණේ නම්!

"හෙවන් මෙතැනින් පැත්තකට වෙන්න." රහස් පරීක්ෂක වොවර් කෑගසනු මට ඇසුණි. එහෙත් නින්ජා හා මම ඉතා සමීප සීමාවක සිටියෙමු. ඔහු සමීපවත්ම මට ඔහුගේ දෙනෙත් පෙනුණි; ඔහුගේ දැඩිය ගඳ දැනුණි. ඔහුගේ ආවරණ පහර මග හැර මම ඔහුගේ උගුරට අත් පහරක් දුනිමි. ආපසු විසිව ගොස්, හද මුස්වක් පිට කර, ඔහු මොහොතක් නතරව වියරු දෙනෙතින් පුතුව ගල් ගැසුණේය.

වෙඩි හඬක් නැගුණ අතර ඔහු නැවතත් මා වෙතට පියඹා එන්නට විය. පොලිස් නිලධාරීහු ඔහුට වෙඩි තබමින් සිටියහ. ඔවුන්ගේ ඉලක්ක නිවැරදි වේවා යි මම යාච්ඤා කළෙමි. ඔහුගේ



දෙපා යටින් වතා තැබී, ඔහු මා මත පතිත වීම වැළැක්වීමට මම සිමෙන්ති පොළව මත පෙරළී ගියෙමි. පොළොවේ ඇනුණ දණ හිස්වලින් වේදනා නැගෙද්දී පෙරළී යන මා වෙතට නින්ජා පැන්නේය. කළු ඇඳුමේ තිබූ කිනිස්සක් ගෙන ඔහු දුන් පහර මගෙ ගෙල වෙතට එත්ම මම එය වළකා ගතිමි.

ඔහුගේ මැණික් කටුවෙන් අල්ලාගත් මම [illegible] මා වෙතින් ඉවතට අල්ලා ගැනීමට පොර බැදුවෙමි. නින්ජාගේ බලාපොරොත්තු කඩ වූ බව මම දැක ගතිමි. ඔහු දිගු වේලාවක් එකම ඉරියව්වක නොසිටිය යුතුය. එය නිසියාකාර ඉලක්කයට පහර නොදුන්නොත්, එය සාර්ථක ව්‍යාකූල ක්‍රියාශීලී විය යුතුය. එක් තැනක රැඳී සිටීම සතුරාට එය ගැනීමට ඉඩදීමකි. එය සැබෑ ආත්මාරක්ෂක පටන් කලාව නොව විදි සටන් කලාවයි.

උගුරෙන් හඬක් පිටකරමින් මා දුන් පහරින් නින්ජාගේ අතින් කිනිස්ස ගිලිහී ගිය අතර අපි දෙදෙනා පෙරළෙමින් පොර බැදුවෙමු. ඒ අතරම ඔහු මගේ අත වළකමින් බිම වූ කිනිස්ස අතට ගත්තේය. මගේ මුහුණ වෙතට එන පහර වළක්වා ගන්නද පපුව මතට පහරක් එල්ල වන්න වෙත්ම දෙපා හා දෑත්වලට වෙර ගනිමින් කොන්ද මසවා මම ඔහුව පෙරළා දමන්නට උත්සාහ කළෙමි. මගේ බාහුවල ශක්තිය සිඳී ගොස් තිබුණි.

තවත් වෙඩි හඬක් නැගෙද්දී, ඊළග මොහොතේ මා වෙතට පහත් වන නින්ජාව මග හැරීමට මම පසෙකට තල්ලු වුණෙමි. නින්ජාගේ දෑස මහත් වෙද්දී, කිනිස්ස පොළව මත වැටෙන හඬ සමගින් ඔහු මගේ සිරුර මතට ඇද වැටුණි.

මුවින් හඬක් නිකුත් කරමින්, මම පහතට ආ මුළු බර මසවා පසෙකට තල්ලු කළෙමි. එහිදී මට අවශ්‍ය වූයේ මගේ මියයන සතුරාගේ මුහුණ නොදැක සිටීමයි. ඔහුගෙන් නිදහස් වන අතරම ඒ ඔහිකෝ මරා දැමූ නින්ජාම දැයි මම සිතන්නට වූ නමුත් ඔහු මීට වඩා, සමහර විට හීරෝට ද වඩා, දක්ෂ කෙනෙකු බව මට සිතා ගත හැකිවිය. මේ කාගේ හෝ කුලියට සටන් වදින තුන්වන පන්තියේ කෙනෙකි.

මොහු මා දැන සිටි ජපන් ජාතිකයෙකු බව පෙනුණද ඒ කවුදැයි මට හරි මතකයක් නොතිබුණි.

ඔහුගේ මුව කොනකින් රුධිරය වැක්කුණි. ඔහු මිය ගියේ මා නිසාදැයි සිතූ මම දෙනෙත් තද කර වසා ගතිමි.

"හෙවන්, ඔයාට මොකද?" රහස් පරීක්ෂක වොවර් මා වෙත දුව එද්දී මාටිනා ද ඒ පසුපසින් ආවාය. මා ආයාසයෙන් දෙනෙත් විවර කරද්දී ගොඩනැගිල්ල වටා සිටි, වෙඩි නොවදින ඇඳුමින් සැරසුණ පොලිස් නිලධාරීන් දුව එනු පෙනුණි. රහස් පරීක්ෂකයෝ මගේ දෑත්වලින් අදින්නට වූහ. "ඔයාට තුවාලද?"

"මට කරදරයක් නැහැ." මම කීවෙමි. එය අමුතු දෙයක් වුවද නින්ජා සමග සටන් වැදීම විනෝදයක් සේ පෙනුණි. පසුපසින් උදව් ඇති නිසා මා එලෙස සටන් කළාද යන්න මට සිතා ගත නොහැකි විය. කෙසේ වෙතත් එය අමුතු හැඟීමක් විය. වොලිබෝල් තරගයකින් දිනුව පසු එන හැඟීමක්.

"හරිම භයානක සටනක්" රහස් පරීක්ෂක මාටිනා කීවාය. "මම හිතුවේ නැහැ ඔයාට ඒ විදිහට සටන් කරන්න පුළුවන් කියලා."

ඇය දිගු කළ අතට මම අත ගැසීමි. නින්ජාව හඳුනා ගැනීමට ප්‍රමාණවත් කාලයක් තිබුණි. "පුරුදු වැඩක්" කී මම අත කලිසමේ පිස ගත්තෙමි. "ටෙඩී කොහේද?" මම ඉක්මනින් ඇසීමි.

රහස් පරීක්ෂක වොවර් දෙබැම රැලි ගැන්වීය. "පැනගත්තා. අපිට ඕනෑ වුණේ ඔයාව බේරගන්න. මිනිහා රථගාලට පැනගත්ත බව අපේ මිනිස්සු දැක්කාට හදිසියේම අතුරුදහන් වෙලා." කී රහස් පරීක්ෂකයා විමසිල්ලෙන් මා දෙස බැලුවේය. "මිනිහා මුලින් කලබල වුණේ ඇයි?"

ඔහුගේ නිල් දෙනෙත දෙස බැලූ මට ඔහු මා අනතුරු ඇඟවූ බව දැන ඇති බව වැටහුණි. "මට සැකයක් ඇති වුණා. ඒ එක්කම නින්ජා......" මම සැකයෙන් කීවෙමි.



"නින්ජලා ඔයාට හුඟක් වෙලාවට පහර දෙනවාද?" මාටිනා ඇසුවාය.

"මට මේ සිද්ධිය ගැන කනගාටුයි." මහ වැටුණ සතුරා දක්වමින් මම කීවෙමි. පොලිස් නිලධාරියෙක් රෙද්දක් ගෙන විත් සිරුර වසා දැමුවේය.

"දුක් වෙන්න එපා" මාටිනා කීවාය. "මිනිහා මැරුණේ ඔයා අතින් නොවෙයි කියලා හිත හදාගන්න."

"මම එහෙම හිතනවා." සටනේදී සිරුරට ගලා එන එන්සයිම නිසා ඇතිවන උණුසුම අඩුවන අතරේ මම කීවෙමි. "ඔයාලට නම් මේවා දැකලා පුරුදු ඇති."

"ඇත්තටම, ඕක ඒ තරම් දෙයක් නොවෙයි." මාටිනා කීවාය.

"අපි ටෙඩීව ඊළඟ වතාවේ අල්ලා ගන්නවා." රහස් පරීක්ෂක වොවර් මැදිහත් වෙමින් කීවේය. "උදව් කළාට ස්තුතියි" සුසුමක් හෙළූ ඔහු කීවේය.

"අප පොලිස් රථය වෙතට යන අතරේ මම කතා කළෙමි. "ඔයාලා අල්ලා ගන්න ඕනෑ ටෙඩීව නොවෙයි; එයාගේ තාත්තාව. මේ හැම දෙයක් පිටි පස්සේම ඉන්නේ එයා."

"අපි ඒක දන්නවා" වොවර් කීවේය. ඔහු රියදුරු අසුනට නගිමින් කතා කළේය. "ඒත් අපිට මිනිහාට විරුද්ධව නීතිමය සාක්ෂියක් නැහැ. මිනිහාට ඇමරිකාවට ඇවිදින් ඕනෑම දෙයක් කරන්න පුළුවන්. අපි මිනිහා අපරාධයක් කරද්දීම අල්ලා ගන්න ඕනෑ. ඒත් ඒක කවදාවත් වෙන්නේ නැහැ හෙවන්. යකුසා හරියටම මාෆියා වගේ. මැර වැඩයි නායකයයි අතර සම්බන්ධය පෙනෙන්නේ නැහැ. ගෝලයෝ නායකයාව ආරක්ෂා කරනවා."

"ඒක ඇත්ත කියලා මම හිතනවා." රථය පොලිස් ස්ථානය වෙත හැරෙද්දී මම කීවෙමි. මට අත්විඳීමට සිදු වූ දේවල් මම සිතන්නට වීමි. ජපන් පාතාල ලෝකය ඇමරිකාවේ ක්‍රියාත්මක



www.sinhalaelibrary.com

එන ආකාරය පිළිබඳ විශාල පින්තූරය මට පෙනෙන්නට විය. මෙය මගේ ජීවිතය පුරා අමතක නොවන පරිච්ඡේදයකි.

"දැන් ඔයා ආපහු ජපානයට යනවාද?" ගෙල දිගු කර ආපසු හැරී රහස් පරීක්ෂක මාටිනා ඇසුවාය.

මම ජනේලයෙන් පිටත නගරය දෙස බැලුවෙමි. අඳුර වැටී තිබුණද නගරය විදුලි ආලෝකයෙන් පිරී තිබුණි. වෝකියෝ ගමනාවගේ ඇතිදැයි මම කල්පනා කළෙමි.

*    *    *    *

"මම දන්නේ නැහැ." මම කීවෙමි. "ඒ ගැන හෙට හිතනවා."

එය රාත්‍රියකි. රැහැයි නාදය අවටින් නැගුණ අතර තණ පිටිය හරහා ඇවිද යද්දී සීතල පිනි තැට මගේ දෙපාවල තැවරුණි. සීතල රාත්‍රී සුළඟ මිහිරි වෙරි මල් සුවඳක් රැගෙන ආවේය. ඉතා ඈතින් තිබූ ආලෝක තිතක් පළමුව මා දකින විට ඒ කණාමැදිරියෙකු හෝ ඉටිපන්දමක් හෝ ලන්තෑරුමක් දැල්වීමට පත්නු කළ ගිනිකූරක් විය හැකි යැයි මම සිතුවෙමි. එහෙත් එය ඉක්මනින් ප්‍රබලව දැල්වෙද්දී එය ගිනි සිළුවක් බව මට පෙනුණ අතර පන්දම දරා සිටි කවුරු හෝ මා වෙතට ඇවිද එනු පෙනුණි.

මට බියක් නොදැනුණ නිසා පුරුල් තණපිටිය හරහා මම එන කවුරුන් හෝ හමුවීමට ඉදිරියට ගියෙමි. එහි දොළ අසල කඳු ගැටය පාමුල උස් තණකොළ වැවී තිබුණි. කඳු ගැටයට යාබදව තිබුණේ මා හා ඔහිකෝ ළමා වියේදී සෙල්ලම් කළ කුඩා වන ලැහැබයි.

හදිසියේම පන්දම දරා සිටින්නේ මගේ සහෝදරයා බව පෙනුණ අතර ඔහු මා වෙත ළඟාවත්ම මම සතුටින් ඉපිලෙන්නට වීමි. මෙය සිහිනයක් බව දැනුණ අතර මගේ සහෝදරයා මියගිය දා සිට මෙවැනි ජීවමාන විචිත්‍ර සිහින මම දැක නොතිබුණෙමි. එය සැබෑ හමුවීමක් ලෙසම වූ අතර මගේ සහෝදරයා සමග නැවත කතා කිරීම මට සතුටක් විය.



මට අඩි පහකට පමණ දුර තිබියදී හැරුණු ඔහු මා දෙසටම වලකමින් ගිනි සිළුව ඉදිරියට ඇල්ලූ නිසා ඔහුගේ මුහුණ නොපෙනුණි. ලඟමින් ගොස් ඔහුට සමීප වීමට හැකි වුවද එය අනතුරු හැඟවීමක් බව මට දැනුණි. මා උත්සාහ කළේ නම් පිළිස්සීමට ඉඩ තිබුණි.

"ඔහිකෝ, පන්දම පහළට දාන්න." මම කීවෙමි.

"බැහැ," මට ඉතා සුපුරුදු කටහඬින් ඔහු කීවේය.

"මම මොකද කරන්න ඕනැ," මම ඇසුවෙමි. "මම ආපහු ජපානයට යන්නද?" එය සිහිනයක් බව මගේ යටි සිත කීවද ඔහු කියන දෙයක් කරන බවට මම තීරණය කළෙමි. එහෙත් ඔහු නිහඬව සිටියේය. "ඔහිකෝ?"

ඔහුගේ කටහඬ නැවත ඇසීමේ ආශාවෙන් මම කතා කළෙමි. අපසු හැරුණ ඔහු කඳු ගැටය නගින්නට වූ අතර ගිනි එළියෙන් ඇස් නිලංකාර වූ මම ඔහු පසුපස ගියෙමි. නිමේෂයකින් කාලය ගෙවී ගොස් අපේ නිවසේ දිගු කොරිඩෝව ඔස්සේ අපි මුළුතැන් ගෙය දෙසට ඇවිද යමින් සිටියෙමු. එහි තිබුණේ ඔහිකෝගේ පන්දමෙන් ආ ආලෝකය පමණි. සුපුරුදු නිවසට පැමිණීම සහනයක් වූ අතර සැම දෙනාම තමන්ගේ තම ජීවිතවල සිටින බව මට හැඟුණි. තාත්තා හා මිකෝ ඇඳක නිදියන අතරේ රාත්‍රී කටයුතු අවසන් කළ සේවකයෝ නින්දට සූදානම් වූහ.

මුළුතැන්ගෙය සමීපයට ගිය ඔහිකෝ නිවසේ අපේ නිදන කාමරය තිබෙන පෙදෙසට හැරුණේය. මගේ නිදන කාමරයට ඇතුළු වූ පසු තවමත් මුහුණ වැසෙන සේ පන්දම අල්ලාගෙන ඔහු ජනේලය අසල නතර විය. වට පිට බලද්දී කිසිවක් නොවෙනස්ව තිබෙනු දැක මම පුදුම වීමි. රාත්‍රියේ පාඩම් කිරීමෙන් පසුව එක්වර පැන නිදාගැනීමට මෙන් මගේ ඇඳ සකස් වී තිබුණි. මා ගෙදර සිටින විටදී ගෙබිම පුරා ඇඳුම් ඇඹුම්ද පොත්පත් සියල්ල පිළිවෙළට තබා තිබුණි. සියල්ල මා එනතුරු බලාපොරොත්තුවෙන් සිටින බවක් පෙනුණි.

www.sinhalaelibrary.com

"ඔයා කියන්නේ මට ආපහු ගෙදර එන්න කියලාද?" මම ඔහිසෝගෙන් ඇසූ අතර ඔහු අඬන්නට පටන් ගත්තේය.

ගිනි පන්දම නිවී ගියේය.

තිගැස්සී පිබිදුණ මම දෙනෙතේ කඳුළු පිස ගතිමි. ඔහිසෝ මියගිය පසු මා දකින සිහින නිතරම සුවදායක විය. නිතර සිනාමුසු මුහුණින් පැමිණෙන ඔහු මට දුක් නොවන ලෙස කියයි. එහෙත් මෙම සිහිනය බොහෝ විට සැබෑවක් ලෙස පෙනුණි. එය සැබැවින්ම මගේ සහෝදරයා සමග මොහොතක් ගත කළ ලෙස මට දැනුණ අතර ඔහුගේ මරණයෙන් පසු ඔහු නැති පාළුව මට හොඳින් දැනුණි. එම සිහිනයේ අර්ථය මට නොතේරුණද මා නැවත ආපසු ජපානයට යායුතු බව පැහැදිලි විය.

ඇස් පිස දමමින් ඇඳෙන් නැගිට ගත් මම සෝදන බේසම වෙත ගොස් මුහුණ සෝදා ගතිමි. සිහිනයේ ග්‍රහණයෙන් මිදීමට විනාඩි කීපයක් ගත වූ පසු සති ගණනකට පසු හොඳින් විවේක ගත් බවක් මට දැනුණි.

"සුබ උදෑසනක් හෙවන්" රහස් පරීක්ෂක වොචර් යකඩ කූරු දොර විවෘත කරගෙන පැමිණියේය. කෝපි කෝප්පයක් හා බනිස් පාර්සලයක් ඔහු අත විය. "උදේ කෑම වේලාව" සිනාමුසුව ඔහු කීවේය. "බොහෝම ස්තූතියි" මම කීවෙමි. "ඔයාට" "දැන් එපා" කී ඔහු ආරක්ෂකයා විසින් මැදිරිය තුළට දමා තිබූ අතුලන පුටුව ගෙන වාඩි වූයේය. ඇඳේ වාඩි වූ මම බනිස් කන්නට වීමි.

"ඉතින් මොකක්ද තීරණය?" ඔහු ඇසුවේය. "අවංකවම දැන්ම කියන්න බැහැ," මම කීවෙමි.

"හොඳයි. ඔයා මෙහෙ නැවතුණොත් සිද්ධ වෙන දේ මම කියන්නම්" රහස් පරීක්ෂකයා ඉදිරියට නැඹුරු වී කීවේය. "අපිට පොලිස් ආරක්ෂාව දැනට දෙන්න පුළුවන්. ඒත් ඔයා එළියට ගියොත් අපිට ඒ ගැන සහතික වෙන්න බැහැ. අපිට බලය තියෙන දුරට හැම දෙයක්ම කරන්න පුළුවන් වුණත්....." ඔහු වචන සොයමින් දෙවුර සැලුවේය.



"යකුසා මිනිස්සු හැම තැනම" මම එය සම්පූර්ණ කළෙමි.

රහස් පරීක්ෂක වොචර් සුසුමක් හෙළුවේය. "අවාසනාවට, ඒක ඇත්ත. උන්ගේ ඔත්තු සේවය අපිට වඩා බලවත්" ඔහු තවදුරටත් කීවේය. "ඔයාගේ වීසා වලංගු තව ටික කාලයක්. පොලීසිය භාරයේ හිටියොත් අපට සිද්ධ වෙනවා ඔයාව ජපානයට යවන්න."

"මට තේරෙනවා." මම කීවෙමි. "හීරෝට කොහොමද?" මා එතරම් රහස් පරීක්ෂකයාට සමීපව කතා කළේ ඇයි දැයි මම නොදනිමි. එහෙත් ආරම්භයේ සිටම ඔහු කරුණාවන්ත මෙන්ම ඥානවන්ත පුද්ගලයෙකු බව මට වැටහී තිබුණි. එමෙන්ම උපදෙස් ලබාගැනීමට ඔහු හොඳ පුද්ගලයෙකු ලෙස පෙනුණි. හීරෝ හෝ මසානෝ වුවද මා ජපානයට යාම යෝග්‍ය බව කියනු ඇත.

"මිනිහා තවම හෝටලයේ. පසුගිය දවස් දෙකේ අපි මිනිහාට ඇහැ ගහගෙන හිටියේ. මිනිහා මෙහෙ නීත්‍යානුකූලව ඉන්න කෙනෙක්."

පාර්සලය තුළවූ අත්පිස්නාවක් ගෙන මම දෑත පිස ගතිමි.

"මම මොනවාද කරන්න ඕනෑ" මා ඇසූ අතර රහස් පරීක්ෂකයා දත් අතුල්ලමින් මා දෙස ඇඩි බැල්මක් හෙළුවේය.

"මම හිතන්නේ කරන්න ඕනෑ දෙය ඔයා දන්නවා." ඔහු නැගිටිමින් කීවේය. "ඔයාගේ මාමා තව ටිකකින් එයි."

ඒ මොහොතේම පෙනී සිටි ආරක්ෂකයා මසානෝගේ පැමිණීම නිවේදනය කිරීමට යකඩ කූරු ඉදිරියට ආවේය.

රහස් පරීක්ෂකයා පිටුපසින් මම ඉදිරි කාර්යාලය වෙතට පැමිණියෙමි. මසානෝ ඉදිරි මේසය අසල සිටගෙන සිටියේය. මුලදී මා දුටු පරිදිම කළිම ඇඳුමකින් සැරසී සිටි ඔහු මඳ සිනාවක්



www.sinhalaelibrary.com

පැවේය.

"හලෝ, මාමේ" මම හිස නමා කීවෙමි.

"දුවේ" හැකි තරම් ඉක්මනින් පොලිස් ස්ථානයෙන් පිටව යාමට අවශ්‍ය බව පළ කරන බැල්මකින් යුතුව ඔහු කීවේය. ඔහු රහස් පරීක්ෂකයාගේ අතට අතදී මා වෙත හැරුණේය. "ඉතින්, පොලිසියෙන් මට කිව්වා වෙඩි අල්ලගන්න උත්සාහ කරපු හැටි. එයාලා ඔයාට හුඟක් ස්තුති කළා.

වොවර් හිස නමා මඳක් හිස සැලුවේය.

"ඉතින් තීරණයක් ගත්තාද?" තරමක නොඉවසිලි ස්වරයක් ගැබ්ව මසාගෝ ඇසුවේය.

"ඔව්" මම කීවෙමි. "මට හදිසි කෝල් එකක් ගන්න ඕනෑ."

මසාගෝ ඔරලෝසුව දෙස බැලුවේය. "අපි තව විනාඩි පහළොවකින් ගුවන් තොටුපොළට යන්න ඕනෑ. කරන දෙයක් ඉක්මනින් කරන එක හොඳයි."

"ඔව් වාහන තදබදය වැඩිවෙන්න පුළුවන්." වොවර් එය අනුමත කරමින් කීවේය.

"මම තත්පරයෙන් එනවා." කී මම වොවර් දෙසට හැරුණෙමි. "මට ඕනෑ....."

"හෝටලයේ නොම්බරය?" වොවර් අනුමත කළේය. "ඊයේ රෑ මම කතා කරද්දී හීරෝ මේක ඔයාට දෙන්න කිව්වා."

ඔහු දුන් කුණ්ඩු කැබැල්ල ගෙන මම කඩිනමින් මුදල් ගෙවන දුරකථනය වෙත ගියෙමි.

"හෙලෝ"

හීරෝගේ නිදිබර කට හඬ දුරකථනයෙන් ගලා එද්දී මම හුස්ම අල්ලා ගතිමි. පසුගිය දින කිපයේම උද්ගතව ඇති තත්ත්වය ගැන සිත යොමු කිරීමට වෙහෙසෙමින් මම ඔහුව



මතකින් ඈත් කර තැබීමට වෙහෙස ගෙන තිබුණෙමි.

"හෙලෝ? හෙවන් ඔයාද?"

"මට එක දෙයක් කියන්න" ඔහු වෙනත් යමක් ඇසීමට පෙර මම කතා කළෙමි. "යෝජී ඔයාගෙන් ඇහුවා ඔයා එයාගේ වැඩ කරන්න කැමතිද කියලා. ඔයාගේ තාත්තා හම්බවෙලා පවුලේ නම්බුව රැකගෙන රජෙක් වගේ ජීවත් වෙන්න පුළුවන් කියලා..... ඔයා ඒකට කැමතිද?"

මම හීරෝගේ පිළිතුර එන තුරු බලා සිටියෙමි. එය මට වැදගත් විය. සෑම දෙයටම මුල එය බැවින් මගේ තීරණය ඒ මත පදනම් වුණි. මට ඔහු හුස්ම ගන්නා හඬ ඇසුණි. නිශ්ශබ්දතාවය වර්ධනය වන තරමට මගේ හදවත වේගයෙන් ගැහුණි.

"ඔව්" අවිශ්වාසය පිරි ස්වරයකින් ඔහු කීවේය. මට ඔහු සමඟ වාද කිරීමට සිතුණද ඔහු කතා කරන්නේ සත්‍ය බවත් මා තවදුරටත් ඔවුන්ගේ ලෝකයට අයත් නොවන බවත් සිතූ මම නිහඬ වුණෙමි.

"එහෙනම්, ආයුබෝවන්, හීරෝ" මම රිසීවරය ආපසු තැබුවෙමි. සටන්කාමීන් ලෙස අපට එකමග යා නොහැක. මෙය අපරාධ පිරි ලෝකයකි. මේ මට මගේ මාවත තෝරාගැනීමට කාලයයි. මගේ පවුලේ උදවියට මා වුවමනා වී තිබේ. මා ආපසු ගොස් මගේ යුතුකම් ඉටුකළ යුතුය.

දිගු සුසුමක් ගත් මම මගේ මාමා සිටි තැනට පියවර තබා ගියෙමි.

"හරි. මාව ගෙදර එක්ක යන්න."

නිමි.

www.sinhalaelibrary.com